වටින්, හාත්පසින්; ලඹාදෙන, ලම්බමානවූ; නො
මිනි, අප්‍රමාණවූ; මුතුදැල්, මුක්තාජාලාවෙන්; සැදි, ස
ජ්ජිතවූ; දිගත, දිශාන්තයන්; අඳුකර, ආලොකක
ර; පැතිරෙණ, ව්‍යාප්තවන්නාවූ; රුවන්පබා, සවර්ණ
ප්‍රභාඇත්තාවූ; සුරපුරය, දිව්‍යනගරය; සොබවන,
ශොභනයකරන්නාවූ; සුදම්සබායුරු, සුධර්මානම්
දෙවසභාවවැනිවූ; පසන්, ප්‍රසන්නවූ; සතොසවඩව
න, (ජනයන්ගේ) සන්තුෂ්ටියවර්ධනයකරන්නාවූ. ස
බාමඬුවෙහි; සභාමණ්ඩපයෙහි.

75 අගරජකිරුළු කුළු-පෙරගිරිහිසි නුදුව නා
සුනිමල්දිමුතු මුතුලෑල්තුරුපෙලිතියු තා
සිහිලැල් සේ රැසින්හෙළිකළ නෙදිගුබි තා
පරරදකරතඹුරු-මුකුලිතකරම් තොරද නා
සත් සුන් සුපුන් සඳුවන් සේ සතෙහිය ට
තන් රත් කමින් බබලන සිහසනේපි ට
සුව න් ගිරිදෙපස ගෙතාහැලි සිරින්සො ඳ
ල දු ත් දුත්සුපිරිසිදු සෙමෙරනල වි ඳ
ලෙ වන් ගුවසුරිඳුසිරිපළ කරතොම ඳා
තොසින් මෙඅප රජසිඟතිරිඳු උන්ස ඳ

අගරජ, උත්තමරාජයන්ගේ; කිරුළුකුළුපෙරගිරිහි
සින්, කිරීටකූටනාමැති පූර්වාචලමස්තකයෙන්; උදුවන,

උද්ගතවන්නාවූ; සුනිමල්, අතිශයින් නිර්මලවූ; දිමුතු, දීප්තිමත්වූ; මුතුලැල්, මුක්තාලතා නමැති; තුරුපෙළිනි, තාරකාපඞ්ක්තියෙන්; යුත, යුක්තවූ, සිහිලැල්, සීතලඑලවන්නාවූ; සේරුසින්, ශ්වේතරශ්මියෙන්; නොදිගුබිත, නානාදිශාභිත්තීන්; හෙළිකළ, ආලෝකකළාවූ; පර්රද, ශත්‍රැරාජයන්ගේ; කරතඹුරු, හස්තනැමති තාමරසයන්; මුකුලිතකරමින්, හකුළුවමින්; ඔරදනා, විරාජමානවූ; සන්සුන්, නිශ්චලවූ; සුපුන්සඳවත්, පූර්ණචන්ද්‍රයෙක් මැනිවූ; මේසතෙහි යට, ශෝභනවර්ණවාධෝ භාගයෙහි; නන්රන්කමින්, නානාවිධ සවර්ණ කර්මයෙන්; බබලනා, භ්‍රාජමානවූ; සිහසනේපිට, සිංහාසනයමත්තෙහි; සුවන්ගිරිදෙපස, සවර්ණමෙරු උභයපාර්ශ්වයේ; හෙනා, පතිතවන්නාවූ; හැලිසිරින්, නිර්ඣරස්වභාවයෙන්; සොඳ, සුන්දරවූ; ළඳුන්ඳුන්, සන්නිවිෂ්ටවූන්නාවූ; සුපිරිසිදු, අතිපරිශුද්ධවූ; සෙමෙරනල, චාමරමාරුතයා; විඳ, ලබමින්; ලෙවන්හට, ලෝකයාට; සුරිඳුසිරි, ශක්‍රදේවේන්ද්‍රලීලාව; පළකර, ප්‍රකාශකොට; නොමඳතොසින්, අමන්දසන්තුෂ්ටියෙන්; මෙඅපරජසිහනිරිඳු, මේඅපගේරාජසිංහනරේන්ද්‍රයා; උන්සඳ, සිටිකල්හි.

76 රුදු විරි දු න් ජය ගෙණ විකුමෙන්පබ ද
සරණමෙතුන් ලකවටතිරුළිසපැළ ද
සුර කුම රුන් වැනිරජකුමරුවෝසො ද
සිටිති මු දු න් හී මෙනිරිඳුගෙ සිරිප ද

පබඳ, ප්‍රබන්ධවූ; රුදු, රෞද්‍රවූ; විරිදුන්, විරුද්ධජනයන්; විකුමෙන්, වික්‍රමයෙන්; ජයගෙණ, ජයග්‍රහණයකොට; තිරුළු, කීර්ත්තිය; ඉස, ශීර්ෂයෙහි; පැළඳ, පිළඳනයකොට; මෙතුන්ලකවට, මේත්‍රිවිධලඞ්කාවහාත්පසඃසරණ, සඞ්ඛාරණයකරන්නාවූ; සුරකුමරුන්වැනි, දිව්‍යකුමාරයන්බඳුවූ; සොඳ, සුන්දරවූ; රජ

කුමරුවෝ, රාජකුමාරයෝ; මෙනිරිඳුගේ, ශ්‍රීනරේ න්ද්‍රයාගේ; සිරිපද, ශ්‍රීචරණය; මුදුන්දී, මස්තකප්‍රාප්ත කරගෙන; සිටිති, සිටිත්‍ය.

77 රිවි බ ඳ තෙදඅනලපත්වූ ඔහුපුව ළ
මන නඳ සොලිපාඬිකේරළනිරිඳුකැ ළ
හිමි ප ද නියකිරණගඟගිලෙමින් තුඹු ළ
වැඳවැඳ සිටිති මුදුනත්දී කර කම ළ

පුවළ, ප්‍රෞඪවූ; ඔහු, ඒරාජයාගේ; රිවිබඳ, සූර්යයා බැනිවූ, තෙදඅනල, තේජෝවහ්නියට; පත්වූ, සම්ප්‍රාප්තවූ; මනනඳ, මනොනන්දනවූ; සොලි, චොළිය; පාඬි, පාණ්ඩ්‍යය; කේරළ, කෙරළයන; නිරිඳුකැළ, රාජසමූහයා; හිමි, (ඒරාජසිංහරාජ) ස්වාමියාගේ; තුඹුල, මහත්වූ; පදනියකිරණගඟ, පාදනඛ රශ්මින මැතිගඞ්ගාවෙහි; ගිලෙමින්, නිමග්නව; කරකමල, හස්තනමැතිපද්මය; මුදුනත්දී, මස්තකයට දූනය කොට; වැඳවැඳ, නමස්කාරකරමින්; සිටිති, සිටිත්‍ය.

78 බ ර ම් මුවපහළසිව්වේ තතුලෙස ට
ස ක ම් විදියනොවරදකරණ හැමවි ට
උ තු ම් පෙරෙවිවිප්මුළුමුල්වූ සෙත ට
නොහිම් ව පවසති ආසිරිවදන්සි ට

බරම්මුවපහළ, මහාබ්‍රහ්මයාගේමුඛයෙන්පහළවූ; සිව්වේ, චතුර්වේදයෙහි; තතුලෙසට, තත්වූපරිද්දෙන්; හැමවිට, සදාකල්හි; සකම්විදිය, ස්වකර්මවිධිය; නොවරද, නොවරද්ද; කරණ, කරන්නාවූ; උතුම්, උත්තමවූ; සෙතට, ශාන්තියට; මුල්වූ, මුල්වසිටිනා; පෙරවිවිප්මුළු, පුරෝහිතබ්‍රාහ්මණසමූහයා; සිට, (රාජසභාවෙහි) සිටිනව; නොහිම්ව, අප්‍රමාණව; ආසිරිවදන්, ආශිර්වාදයන්; පවසති, කියති.

---

• රිවිසඳ අනලකුලයෙන්පත්වූ නිම ළ

79 ඉගෙණ අදිකරණසහරජනිතිය ත
රකිත ලොවසතන්විලසින් එනමනෙ ත
සොබන මහඇමතිවරුපරසිදු දිය ත
බැතින වැඳසිටින්මුදුනත් තබාඅ ත

අදිකරණසහ, අධිකරණයහා; රජනිතිසත, රාජනීතිශාස්ත්‍රය; ඉගෙණ, උද්ග්‍රහණයකොට; එනම නෙතවිලසින්, ස්වකීයචක්ෂුස්පර්ශයෙන්; ලොවසතන්, ලොකසත්වයන්; රකිත, රක්ෂාකරන්නාවූ; දියත, ලොකයෙහි; පරසිදු, ප්‍රසිඬවූ; සොබන, ශොභනවූ; මහඇමතිවරු; මහාඅමාත්‍යවරයෝ; මුදුනත්, මස්තකයෙහි; අත, හස්තය; තබා, ස්ථාපිතකොට; බැතින, භක්තියෙන්; වැඳසිටිත්, අභිවාදනය කරගෙනසිටිත්ය.

80 මහත සයුරදියසහ පස්මුළුදෙර ණ
නිසිත නැණින්දැනකළ මෙතෙකැයිපම ණ
දියත වචනවහසලමුක වෙට්ටිග ණ
සිටිත සුපුන්සිසිකැන්මෙන් සබතිර ණ

මහත, මහත්වූ; සයුර, සාගරයාගේ; දියසහ, ජලයහා; මුළුදෙරණ, සකලපෘථිවියෙහි; පස්, පාංශු; නිසිතනැණින්, තීක්ෂ්ණඥානයෙන්; දැන, දැනගෙන; මෙතෙකැයි, මෙපමණයයි; පමණකළ, ප්‍රමාණකළාවූ; දියත, ලොකය; වචන, වර්ණනාකරන්නාවූ; වහසලමුකවෙට්ටිගණ, වාසල මුකවෙට්ටිසමූහයා; සබතිරණ, සභානැමතික්ෂිරාණිවයෙහි; සුපුන්සිසිකැන්මෙන්, පූර්ණචන්ද්‍රකාන්තියමෙන්; සිටිත, (රාජසභාවෙහි) සිටිත්ය.

81 ගැඹුරු සකුමගදහෙළදෙමළෙයි පුරු දු
සොඳුරු සදලකරවීයරණ දත්නිව් දු
මියුරු අරුත්සොඳමින් කව්බැඳවිරි දු
අතුරු නොවකියති සබතුරෙහි නරනි දු

ගැඹුරු, ගම්භීරවූ; සකුමගද හෙළුදෙමළෙහි, සංස්කෘතමාගධසිංහලද්‍රවිඩ යනභාෂාවන්හි; පුරුදු.(කරණලද)අභ්‍යාසඇත්තාවූ; සොඳුරු,සුන්දරවූ; සඳ, ඡන්දස්හ; ලකර, අලංකාරද; වියරණ, ව්‍යාකරණ; දැත්, අවබෝධකළාවූ; කිවිඳු, කවීන්ද්‍රයෝ; මියුරුඅරුත් යොදමින්, මධුරඅර්ථයොදා; විරුදුකව්බැඳ, ස්තුතිකාව්‍යරචනාකොට; නරනිඳුසබනුරෙහි, නරේන්ද්‍රයාගේසභාභ්‍යන්තරයෙහි; අතුරුනොව, අවකාශනොපැ, කියති, කථනයකෙරෙති.

82 නානා රුපුන්ජයගෙණ විකුමෙන්නිස ග
ගා නා තෙදගරගකුඹුතල දිගුමත ග
සේනා නායකමැතිවරු පසෙහිඳු ගා
පී නා සිටනිහිම්පදනිය කිරණග ග

නිසග, ස්වභාවයෙන්පිහිටි; විකුමෙන්, වික්‍රමයෙන්; නානාරුපුන්, නානාවිධශත්‍රූන්; ජයගෙණ, ජයග්‍රහණයකොට; දිගුමතගකුඹුතල, දිශානමැතිහස්තීන්ගේකුම්භස්තලමස්තකයෙහි; තෙදගරග, තේජස්නමැතිඅඞ්ගරාගයන්; ගානා, විලෙපනයකරන්නාවූ; සේනානායකමැතිවරු, සේනානායක මන්ත්‍රීවරයෝ; යුගපසෙහි, දෙපාශ්වියෙහි; හිමිපද,(රාජ)ස්වාමියාගේපාදයෙහි; නියකිරණගග, නඛරශ්මිනමැතිගඞ්ගාවෙහි; පීනාසිටිති, පීනමින්සිටිත්ය.

83 සයු ර ට වදිනගංගෝ විලසපළක ර
තිසි ප ට සළකපුරුකස්තුරු සඳුන්ග ර
නෙකරම විළෙහිතිරිදෙළි පඬුරුක ර
මොනවට සිඹිනිමුදුනත්දී කරනඹ ර

සයුරට, සාගරයට; වදිනා, අවතීර්ණවන්නාවූ; ගංගෝවිලස, නදීඝෝෂවිලාසය; පළකර, ප්‍රකාශකොට;

* ගානාතෙදගොකුම කුඹුතලදිගු මතගයයි ඇමඟර පොතකපෙණේ.

නිසි, යෝග්‍යවූ; පටසළු, පටවස්ත්‍රයෝ; කපුරු, කර්පූර ය; කස්තුරු, කස්තුරුය; සඳුන්, චන්දනය; හර, මුක්තා හාරය (යනමේතීද්දේ); නොකරටවලෙහි, නොයෙක් රාෂ්ට්‍රයන්හි; නිරිඳෙ, නගරේන්ද්‍රයෝ; පඬුරකරළි, පා රිතෝෂිකකොටදුනයකර; මුදුනත්, මස්තකයෙහි; මොනවට, මනාකොට; කරතඹර, හස්තාභූමැතිපදම ය; දී, තබා; සිටිති, සිටිත්ය.

84 මහත් ගැඹුරසර සමුදුරට මනර ග
නුමුත් ව වැදසිටිනාවඩ දියත් ර ග
සමත් බලැතිසිරිලක මහසෙන්සම ග
සිටිත් මලලදෙළුවරනන්දෙස සෙන ග

මහත්, මහත්වූ; ගැඹුරසර, ගම්භීරසාරවූ; සමුදුර ට, සාගරයට; වැද, ප්‍රවිෂ්ටව; නුමුත්ව, විගතනොව; සිටිනා, සිටින්නාවූ; මනරග, සිත්පිණවන; වඩදිය ත්රග, වඩදියසඳහවූ; සමත්බලැති, සමර්ථබලඇත් තාවූ; සිරිලක, ශ්‍රීලංකාද්වීපයේ; මහසෙන්සමග, ම හාසෙනාවන්හාසමග; මලලදෙළුවර, මලල දේශ යෙහිහාදෙළුවරදේශයෙහිද (යනාදිවූ); නන්දෙස සෙනග, නානාදේශවලසේනාවෝ; සිටිත්, (රාජස භාවෙහි) සිටිති.

85 සිටු සෙනෙවි ඇපා මාපානමැ ති
ඉටු ගුණනැණින්යුතුමැතිගන මහපිණැ ති
පටු නුඅදරබැති පෙම්වඩ වඩාරු ති
තුටු මන්පුරා වැඳවැඳ නැගි නැගියෙ ති

සිටු, සිටුවරයෝ; සෙනෙවි, සේනාධිපතියෝය; ඇ පා, ආදිපාදයෝය; මාපා, මහාදිපාදයෝය යන; නා මැති, නාමඇත්තාවූ; ඉටුගුණනැණින්, ඉෂ්ටගුණ ඥානයෙන්; යුතු, යුක්තවූ; මහපිණැති, මහාපින්ඇ ත්තාවූ; මැතිගන, මන්ත්‍රීසමූහයා; රුති, රුචිවූ; පටු

නූ, සුළුනුවූ; අඳර්බැතිපෙම්, ආදරයා භක්තිප්‍රේමය; වඩවඩා, වඩමින්; තුටු, සන්තුෂ්ටිය; මන්පුරා, චිත්ත යසම්පූර්ණයකර; වැඳවැඳ, වඳිමින්; නැගිනැගියෙනි, නගිමින් යෙත්ය

86 සිරිත් ලෙසින්පෙරනිරිඳුන් හටපැව ති
මඟත් ඇතුන්සඟඅයපඬුරු ගෙණරු ති
ඇවිත් වත්නිඳසටින් වන්නිවරුති ති
යුගත් මුදුන්දීඑහි වැඳවැඳසිටි ති

පෙරනිරිඳුන්හට,පූරාණරාජයන්ට;පැවති,(පරම්පරාගතව)පැවතආ; සිරිත්ලෙසින්, චාරිත්‍රවශයෙන්; මඟත්, මඟත්වූ; ඇතුන්සඟ, හස්තීන්හා; රුති, රුචි (වඩන); අයපඬුරුගෙණ, අයපඬුරු හැරගෙන; නිති, නිරන්තරයෙන්; වන්නිවරු, වන්නිරටප්‍රධානීයෝ; වත්නිදසටින්, දඟඅටවත්තියෙන්; ඇවිත්, (රාජසභාවට)ආගමනයකොට; යුගත්,හස්තයුගමය; මුදුන්දී, මස්තකයෙහිතබා; එහි, ඒසභාවෙහි; වැඳවැඳ, නමස්කාරකරකර; සිටිති, සිටිත්ය.

87 ති ර ස ර නැණනැවින් තෙරපත්සත්මුහු ඳ
නොවිතර කිවිවරන් මෙනිරිඳු නමටබැ ඳ
ම න හ ර ගැඹුරුවිරුදුවලි නිවිපබ ඳ
පු ව ත ර වැදිගණන්පවසා නැවතිස ඳ

තිරසර, ස්ථිරසාරවූ; නැණනැවින්, ඥානනාමැති නෞකාවෙන්;සත්මුහුද, ශාස්ත්‍රනාමැතිසමුද්‍රයේ;තෙරපත්, තීරප්‍රාප්තවූ; නොවිතර, අප්‍රමාණවූ; කිවිවරන්, කාව්‍යකාරයන්; මෙනිරිඳු, මේනරේන්ද්‍රයාගේ;නමට,නාමය(සම්බන්ධකොට); බැඳ,බන්ධනයකර; මනහර, මනොඥවූ; ගැඹුරු; ගම්භීරවූ; විරුදුවලිනිවිපබඳ, ස්තුතිකාව්‍යප්‍රබන්ධ; පුවතර, ප්‍රසිද්ධවූ; වැදිගණන්, වන්දිභට්ටයන්;පවසා, කියා; නැවතිසඳ, නිවෘත්තවූ කාලයෙහි.

88 මෙලෙස සව්සිරින්සැදි සබයට පව ර
පි වි ස තසිත බුහුමන් වඩමින් අද ර
තිදස හිමිසදිසි රජුපද කමලව ර
සතොස සිතෙහි සපුරාවැදගෙණවස ර

මෙලෙස, උක්තප්‍රකාරයෙන්; සව්සිරින්, සකලශ්‍රීන්; සැදි, සජ්ජිතවූ; පවර, උතුම්වූ; සබයට, සභාවට; පිවිස, ප්‍රවිෂ්ටව; තසිත, ශුෂ්මතාගේ චිත්තයෙහි; අදරබුහුමන්,ආදරබහුමානයන්; වඩමින්,වර්ධනයකර; තිදසහිමිසදිසි, ශක්‍රදෙවෙන්ද්‍රලීලාවදරන්නාවූ; රජු,(ඒ)රාජයාගේ;වරපදකමල, උත්තම පාදපද්මය; සතොස, සන්තුෂ්ටිය;සිතෙහි, චිත්තයෙහි, සපුරා,සම්පූර්ණකොට; වැද, වැදලා; අවසරගෙණ, අවසරග්‍රහණයකොට.

89 සව් සිරිපිරි එපුරවරඟනගෙමනන ද
දෙව් රජවිමන් තනයුගතුරෙහි ගිලිසො ද
එව් නිලවසා රොදගගිනෙතරව පැහැ ද
දෙව් විමනත රඟවහසල තුළටවැ ද

සබ්සිරිපිරි, සකලෛශ්වර්යපූර්ණවූ;එපුර,ඒනගරය නමැති; වරඟනගෙ, උත්තමස්ත්‍රියගේ; මනනද; චිත්තසන්තුෂ්ටිප්‍රදායකරන්නාවූ; දෙව්රජවිමන්, දෙවරාජවිමානනමැති; තනයුගතුරෙහි,පයොධරාභ්‍යන්තරයෙහි; ගිලි, නිමග්නවූ; නිලවසාරොදඑව්, නීලවසාරාජිකාවන්බඳුවූ; සොඳ, සුන්දරවූ; ගඟින්, නදියෙන්; එතරව, උත්තරණයකර; පැහැද, ප්‍රසන්නව;දෙව්විමනත, දෙවවිමානයෙහි; රඟවහසලතුළට වැද, නෘත්‍යකරණශාලානයට ප්‍රවිෂ්ටව.

90 වයිරව සිරිඅසුරහෙන්ජය ගෙණ තොම ද
කයිරව සියසදිසි ශසින්සුතුපබ ද
බයිරව කෝවිලටවදිමින් සිතුපැහැ ද
වයියව සබඳ නරඹා එහි රැඟුම්පු ද

නොමද, බොහෝසේ; වයිරවසිටි, ක්‍රොධවසිටියා වූ; අසුරසෙන්; අසුරසේනාව; ජයගෙණ; ජයග්‍රහණයකොට; කයිරවසියසඳිසි, චන්ද්‍රශාබඳුවූ; යසසින්, කීර්තියෙන්; යුතු, යුක්තවූ; පබඳ, ප්‍රබන්ධවූ; බයිරව කෝවිලවවදිමින්, බයිරවකෝවිලට ප්‍රවිෂ්ටව; සිතු පැහැද, චිත්තප්‍රසන්නකරගෙන; එහි, ඒකෝවිලෙහි; රැගුම්පුද, නෘත්‍යසහාපූජාවන්; තරඹා, බලා, වසී, වාසාම; සබඳ, මිත්‍රය; යව, ප්‍රයාණයකරව.

91 දිය ර ම් රවුළුයුදමහබාරතයුද ද
මන ර ම් කඳපොරණහරකළ දිත්යුද ද
ඇ ති හිමි කොටඇඳ සිතියම් රූනොම ද
නොවහිමි සතොස පිරිලෙන්දුක ගොස්සබ ද

දියරම්රවුළුයුද, රාමරාවණයුධයද; මහබාරතයු ද, මහාභාරතයුඩයද; මනරම්, සිත්පිණවනා; කඳ, ස්කන්ධකුමාරයුඩයද; පොරණ, පුරාණකාලයෙහි; හරකළ, ඊශ්වරයාකළාවූ; දිත්යුද, අසුරයුඩයද; හිමි කොට, නිශ්චාකොට; ඇඳඇති, චිත්‍රනකොටඇතාවූ; නොමඳ, අප්‍රමාණවූ; සිතියම්රූ, චිත්‍රකර්මරූපයන්; නොවහිමි, අප්‍රමාණවූ; සතොස, සන්තුෂ්ටිය; පිරි, පරිපූර්ණවූ; ලෙන්, චිත්තයෙන්; දුක, සඳශ්‍රනයකොට; සබද, මිත්‍රය; ගොස්, ප්‍රයාණයකොට.

92 ඉසි වර කිව දන්සතවිදි අඩුනොක ර
තුනුකර කිරියකරපිරිසිදුව ගේ,දෙ ර
පුව තර ගුරුවරන්පුදකර නැවතිව ර
මම් තුර බැතින්වැදහරගන විමුත්තු ර

ඉසිවරකී, සෘෂීන්විසින්කියනලද; වදන්, උපදේශඇත්තාවූ; සතවිදි, ශාස්ත්‍රක්‍රම; අඩුනොකර, අඩුනොකොට; තුනු, ශරීරය; කර, හස්තය; කිරිය, ක්‍රියාය; ගේදෙර, ගෘහද්වාරය(යනමොවුන්); පිරිසිදුවකර, පරිශුඩකොට; පුවතර, ප්‍රසිඩවූ; ගුරුවරන්, ගුරු

චරයන්; පුදකර, පූජාපවත්වා; නැවතිවර, නැවතීකා ලයෙහි; මම්තුර, මාගේමිත්‍රය, බැතින්, භක්තියෙන්; හරගනවිඹින්තුර, උමාදෙවියගේ කොවිලට; වැදා ප්‍රවිෂ්ඨව.

93 පවරතුගුතුල්හිම-ගිරිරජහට නදනව න
බසරුතලෙසින් වෙන්නොවමින්හැමදුව ස
සඳරබරණවෙතරදනා නිතිනිදෙ ස
තුන්යමෙහිගත්තුන්-වෙසින්තුන්ලොවපරසි දු

නමකළ සුරකිරුළ් කෙමිරතැ ගිලිදලි න
සුලකළ සිරිසරණසියපතිනි වොරැදී න

පි සු මි යොන් උවිඳුහරසක් අැපව ර
කොහී මි සුරන්හට වරවර දෙනනිතො ර
උ තු මි ගුණෙන් සුතුසරගත හමපව ර
ල පෙ මි වමින්නමකරරුගෙන අවස ර

පවර, උතුම්වූ; තුඟු, උන්නතවූ; තුල්, මහත්වූ; හිමගිරිරජහට, හිමාලයපර්වතරාජයාහට; නදනව නා, දුහිතෘවූ; බසරුතලෙසින්, වාගර්ථලෙසින්; හැමදුවස, සදාකල්හි; වෙන්නොවමින්, වියොගනොව; නිති, නිරන්තරයෙන්; සඳරබරණවෙතරදනා, ඊශ්වරයාසමීපයෙහි නොහොත් ඊශ්වරයාභාවසන්නා වූ; නිදෙස, නිර්දොෂවූ; තුන්යමෙහිගත්, තුන්කාලයෙහි ග්‍රහණයකළාවූ; තුන්වෙසින්, ත්‍රිවිධවෙසයෙන්; තු න්ලොව, ත්‍රෛලොකයෙහි; පරසිදු, ප්‍රසිද්ධවූ; නමකළ, වැන්දවූ; සුරකිරුළ, දෙවියන්ගේකිරීටනමැති; කෙ මි, කණිකාවක්ඇත්තාවූ; රතැගිලි, රක්තාඞ්ගුලීන ැති, දලිනා, පත්‍රයෙන්යුක්තවූ; සුලකළ, සවලඞ්කෘ තවූ; සිරිසරණ, ශ්‍රීචරණයනමැති; සියපතිනි, පද්ම යෙන්; වොරැදින, විරාජමානවූ; පිසුම්යොන්, මහා බ්‍රහ්මයාය; උවිඳු, උපෙන්ද්‍රයාය; හර, ඊශ්වරයාය; සක්,

ශක්‍රයාගේ; අ,මේආදිවූ; පවර, උතුම්වූ; සුරන්හට, දෙවියන්ට; වර, උතුම්වූ; වර, ප්‍රසාදයන්; නිතොර, නිරන්තරයෙන්; නොහිමි, අප්‍රමාණව; දෙන, දානය කරන්නාවූ; උතුම්ගුණෙන්යුතු, උත්තමගුණයෙන් යුක්තවූ; පවර, උතුම්වූ; හරගනාහට, උමාදෙවීන්ට; ලපෙම්වමින්, ප්‍රේමාන්විතභාවයෙන්යුක්තව; නමක ර, නමස්කාරකොට; අවසරරුගෙන, අවසරගෙන.

94 හැමකල් සිදුවිදුදරඟන කෙළෙනසො ද
හිමසෙල් සිරින්දිසිලෙලරන් රිදිද ද
තුඟු තුල් විසල්වාසල්පලමුදුන න ද
පැහැදුල් කලදෙසුඟු සිරිපා මදක්ඉ ද

හැමකල්, සියලුකාලයෙහි; සිදුවිදුදරඟන, සිද්ධවිද්‍යාධරාඞ්ගනාවන්; කෙළිනා, ක්‍රීඩාකරන්නාවූ; සොද, සුන්දරවූ; හිමසෙල්සිරින්, හිමාලයපර්වතශ්‍රීයෙන්; දිසි, දෘශ්‍යමානවූ; ලෙල, ලීලොපෙතවූ; රන්රිදිඳද, සුවර්ණරජතධජයන් ඇත්තාවූ; තුඟු, උස්වූ; තුල්, මහත්වූ; විසල්, විශාලවූ; වාසල්පලමුදුන, වාසලජදන මස්තකයෙහි; නද, මනොඥවූ; පැහැදුල්, ප්‍රභාවෙන්දිලියෙන්නාවූ; කලදෙසුඟු, කාලධෞතශෘඞ්ගයක; සිරි, ශ්‍රීය;පා,දක්වමින්; මදක්, ස්වල්පකාලයක්; ඉද, නිසීදනයකොට.

95 පෙර ඉසිවර වදහළගමනට සුබ ද
ස ර සියදිනාහතනැකතින් රුසෙහිස ද
සූ ර ගුරුකිවිබුදසබලව උදුස ද
ව ර මුනිගුණසිහි කර වඩනේ සබ ද

පෙරඉසිවර, පූර්වඍෂීන්විසින්; වදහළ, ප්‍රකාශකළාවූ; ගමනට, යාත්‍රාවට; සුබද, ශුභදයකවූ; සරසියදිනා, ඉරිදාදවස්හි; හතනැකතින්, හස්තනැකතින්; සඳරුසෙහි, චන්ද්‍රරාශියෙහි නොහොත් කර්කටරාශියෙහි; සුරගුරු, බෘහස්පතියාය; කිවි, සිකුරාය; බුද,බු

අය (ශනිග්‍රහයන්) සබලව, බලවත්ව; උදුසඳ, උදාවූකාලයෙහි; සබඳ, මිත්‍රය; වර, උතුම්වූ; මුනිගුණ, සර්වඥගුණය; සිහිකර, ස්මරණයකොට; වඩනේ, ප්‍රයාණයකරන්නේයි.

96 ම න ර ග ර ගා දෙන දනවිජ් වැඩකැම ති
සි ට ල ග දි ගා දෙන වෙදමතුරෙන්පැව ති
කොමලඟ ර ගා එ නා පවසමින්ජයතු ති
පෙර මග මගා ය නා සකිමේ සුබනිමි ති

මනරඟ, මනොඥවූ; රඟාදෙනදන, නෘත්‍යකාරකජනයාද; ලගසිට, ආසන්න (භූමි) යෙහිසිටිනවූ; දිගාදෙන, දීර්ඝායුප්‍රදානයකරන්නාවූ; වෙදමතුරෙන් පැවති, වෙදමන්ත්‍රයන්ජපකරන්නාවූ; වැඩකැමති, ලොකයාට ශාන්තිදානයට අභිලාෂයක් ඇත්තාවූ; විජ්,බ්‍රාහ්මණයෝද; ජයතුති, ජයස්තුති(ගීතිකාවන්) පවසමිනි, කියමින්; රඟාඑන, නෘත්‍යකරමින් එන්නාවූ; කොමලඟ, ස්ත්‍රීහුද (යන); මේසුබනිමිති, මේ ශොභනනිමිත්තයන්; පෙරමග, පූර්වමාර්ගයෙහි; සකි, මිත්‍රය; මගා, බලා; යන්, ප්‍රයාණය කරව.

97 ප ව ර අදිකාරිසඟ සෙබෙහිහැමදෙ නා
ස තා ර අගතියෙන්වැළකී ඉඳයෙහෙ නා
ගැඹර අදිකරණවිමසා පසිඳල නා
මෙපුර විදියෙහිමහපාය දනගෙ නා

පවර, උතුම්වූ; අදිකාරිසඟ, අධිකරණ නායකයාන්සා; සෙබෙහි, සභාවෙහි; හැමදෙන, සකල ජනයා; සතරඅගතියෙන්, චතුර්විධඅගතියෙන්; වැළකී ඉඳ, වියුක්තව; යෙහෙන, යහපත්සේ; ගැඹර, ගම්භීරවූ; අදිකරණ, නඩු; විමසා, පරීක්ෂාකොට; පසිඳලනා, නිශ්චයකරන්නාවූ; මෙපුර, මේනගරයෙහි; විදියෙහි; වීථියෙහි; මහපාය, මහාප්‍රාසාදය; දනගෙන, (මේ යයි) ඥානයකොට.

98 විපුල් තාලසතදුන නැණිනි නිකස ල
ලකල් පසඟතුරුනද වැයුමෙහි ගස ළ
නිමල් එපන්සිලුතුල්නළු රුදිවිපු ල
මඟුල් විදියෙන්යා ගන්න කෙළකෙ ළ

විපුල්, මහත්වූ; තාලසත, තාලශාස්ත්‍රය; දුන, අවබොධකොට; නැණින්, ඥානයෙන්; නිකසල, පිරිසිදුව; ලකල්, අලඞ්කාරවූ; පසඟතුරුනදවැයුමෙහි, පඤ්චතූර්‍ය්‍යනාද ගායනාවෙහි; ගසළ, අභ්‍යාසය ඇත්තාවූ; නිමල්, නිර්‍මලවූ; එපන්සිලුතුල්, එපඤ්චසිඛයාවැතිවූ; නළු, නාටකයන්; රුදි, වසන්නාවූ; විපුල්, මහත්වූ; මඟුල්විදියෙන්, මඞ්ගලවීථියෙන්; කෙළකෙළ, ක්‍රීඩාකරමින්; යාගන්න, ප්‍රයාණයකරව.

99 සුවිපුල් විකුම් සිඟමඟමැති තුමාසො ඳ
හර සෙල් එකතුල් කරකරවූ පබ ඳ
වසුවිල් විටෙහි මඟමඬමඳ දුකසුබ ඳ
සිතලොල් වඩාතුබනැගෙමින් යව සබ ඳ

සොඳ, සුන්දරවූ; විකුම්සිඟමඟමැතිතුමා, වික්‍රමසිංහමහාමාත්‍යෝත්තමයාවිසින්; හරසෙල්, කෛලාශකූටයට; එකතුල්කර, එකසමානකර; කරවූ, කාරාපිතවූ ගෙවත්කරවූවාවූ; පබඳ, ප්‍රසිද්ධවූ; සුවිපුල්, ඉතාමහත්වූ; වසුවිල්විටෙහි, වසුවිල්විට නම් ස්ථානයෙහි; මඟමඬමඳ, මඟමඬම නම් විශ්‍රාමශාලාවද; දුක, දර්‍ශනයකොට; සුබඳ, ශුභපත්ශරීරයක්ඇත්තාවූ; සබඳ, මිත්‍රය; සිතලොල්වඩා, චිත්තාශාවර්‍ද්ධනයකරමින්; තුබනැගෙමින්, ආකාශාරූඪව; යව, ප්‍රයාණයකරව්.

100 වලඟ කරසතරපදරඟ සඟය ය නා
සතඟ දෙරණ සුපිහිටිතුඟු දළුදතු ණ
මතඟ කැලන් සිටිනා ඇත්හල නොම් නා
බලඟ මිතුර හොබයනාවම් පසපෙණෙ නා

(ට) වලඟ, වාලඩියෙද; කර, ශුණ්ඩියෙද; සතරපද, චතුෂ්පාදයෙද; රඟසඟයෙන, රඟස්අඞගයෙන; සතඟ, සපතාඞගය; දෙරණ, භූමියෙහි; සුපිහිටි, මනාවපිහිටියාවූ; තුඟු, උස්වූ; දකුණුදළ, දක්ෂිණදන්තයඇත්තාවූ; නොමින, බොහෝවූ; මතඟකැලන්, මත්තඟසතීන්; සිටිනා, සිටින්නාවූ; තොපයන, යුෂ්මතාප්‍රසාණයකරන්නාවූ;පෙරමග, පූර්වමාර්ගයෙහි;පෙණෙනා, දෘශ්‍යමානවූ; ඇත්හල, හස්තිශාලාව; මිතුර, මිත්‍රය; බලඟ, නිරීක්ෂණයකරව.

101 ස යු ර ත් මෙරත්යුගකෙළවෙරළපැනගෙන
වෙ තප ත් වෙතත්නවතනවත් වනබෙලෙන
කඩුකොත් පලඟ දුනුවෙඩිගත් සෙන් සිටි න
ය ව සි ත් ලෙසින් ගැටසැත්තේ කඩවති න

සයුරත්, මහාසාගරයත්; මෙරත්, මහාමේරුපර්වතයත්; යුගකෙළ, කල්පාන්තයෙහි; වෙරළ, මර්‍යාදව; පැනගෙන, උල්ලඞ්ඝනයකොට; වෙත, සමීපයට;පත්වෙතත්, ප්‍රාප්තවෙතත්; බෙලෙන,බලයෙන්; නාවතනවත්වන, නිවර්තනයට සමර්ථවූ; කඩු, කඩුය; කොත්, කුන්තය; පලඟ, පලිහය; දුනු, ධනුය; වෙඩි, තුවක්කුය (යනාමේ උපකරණයන්); ගත්, ග්‍රහණයකළාවූ; සෙන්, සේනාව;සිටිනා, සිටින්නාවූ;ගැටසැත්තේ කඩවතින, ගැටසැත්තේ ආරක්ෂස්ථානයෙන්; සිත්ලෙසින්, සිත්සේ; යව, ප්‍රයාණයකර.

102 පැයෙන් ඔපනගාලූරන් රුසිරි න
රු ප න් සරාසරමෙන්දන මනබඳි න
යෝනන් බලාතොපඟනපෙර මගසිටි න
යා ග න් මින්වානෙත් තොසලපුරමි න

පැයෙන්, ප්‍රභාවහෙතුකොටගෙන; ඔප්නගාලූ, ශලිෂ්ටභාවය නොහොත් ප්‍රභාවනගාලූවාවූ; රන්

රුසිරින, සවර්ණරූපශ්‍රීන්යුක්තවූ; රූ, රූපයෙන්; ප
න්සරාසැරමෙන්, අනඝයාගේශරපරිච්ඡෙදෙන්; දන
මන, ජනයන්ගේසිත්; බඳින, බන්ධනයකරන්නාවූ;
තොපයන, සූෂ්මතාප්‍රයාණයකරන්නාවූ; පෙරමගා
සූර්පථයෙහි; සිටිනා, සිටින්නාවූ; යෝනන්, තරුණ
ස්ත්‍රීන්; බලා,අවලොකනයකොට; තොස, සන්තුෂ්ටි
යෑලපූරමින, හෘදයෙහිපූරණයකරමින්; මින්වානෙ
න්, මින්නානනම් ග්‍රාමප්‍රදේශයෙන්; යාගන්, යාත්‍රා
ග්‍රහණයකර.

103 බ ට නි ල් වෙලෙව් දෙරණට විදුලියසස ඳ
ව ට පු ල් සාමබුලුයුතුතුරු පෙලනොම ඳ
ගැට දෙ ල් ගසමඩමේ මඳකලක්ඉ ඳ
අ ට ලොල් වෙමින්නුබනැගයාගන්සබ ඳ

සබඳ, මිත්‍රය; විදුලියසසඳ, විද්‍යුල්ලතාසංසර්ගය
ඇතිව; දෙරණට, පෘථිවියට; බට, අවතීර්ණවූ; නිල්
වෙලෙව්, නීලවර්ණමෙඝයක්බඳුවූ; වට, හාත්පස්හි;
පුල්, සුපුෂ්පිතවූ; සාමබුලුයුතු, ශාඛාමණ්ඩලයෙන්;
යුක්තවූ; නොමඳ, අමඳවූ; තුරුපෙල, වෘක්ෂපඞ්ක්ති
යෙන් යුක්තවූ; ගැටදෙල්ගසමඩමේ, ගැටදෙල්ගස
මඩම නම්වූ විශ්‍රාමශාලාවෙහි; මඳකලක්, ස්වල්පකා
ලයක්; ඉඳ, නිසද්‍යකොට; අටලොල්වෙමින්, ගම
නෙහිලොභඇතිව; නුබනැග, අහසටනැඟී; යාග
න්, යාත්‍රාග්‍රහණයකරව.

104 පැ ප ත් පුන්සඳෙව්නිසිළුවතින් දිලෙ න
යා ප ත් වෙන්ලියෙව් සතසතනාජිනව නා
රූ ප ත් නන්කොමලඅඟනන් නිතිරඳ න
බෝපැත් තෙන් යවසිත්සෙ සොඳලෙසි න

පැපත්, ප්‍රභාවත්වූ; පුන්සඳෙව්, පූර්ණචන්ද්‍රයාමෙ
න්; නිසි, යොග්‍යවූ; ළුවතින්, වක්ත්‍රයෙන්; දිලෙන,
දිලියෙන්නාවූ; සත, සත්වයන්ගේ; සතන, සන්තා

නයන්; පිණවන, සතුටුකරන්නාවූ; යාසත්, යසසත්වූ; වෙන්ලියෙව්, ශ්‍රීකාන්තාවවැනිවූ; රූපත්, රූපයෙන්යුක්තවූ; තන්කොමලඅඟනන්, තොයෙක්කොමලාඞ්ගනාවන්; නිති.නිරන්තරයෙන්;රඳනා,වාසයකරන්නාවූ; බෝපැත්තෙහත්, එනම්ග්‍රාමයෙහි; සිත්සේ, සිත්රඳනපරිද්දෙන්; සොඳලෙසින, යශපත්සේ;යව, ප්‍රයාණයකරව.

105 දි ලෙ න උවනතින්පලකර අමාකා ර
කෙළෙන සොඳුරුකොමලඟනන්උමාසු ර
ඝ ම න පවනවිදතුනුගිම් නිවාහැ ර
ච ඩ න මැනවිදූකඅස්ගම් මහසයු ර

දිලෙන, බබලන්නාවූ; උවනතින්, වක්ත්‍රයෙන්; අමාකර, චන්ද්‍රයා; පලකර, ප්‍රකාශකොට; උමාසුර, උමාවවැනිවූ; සොඳුරු, සුන්දරවූ; කොමලඟනන්, කොමලාඞ්ගනාවන්; කෙළෙන, ක්‍රීඩාකරන්නාවූ; ඝමන, වදින්නාවූ; පවන, මාරුතය; විඳ, ලබා; තුනුගිම්, ශරීරඝර්මය; නිවාහැර, දුරුකොට; අස්ගොච්මහසයුර, එනම්ස්ථානය; දූක, දර්ශනයකොට; වඩිනාමැනව්, වඩිනුමැනව්.

106 පුලා සිටිය පියයුරුයුග කරඬුස මා
කලා සිටිය සුරඟන සදිසි මනර මා
බලා සිටිය හොත්වෙයිතොප ගමන්ප මා
නලා විටිය පසුකරයව තොවීප මා

කරඬුසමා, ස්වර්ණමඤ්ජුසාබඳුවූ; පුලාසිටිය, පරිපූර්ණවූ; පියයුරුයුග, පයොධරයුගමඇත්තාවූ; සුරඟනාසදිසි, දිව්‍යස්ත්‍රීන්බඳුවූ; මනරමා, චිත්තසන්තුෂ්ටිඑලවන්නාවූ;සිටිය,ස්ථානයකරන්නාවූ;කලා,ස්ත්‍රීන්; බලාසිටියහොත්, නිරීක්ෂණයකරමින් සිටියහොත්; තොප, සුෂ්මතාගේ; ගමන,යාම; පමාවෙයි,ප්‍රමාදවෙයි,(එහෙයින්) පමානොවී, ශීඝ්‍රව; නලාවිටියපසුකර, මේනම්ග්‍රාමයපසුකොට;යව, ප්‍රයාණයකරව.

107 වෙනේ සුපිපිමල්රොන්සඟ බිඟුන්ස ර
ගෙනේ ගමනනලවිඳතුනු ගිමන්හැ ර
මෙනේ රිපිටියාබැව්ලෙන් බැසපත ර
මෙනේ සතොසසපුරා යාගන්මිතු ර

මිතුර, මිත්‍රය; වෙනේ, වනයෙහි; සුපිපි, සුපුෂ්පිත වූ; මල්රොන්සඟ, පුෂ්පරේණූන්සමග; බිඟුන්සර, භෘංගනාදය; ගෙනේ, ග්‍රහණයකොට; ගමන, ගමන්නාවූ; නල, මාරුතය; විඳ, ලබා; තුනුගිමන්, ශරීරශ්‍රමය හැර, පහකොට; මෙනේරිපිටියාබැව්ලෙන්, මෙනම්ස්ථානයෙන්; බැස, අවතීර්ණව; මෙනේ, චිත්තයෙහි; පතරසතොස, මහසන්තොෂය; සපුරා, සම්පූර්ණයකොටගෙන යාගන්, යාත්‍රාග්‍රහණයකරව.

108 කමලසැ ටි ය වතඳිගුනිල් නෙත්පෙ ටිය
තිසරපැ ටි ය විලසින්යුග තනසි ටිය
ගමඹු සි ටි ය මඳයුදයට වෙම් න ටිය
මිළිල වි ටි ය බලතොසකර යුගදි ටිය

කමලසැටිය, පද්මාකාරවූ; වත, මුඛයක්ඇත්තාවූ; දිගු, දීර්ඝ; නිල්, නීලවර්ණ; නෙත්, නෙත්‍ර; පෙටිය, පෘෂිනමත්ස්‍යයන්බඳුවූ; තිසරපැටිවිලසින්, හංසපැටියන්සමානවූ; සිඹිණ, උන්නතවූ; තනයුග, පයොධරයුගමඇත්තාවූ; මඳයුදයම, කාමයුඬයට; අටිය වෙමින්, ආශාවෙමින්; ගමඹු, ග්‍රාමවාසීස්ත්‍රීන්; සිටිය සිටිනාවූ; මිළිලවිටිය, එනම්ග්‍රාමය; යුගදිටිය, නෙත්‍රයුගමය; තොසකර, සතුටුකොට; බල, අවලොකනයකරව.

109 උදුලියසඳකිරණම්හිපිව හුනුහෙලස ව
සුදුවැලිතලවැලිමලු වෙනිසැඳිසු ම ව
රුඳුනතඳුරණයුරු පව්රෙතිහුනු අව ව
වදුමමිතුර දෙල්ගමුවෙහෙර ලැගුම ව

සඳකිරණ, චන්‍ද්‍රරශ්මිය; මිහිපිට, පෘථිවිතලයෙහි; සුනුලෙසට, පතිතවූවිලාසයෙන්; උදුලිය, බබලන්නාවූ; සුදුවැලින්, ශ්වේතවාලුකාවෙන්; අතුළ, ආස්තරණයකරණලද; සුමට, මට්ටම්වූ; වැලිමළුවෙනි, වාලුකාමණ්ඩපයෙන්; සැදි, සජ්ජිතවූ; රුදු, මහත්වූ; නිතදරණයුරු, අනන්තභයාගේභොගාවලිය සදෘශවූ; පව්රෙනි, ප්‍රාකාරයෙන්; අවට, හාත්පසින්; යුතු, යුක්තවූ; දෙල්ගමුවෙහෙර, ලබුජග්‍රාමවිහාරයෙහි; ලැගුමට, නවාතැන්පිණිස; මමිතුර, මාගේමිත්‍රය; වදු, ප්‍රවිෂ්ටවව.

110 පවර තුඟුඅවර ගිරකිරරඳ විපු ල
අඹර ලියලැහැබ රුඳිදිනිඳු බිඹුප ල
පතර සඳවලාතුඩිනැද රුගත්ක ල
මිතුර ලගිත්එහිතුරු සිරෙකම ලව ල

පවර, උතුම්වූ; තුඟු, උන්නතාඞ්ගවූ; අවරගිර, අපරපර්වතයනමැති; කිරරඳ, කීරපක්ෂිරාජයා; විපුල, මහත්වූ; අඹරලියලැහැබ, ආකාශනමැති ලතාගුම්බයෙහි; රුඳි, විද්‍යමානවූ; දිනිඳු, සූර්‍ය්‍යනාමැති; බිඹුපල, (පක්ව) බිම්බඵලය; පතර, මහත්වූ; සඳවලා, සන්ධ්‍යාවලානාමැති; තුඩින්, තුණ්ඩයෙන්; ඇද, ආකර්ෂණයකොට; රුගත්කල, හැරගත්කල්හි; මිතුර, මිත්‍රය; එහි, ඒලබුජග්‍රාමවිහාරයෙහි; මලවල, පුෂ්පාකුලවූ; තුරුසිරෙක, වෘක්ෂමස්තකයෙහි; ලගින්, නිවාසග්‍රහණයකරව.

111 වෙරළ හොයලමුතුබරණින් සැදිපව ර
පතල සළාසක්අවිලෙල තරඟක ර
පුවල අඹරඅිඟුලවිඳුගෙ පුළුල්උ ර
තරළ මිණෙකසිරිකියළිය සහසක ර

පතර, මහත්වූ; වෙරළ, වෙලාන්තයෙහි; හොයල, වාලුකානාමැති; මුතුබරණින්, මුක්තාභරණ

යෙන්; සැදි, සජ්ජිතවූ; පතළ, ව්‍යාප්තවූ; සළු, ජටා නමැති; සක්අව්, චක්‍රායුධය; තරඟකර, තරඞ්ගනාමැති ගංගායෙන්; ලෙල, ලීලොපෙතකරන්නාවූ; සුවළ, ප්‍රෞඪවූ; අවරදිගු, අපරදිශානමැති; ළවිඳුගේ, උපෙන්ද්‍රයාගේ; පුළුල්උර, පෘථුලවූ වක්ෂඃස්ථලයෙහි; රැඳි, රඳන්නාවූ; තරළම්ණෙකසිරි, කෞස්තුභමහපාෂාණශ්‍රිය; සඟසකර, සූර්‍ය්‍යා; කියලිය, ප්‍රකාශකලේය.

112 නිස ගන හුන් පැහැසරගණ නිලඹ ර   ඳ
අට දිග තුන් කොපුලතවන් බිඟුරොඳ   ඳ
සැඳ වෙලඟින් නොන්නැග්රුදු දුම්කඳ   ඳ
බල මෙලෙසින් සැකයුත්ගණ අඳුරුක   ඳ

නිසගන, රාත්‍රියනමැති අඟනාවවිසින්; හන්, නිවාසනායකළාවූ; පැහැසර, ප්‍රභාස්වරවූ; ගණනිලඹරඳ, ඝණවූ නීලවර්ණව්‍යාප්තයක්ද්‍යෙහෝ; අටදිගතුන්, අෂ්ටදිශානමැතිහස්තීන්ගේ; කොපුලත, කපොලදෙශයෙහි; වන්, පතිතවූ; බිඟුරොඳඳ, භෘඞ්ගරාජියද්‍යෙහෝ; සැඳවෙලඟින්නොන්, සන්ධ්‍යාවලානමැතිවනිතියෙන්; නැගි, උදගතවූ; රුදු, මහත්වූ; දුම්කඳඳ, ධූමස්කන්ධයද්‍යෙහෝදසියන්; මෙලෙසින්, උක්තප්‍රකාරයෙන්; සැකයුත්, ශඞ්කාවෙන්යුක්තවූ; ගණඅඳුරුකඳ, ඝණාන්ධකාරස්කන්ධය; බල, අවලොකනයකරව.

113 සි සි හිමිතමවෙත නොලසව එනබැව්   න
නිසි නිසගනතුබව්මනත සුසඳම්   න
ඉ සි අසෙනියකුසුමන් විලසින්නොම්   න
දි සි තුරුවැලබල මම්තුරසිතුලෙසි   න

නිසි, (අභිලාෂයට) යොග්‍යවූ; නිසඟන, රාත්‍රියනමැතිස්ත්‍රියවිසින්; නොලසව, අප්‍රමාදව; සිසිහිමි, චන්ද්‍රයානමැතිස්වාමියා; තමවෙත, තමන්කරා; එනබැව්න, ආගමනයකරණහෙයින්; තුබ, නාභස්ථල

යනමැති; විමනත, මඤ්ජරය; සුසැදුම්නා, සුසජ්ජිත කොට; ඉසි, විසිණීයකලාවූ; ගෙනාම්න්, අප්‍රමාණවූ; අසෙනියකුසුමන්විලසින්, ලාජපුෂ්පවිලාසයෙන්; දිසි, දෘශ්‍යමානවූ; තුරුවැල, තාරකාවලිය; මම්තුර,මාගේමිත්‍රය; සිනුලෙසින, සින්සේ;බල, අවලොකනය කරව.

114 පස න් කැලුම්සුතුපුන්සඳ වටාප ත
රැගත් මින්උදයගිරතින් නිසාක ත
ග මන් වැසනදුරුකරණුව තුබේ ග ත
ප ව න් ගසනමෙන් මදනලගමා එ ත

පසන්කැලුම්සුතු, ප්‍රසන්නකාන්තියෙන් යුක්තවූ; පුන්සඳ, පූර්ණචන්ද්‍රයානමැති; වටාපත, විජිනිපත්‍රය; නිසාකත, රාත්‍රීයනමැති ස්ත්‍රියවිසින්; උදයගිරතින්, උදයපර්වතනමැතිහස්තයෙන්; රැගත්මින්, හැරගතිමින්; තුබේගත, යුෂ්මතාගේශරීරයෙහි; ගමන්වැසන, මාර්ගපරිශ්‍රමය; දුරුකරණුව, දුරුකරණපිණිස; පවන්ගසනමෙන්, මාරුතය ගසන්නාක්මෙන්; මදනලගමාඑත,මඳමාරුතයගමාඑන්නාවූකාලයෙහි.

115 සිරු රු රැසින් හෙලිකර දිගු තොතෝ රා
රැගෙනඅතින් පරසතුමල් මදු රා
සුදුව සුරන් යනුඑනුනියම නැ රා
සකිසතොසින් බලබැතිසිති නුදු රා

දිගු, දිශාවන්; තොතෝරා, පසුනොකොට; සිරුරුරැසින්, ශරීරරශ්මියෙන්; හෙලිකර, ආලොකකොට; අතින්, හස්තයෙන්; මදුරාපරසතුමල්, මන්දාරපාරිජාතකපුෂ්පයන්; රැගෙන, හැරගෙන; සුරන්, දෙවියන්; නියමනැරා,නියමයපසුනොකොට; යනුඑනු, ගමනාගමනය; සනි, මිත්‍රය; උදුර, මහත්වූ; බැතිසිතින්, භක්තිචිත්තයෙන්යුක්තවැසතොසින්, සන්තුෂ්ටියෙන්; බල, නිරීක්ෂණයකරව.

116 මන නඳ රජසිඟරජුතෙදණනොමඳි න
රු පුර ද යසහැරදසදෙස වතළමෙ න
පි රි ස ඳ කිරණසඟතුරු මකමින්ගුව න
පැහැනඳ අරුණුරුස්වතළේ පෙරදිගි න

මනනඳ, මනොනන්දනවූ; රජසිඟරජු, රාජසිංහනරේන්ද්‍රයාගේ; තෙදණ, තේජෝගුණ; නොමඳින,බොහෝසෙයින්; රුපුරද, ශත්‍රුරාජයන්ගේ; යස, කීර්ත්ති ය, හැර, පහකොට; දසදෙස, දශදිශාවෙහි; වතළ මෙන, විස්තෘතවූවාක්මෙන්; පිරිසඳකිරණසඟ,පූර්ණ චන්ද්‍රරශ්මියහා; ගුවන, ආකාශයෙහි; තුරු, තාරකාවන්; මකමින්, නිෂ්ප්‍රභාකරමින්; පැහැනඳ, ප්‍රභාවෙන්ආර්ද්‍රවූ; අරුණුරුස්,අරුණවර්ණරශ්මිය;පෙරදිගින, පූර්වදිශාභාගයෙන්; වතළේ, පතළේය.

117 වැ ළ ඳ අරුණුරුස්කසවත පෙරගඹ සි
තොමඳ ලෝවහනෙහි ගණඳුරකසළුරු සි
ඇ ම ද එළිකරණගණරන් මුසුන්ලෙ සි
ස බ ද කිරණකිඳුදුලරිවි බලගරි සි

පෙරගඹ, උදයපර්වතනමැති;ඉසි, ඍෂීන්වහන්සේ; අරුණුරුස්, අරුණුරශ්මිනමැති; කසවත, කාෂාය වස්ත්‍රය; වැළඳ, පාරුපනයකොට; තොමඳ, බො හෝවූ; ලෝවහනෙහි, ලොකනමැතිමළුවෙහි; ග ණඳුර, ඝනාන්ධකාරයනමැති; කසළරුසි, කසළරා ශිය; ඇමද, සම්මාර්ජනයකොට; එළිකරණ, එළිකර න්නාවූ නොහොත් නිර්මලකරන්නාවූ; කිරණකිඳුදු ල, රශ්මිනමැතිකෙන්දෙන් බබලන්නාවූ; ගණරන් මුසුන්ලෙසි, ඝණස්වර්ණමයවූමුස්නක්බඳුවූ; රිවි, සූර්ය්‍ය යා; රිසි, රුචියෙන්; සබද, මිත්‍රය; බලගැ,, අවලෝ කනය කරව.

118 ලොවනොමදින් පිරිගණදුරුදමා දු    ර
සිය කිරණින් හිරුපැමිණෙන උදගි    ර
ලැගිනිවෙසින් නැගතෙරුවන් මෙනේක    ර
මිතුර වඩින් දළදාගෙට මනෝහ    ර

නොමදින්, අප්‍රමාණව; ලොව, ලොකයෙහි; පිරි, පිරුණාවූ; ගණදුරු, ඝනාන්ධකාරය; දුරදමා, දුරිභූත කොට; හිරු, සූර්‍ය්‍යයා; සියකිරණින්, ස්වකීයරශ්මියෙන්; උදගිර, උදයගිරිශිඛරයට; පැමිණෙන, සම්ප්‍රාප්ත වන්කාලයෙහි; ලැගිනිවෙසින්, ලැග්ගාවූනිවාසයෙන්; නැග, උත්ථිතව; තෙරුවන්, ත්‍රිවිධරත්නය; මෙත්කර, සීඝ්‍රපත්කොට; මිතුර, මිත්‍රය; මනෝහර, මනොඥවූ; දළදාගෙට, දළදාගෘහයට; වඩින්, ප්‍රයාණය කරව.

119 මුනිඳු සිරිමුවෙන්වදහළ එකබසි    න
සුරිඳු තෙකෙළසැටසුවහස් අයුලදි    න
පැහැදු පිදූනවමිණිකිරුළෙව් තෙව්    න
පබඳු රුවන්කරඬුවතුලෙහි වොරදි    න

මුනිඳු, සර්‍වඥයන්වහන්සේවිසින්; සිරිමුවෙන්, ශ්‍රීමුඛයෙන්; වදහළ, වදාළාවූ; එකබසින, එකවචනයෙන්; සුරිඳු, ශක්‍රදෙවෙන්ද්‍රයා; තෙකෙළසැටසුවහස්වාසූ, තුන්කොටිසැටහාරදෑස්ආයුෂ ලදින, ලත්හෙයින්; පැහැදු, ප්‍රසන්නව; පිදු, පුදනලද; නවමිණිකිරුළෙව්, අභිනවමාණික්‍යකිරීටයක්මෙන්; තෙව්න, බබළන්නාවූ; පබඳු, ප්‍රබන්ධවූ; රුවන්කරඬුවතුලෙහි, රත්නසමුද්ගාභ්‍යන්තරයෙහි; වොරදින; විරාජමාන වන්නාවූ

120 බඹ සුර නරඋරග කිරුළගම්ණි රසි    න
හැමවර පුදනසිරිපා තඹරින් සොබ    න
මුනි වර වදනඹරසුලකළ තරිඳුමෙ    න
ම මි තුර නමදු දළදාහිමිහට බැති    න

බඹ, බ්‍රහ්මයා; සුර, දෙවයා; නර, මනුෂ්‍යයා; උරඟ, නාගයා (යනමොවුන්ගේ) තිරුළුඅග, කිරීටාග්‍රයෙහි; මිණිරසින, මාණික්‍යරශ්මියෙන්; හැමවර, සියලුකාලයෙහි; පුදන, පුදන්නාවූ; සිරිපාතඹරින්, ශ්‍රීපාදපද්මයෙන්; සොබන, ශොභමානවූ; මුනිවර, සර්වඥරාජයාණගේ; වදනඅඹර, වචනනමැතිආකාශයෙහි, සුලකළ, ස්වලබ්ධකෘතකළාවූ; තරිඳුමෙන, චන්ද්‍රයාමෑනිවූ; දළදහිමිහට, ශ්‍රීදන්තධාතුන්වහන්සේට; මමිතුර, මාගේමිත්‍රය; නමඳු, නමස්කාරකරව.

121 පසිඳු උතුම්ලකුණෙන්කළ මුනිරුව ද
මුනිඳු දනාදනකරකළ දාගැබ ද
විහිදු ගණකුළක්බඳුරුදු දුමරදු ද
නමදු මිතුරබැතියෙන්තුන් සිතපැහැ ද

පසිඳු, ප්‍රසිද්ධවූ; උතුම්ලකුණෙන්, උත්තමලක්ෂණයෙන්; කළ, කළාවූ; මුනිරුවද, සර්වඥප්‍රතිමාවද; මුනිඳුද, සර්වඥධාතු; නාදනකර, නිධානයකොට; කළ, කළාවූ; දාගැබද, ධාතුගර්භයද; විහිදු, විස්තීර්ණවූ; ගණකුළක්බඳු, මෙඝකූටයක්බඳුවූ, රුදු, මහත්වූ; දුමරදුද, බොධිද්‍රැමයද; මිතුර, මිත්‍රය; තුන්සිතපැහැද, තුන්සිතින්මපැහැද; බැතියෙන්, භක්තියෙන්; නමදු, වඳුව.

122 සුග තිඳු සසුනඹර සිසි කර ලෙසින්තෙව් නා
සෙමෙර කිරළ විලසින් වල් බිජුරකි නා
නිත ර සුපිරි සිව් පිරි සිඳු සිල් රකි නා
තෙවළාදහම් සයුරේනැණ නැවින්තෙරපැමිනි
කව්නළුසඳ ලකරපිරිසිඳ දැනනැණි නා
කව්කැළ ගෙල සැදු පිරිසිදු යසහරි නා
අවි දු අඳුරුදුරුකළසිරි නිදනක ර
සිතිඳු මදුරපියතෙපුලැති අමාසු ර
මිහි ඳු ලකරතෙරහිමිසිරි පාතඹ ර
නමදු මිතුරබැතිපෙම්සිත දියුණුක ර

• සුගතිඳුසසුනඹර, බුද්ධශාසනාම්බරයෙහි; සිසිකරදලසින්, චන්ද්‍රකාන්තිපරිද්දෙන්; තෙව්නා, බබලන්නාවූ; වල්, වාලබීජනා; බිජු; අණ්ඩයන්; රකිනා, රක්ෂාකරන්නාවූ; සෙමරකිරළවිලසින්, චමරීමෘගයාගේ; සිකිපක්ෂියාමෙන්; නිතර, අනවරතයෙන්; සුපිරි, සම්පූර්ණවූ; සිව්පිරිසිදුසිල්, චතුපාරිශුද්ධිශීලය; රකිනා, රක්ෂාකරන්නාවූ; තෙවළාදම්සුරේ, ත්‍රිපිටකධර්මනමැතිසාගරයෙහි; තෙර, තීරයට; නැණනැවින්, ඥානනමැතිනෞකාවෙන්; පැමිනා, සම්ප්‍රාප්තවූ; කව්තරු, කාව්‍යනාටකයා; සඳ, ජන්දස්; ලකර, අලංකාරයන්ද; නැණින, ඥානයෙන්, පිරිසිඳ, පරිච්ඡේදකොට; දනා, අවබොධකර; කව්කැල, කාව්‍යකාරසමූහයාගේ; ගෙල, ග්‍රීවය; පිරිසිදු, පරිශුද්ධවූ; යසගුරිනා, කීර්තිනමැතිහාරයෙන්; සැදූ, සජ්ජිතකළාවූ; අවිඳුඅඳුරු, අවිද්‍යානමැතිඅන්ධකාරය; දුරුකළසිරින්, විධ්වංසනයකළශ්‍රීන්; දිනකර, සූර්‍ය්‍යාවැනිවූ; අමාසුර, අමෘතයබඳුවූ; සිනිඳු, ස්නිග්ධවූ; මදුර, මධුරවූ; පියතෙපුලැති, ප්‍රියවචනතියන්නාවූ; මිහිඳුලකරතෙරහිමි, මහින්දාලංකාර ස්ථවිරපාදයන්ගේ; සිරිපාතඹර, ශ්‍රීපාදපද්මය; සිත්, චිත්තයෙහි; බැතිපෙම්, භක්තිප්‍රේමය; දියුණුකර, ද්විගුණකොට; මිතුර, මිත්‍රය; නමදු, නමස්කාරකරව.

123 මනරම් සුරඹසමඟින් සුරරදසුම නා
ගඳ දුම් මල්පහන්පුදකර නිතිවදී නා
නරදම් සැරිසිරිපද ලසිනි වොරදී නා
විහිගුම් සමන්ගිරබලපෙරදෙස පෙණෙ නා

සුමනසුරරද, සමන්දේවරාජයාවිසින්; මනරම්, සිත්සතුටුකරන්නාවූ; සුරඹසමඟින්, දිව්‍යාඞ්ගනාවන්හාසමග; ගඳදුම්මල්පහන්පුදකර, සුගන්ධධූපපුෂ්පප්‍රදීපයන්පුදකොට; නිති, අනවරතයෙන්; වදිනා, නමස්කාරකරන්නාවූ; නරදම්සැරි, සර්වඥරාජෝත්තම

යාගේ; සිරිපදලසිනි, ශ්‍රීපාදලාඤ්ඡනයෙන්; වොර දන, විරාජමානවූ; පෙරදෙස, පූර්වදිශාවෙහි; පෙණෙ න, දෘශ්‍යමානවූ; විහිගුම්, උස්වූ; සමන්ගිර, සමන්ත කූටපර්වතය; බලා, අවලොකනය කරව.

124 මල වල කොකුම් ලියවෙනිනෙන සුවඳරොණ
සුනිමල අහස්ගඟරළ සී කරද ගෙ    ණ
හිමවල වැදසඳුන් පලුතනවාහ ම්    න
මදනල පහස විඳයායන් ගුණ නද    න

මලවල, පුෂ්පයෙන්ආකුලවූ; කොකුම්ලියවෙනී න්, කුඞ්කුමලතාවනයෙන්; එන, එන්නාවූ; සුවඳ රොණ, සුගන්ධමකරන්දයන්ඇත්තාවූ; සුනිමල, ඉතා නිර්මලවූ; අහස්ගඟ, ආකාශගඞ්ගාවෙහි; රළ, තර ඞ්ගයන්ගේ; සීකරද, ජලබින්දු; ගෙණ, ග්‍රහණය කොට; හිමවලවැද, හිමාලයපර්වතයෙහිසට්ටනාවී; සඳුන්පලුතනවා, චන්දනපල්ලවයන් කම්පාකොට; හමන, හමන්නාවූ; මදනල, මන්දමාරුතයාගේ; ප හස, ස්පර්ශය; විඳ, ලබා; ගුණනදන, ගුණනිධානවූ (මිත්‍රය); යාගන්, යාත්‍රාග්‍රහණයකරව.

125 රසග මියඹපානයකර වෙලෙප්ම    තු
විහග කොවුල්කැලබිඟුදෙන නදනුමු    තු
පතග කිරණනොපහළ තුරුසෙවනයු    තු
බලග තැනින් තැනසැදිසොඳ උයන්ව    තු

අග, උත්තමවූ; මියඹරස, මධුරාම්‍රරසය; පානයකා ර, බී; වෙලෙප්මතු, විටපමස්තකයෙහි; විහගකො වුල්කැල, කොකිල පක්ෂිසමූහයා විසින්ද; බිඟු, භෘ ඞ්ගයන්විසින්ද; දෙන, පවත්වන්නාවූ; නාද, නාද යෙන්; නුමුතු, යුක්තවූ; පතගකිරණ, සූර්‍ය්‍යරශ්මිය; නො පහළ, නොවැටුනාවූ; තුරුසෙවනයුතු, වෘක්ෂච්ඡායා

වෙන්යුක්තවූ; තැනින්තැන, තැන්තැන්වල; සැදී, සජ්ජිතවූ; සොඳ, සුඳුරවූ; උයන්වතු, උද්‍යානයන්; බලගා, බලව.

126 නොමඳින් සස්වගින් අස්වැදතිබෙන ම නා
බ සි මි න් පැසුනුහැල්කෙත්වලට මන පි නා
බු දි මි න් ගොදුරුබඩසාපමණ දුන් ගෙ නා
එ ත නින් වඩින්සැව්ලිඳු සඳිනි සතොසි නා

අස්වැදතිබෙන, අස්වැදීඇත්තාවූ; මනා, මනොඥවූ; නොමඳින්සස්වගින්, අප්‍රමාණවූ ශෂ්‍යවර්ගයෙන්යුක්තවූ; පැසුනු, පක්වභාවයටපැමිනියාවූ; හැල්කෙත්වලට, ශාලික්ෂෙත්‍රයන්ට; මනපිනා, චිත්තසන්තුෂ්ටියකොට; බසිමින්, අවතීර්ණව; බඩසාපමණ, කුක්ෂික්ෂුධාප්‍රමාණය; දුනගෙනා, නිශ්චයකොටදැන; ගොදුරු, ගොචරයන්; බුදිමින්, අනුභවකොට; එතනින්, ඒස්ථානයෙන්; සැව්ලිඳුසඳිනි, කුක්කුටෙන්ද්‍රය; සතොසිනා, (චිත්ත) සන්තොෂයෙන්; වඩින්, ප්‍රයාණයකරව.

127 පු ල් ර තු පු ල් මල් සුගසවණත පැළ ඳ
ත ල් තු ගු තු ල් කුළුමුදුනත නැඟී ඉ ඳ
ඇ ල් ගෙ වි කල් පවසතාගී අසා සො ඳ
ලොල් ක ර ක ල් නොයවා යාගන් ස බ ඳ

පුල්, පිපුනාවූ; රතුපුල්මල්, රක්තොත්පලපුෂ්පයන්; සුගසවණත, ශ්‍රවණසුගමයෙහි; පැළඳ, පිළන්ධනයකොට; තල්, තාලවෘක්ෂයන්සේ; තුගු, උස්වූ; තුල්, මහත්වූ; කුළුමුදුනත, කූටමස්තකයට; නැගීඉඳ, ආරූඪවසිට; ඇල්ගෙවිකල්, ශාලිගොපිකාවන්විසින්; පවසත, ප්‍රකාශකරන්තාවූ; සොඳ, සුඳුරවූ; ගී, ගීතිකාවන්; අසා, ශ්‍රවණයකොට; ලොල්කර, (ජම) ලොභකර; කල්නොයවා, කාලක්ෂෙපනොකොට; සබඳ, මිත්‍රය; යාගන්, ප්‍රයාණයකරව.

128 හිරු හ ට මදක්බිමහියනොම දී දිලෙ න
තුරු ය ට සුපිරිසිදුසුදුවැලි තලසොබ න
දුරු කොට තුනුගිමන්සැතපී ඉඳයෙහෙ න
කුරු විට ගඟදෙගොඩ බලසකි ගුණ නද න

දිලෙන, දිලිසෙන්නාවූ; හිරුහට, සූර්‍ය්‍යරශ්මියට; මදක්, ස්වල්පයකුත්, බිමහියනොමදී, භූමියට (පතිතවීමට) අවකාශනොදී; තුරුයට, වෘක්‍ෂයන්ගේ අධොභාගයෙහි; සුපිරිසිදු, අතිපරිශුද්ධවූ; සොබන ශොභනාවූ; සුදුවැලිතල, ශ්වෙතවාලුකාස්ථලයන්හි; යෙහෙන, සුවසේ; සැතපීඉඳ, සන්තර්පිතවසිට; තුනුගිමන්, ශරීරවිඩාව; දුරුකොට, පහකොට; ගුණනදන, ගුණනිධානවූ නොහොත් නඳනගුණවත්; සකි, මිත්‍රය; කුරුවිටගඟදෙගොඩ, කුරුවිටගඟේ උභයතීරය; බල, අවලොකනය කරව.

129 දිගුසොඬගින් ඇදතුගුතුරුහෙ ලා නේ
බිඳුරකමින් සිටි මත ගජ රැ ලා නේ
දැකසතොසින් නොගොසින් මග ව ලා නේ
සිරි නා රඹන් කුරුවිටි මූ ක ලා නේ

දිගුසොඬගින්, දීර්‍ඝශුණ්ඩාග්‍රයෙන්; ඇද, ආකර්ෂණයකොට; තුගුතුරු, දීර්‍ඝවෘක්ෂයන්; හෙලානේ, හෙලමින්; බිඳැරකමින්, භග්නකොටභක්ෂණයකරමින්; සිටි, සිටියාවූ; මතගජරැලානේ, මත්තහස්ති සමූහයන්; සතොසින්, සන්තුෂ්ටියෙන්; දැක, අවලොකනයකොට; මග, මාර්ගය; වලානේ, වරද්දාගෙන; නොගොසින්, ගමනයනොකොට; කුරුවිටිමූකලානේ, එනම්මහාවන ප්‍රදෙශයෙහි; සිරි, ශ්‍රීය; නාරඹන්, අවලොකනය කරව.

130 තම ල් නිල් ව ර ල් බිඹුවැල රත අද ර
සූ පූ ල් නිල් උ පු ල් නෙත් තිසර තනබ ර
කොමුල් තුල් තෙපුල් සුඹුඹුල් රඹවටො ර
ල ක ල් කල් සෙ දුල් වනහගනබල මිතු ර

තමල්, තමාලනමැති; නිල්වරල්, නීලධම්මිල්ල ඇත්තාවූ; බිඹුවැල, (පකව) බිම්බිඵලනමැති; රතඅ දර, රක්තාධරඇත්තාවූ; සුපුල්, සුපුෂ්පිතවූ; නිල්උ පුල්, නීලොත්පලනමැති; නෙත්, නෙත්‍ර ඇත්තාවූ; තිසර, හංසයන්නමැති; තනබර, පයොධර භාරය ක්ඇත්තාවූ; කොවුල්කුල්, කොකිලනාදය නමැති; තෙපුල්, වචනඇත්තාවූ; සුහුඹුල්, මනාවවැඩුනා වූ, රඹ, රම්භාවෘක්ෂනමැති; වටොර, වෘතෝරුඇ ත්තාවූ; ලකල්, ලක්ෂණසම්පන්නාවූ; කල්සෙ, ස්ත්‍රිය ක්මෙන්; දුල්, බබලන්නාවූ; වනගන, වනනමැති ස්ත්‍රියෝ; මිතුර, මිත්‍රය; බල, අවලොකනය කරව.

131 නිල් කටරොලුමලෙව් පිල්කැල විදහමි න<br>
නිල් ගෙලෙරගනරගතුගුතුල්ගිරි මුදු න<br>
බැල් මටයනමෙතොපයුගඇස් මදබැවි න<br>
පි ල් ඇසවිදූ නරඹන වැන්න සතොසි න

නිල්කටරොලුමලෙව්, නීලවර්ණගිරි කර්ණිකාපු ෂ්පරාශියක්සදෘශවූ; පිල්කැල, පිඤ්ඡසමූහය; විදහමි න, විසිණියකොට; නිල්ගෙලෙ, මයුරයන්; තුගු, උ ස්වූ; තුල්, මහත්වූ; ගිරිමුදුන, පර්වතමස්තක යෙහි; රගනරග, නෘත්‍යයකරන්නාවූ ආකාරය; යන, යන් නාවූ; මෙනොප, මේ යුෂ්මතා; බැල්මට, අවලොක නයකිරීමට; යුගඇස්, දෘෂ්ටියුගමය; මදබැවින, සව ල්පබැවින්; පිල්ඇස්, පිල්නමැතිඅක්ෂින්; විදූ, දිග හැර; සතොසින, සන්තුෂ්ටියෙන්; නරඹනවැන්න, බලන්නාක්මෙනි.

132 ම ර ක ත මිණිසපිසිපෑගැයුත් ගිරාපෙ ල<br>
තු ඩ ර ත දෙළුම්පලනෙත්බිජුරැස්වග ල<br>
තොමපත වුවදගණකල්මිහි පිටුවත ල<br>
පැගැ පත රතිඳුගොව්සිරිගෙණැර පල කා ල

මරකතමිණිසදිසි, මරකතමාණික්‍යාකාරවූ; පැහැයුත්, ප්‍රභාවෙන්යුක්තවූ නොහොත් නීලවර්ණවත්වූ; ගිරාපෙල, කීරපක්‍ෂිපඞ්ක්තියවිසින්; රතතුඩ, රක්‍තතුණ්ඩයෙන්; දෙළුම්, දාඩිමඵලයන්; පලතෙත්, විදාරණයකිරීමෙන්; වගල, වැගුරුණාවූ; බිජුරැස්, බීජරාශිය; ගණකල්නොමපතවූවද, වර්‍ෂාකාලය අසම්ප්‍රාප්තවූවත්; මිහිපිටුවතළ, පොළෝතෙලෙහිපතළාවූ; පැහැපත, ප්‍රභාප්‍රාප්තවූ; රතිඳුගොව්සිරි, ඉන්ද්‍රගොපකශ්‍රීය; ගෙණඇර, ග්‍රහණයකොට; පලකළ, ප්‍රකාශකෙළේය.

133 ලම ග සබරකිණිහිරි කිහිරි මා නු ග
වෙළුග ඩෙබරපරසොරතුවර බූ නු ග
පත ග පඬරකළුහරඅරණ රැ ර ග
සිත ග මිතුරමහතුරුවග දෙපස ම ග

දෙපස, (මාගීයාගේ)උභයතීරයෙහි; ලමග, කුරුඳුය: සබර, ලොජ්‍ය; කිණිහිරි, කර්ණිකාරවෘක්‍ෂය; කිහිරි, ඛදිරවෘක්‍ෂය; මානුග, මහානිග්‍රෝධය; වෙළුග, වෙළුංගස්ය; ඩෙබර, බදරිවෘක්‍ෂය; පර, පරහස්ය; සොර, සරලවෘක්‍ෂය; තුවර, තුවරවෘක්‍ෂය; බූනුග, ඵනම්වෘක්‍ෂය; පතග, පෙතංවෘක්‍ෂය; පඬර, පඬරවෘක්‍ෂය; කළුහර, කළුවරය; අරණ, අරන්ගස්ය; රැරග, ඖෂධිවෘක්‍ෂය යනු; මහතුරුවග, මහාවෘක්‍ෂවර්ගයා; සීතග, සීත්සේ; මිතුර, මිත්‍රය; මග, අවලෙඃකනය කරව.

134 ඇටඹ පත ඹ මී අ ඹ දෙඹ ගිරා අ ඹ
සැලඹ කොලඹ බටදෙඹ ගිවුළු මා ද ඹ
කරඹ කි ර ඹ ඇට රඹ නිබ පේර ද ඹ
නරඹ ක ල ඹ යුත්පලලඹ එවනා ගැ බ

ඇටඹ, ඇටඹගස්ය; පතඹ, මහඅඹගස්ය; මීඅඹ, ඝහාකාරය; දෙඹ, ජූනනාගය; ගිරාඅඹ, ගිරාඅඹග

ක්ෂය; සැලඹ, සැලඹය; කොලඹ, කොලඅඹය; බටදෙ
ඹ, බටදෙඹය; ගිවුලු, ජීවුල්ය; මාදඹ, මාදම්ය; කා
රඹ, කරඹය; කිරඹ, කිරිඅඹය; ඇටරඹ, ඇටිකො
හොල්ය; නිඹ, කොසඹය; ජේර, ජේරය; දඹ, ජම්බුය;
(යනවෘක්ෂඇත්තාවූ); කලඹයුත්, කාලාභ්‍රයක්බඳුවූ;
පලලඹ, ලම්බමානඑලාඑලඇති; එවනගැබ, ඒවන
ගර්භය; නරඹ, බලව.

135 මිණිමුතුමල්පබළු යුතුසල් පිල්දෙර ළ
මහවිදිතුරු දදලියතුරු රුව් වත ල
සිදුවරවරණ මිහිපා රදලිය ලකා ල
වනපුරවර සිරිසර නරඹ තඹසි ළු

මිණිමුතු, ප්‍රබුද්ධවූ; මල්, පුෂ්පය; පබළු, අභිනවප
ල්ලවය (යනමෙයින්); යුතු, යුක්තවූ; සල්, ශාලවෘ
ක්ෂය; පිල්, පීලුවෘක්ෂය; දෙරල, දෙරොල්ලවෘක්ෂය
(යනමොවුන්ඇත්තාවූ)නොහොත්; මිණිමුතු, මණි
මුක්තාය; මල්, කුසුම(දාමය); පබළු, ප්‍රවාලය(යනමෙ
යින්)යුතු, යුක්තවූ; දෙරළ, වාරයව්වෘතකළාවූ; සල්
පිල්, ආපනශාලාඇත්තාවූ; මහවිදි, විශාලවවිස්තීර්ණ
වූ; තුරු, වෘක්ෂහු; දද, පක්ෂීද; ලිය, ලතාද; වතළ,
පැතුරුණාවූ; තුරුරුව්, (නාලබටආදී) වෘක්ෂරාවඇත්
තාවූ නොහොත්; මහවිදිතුරු, මහත්වීථිඅභ්‍යන්තර
යෙහි; දද, ධ්වජඇත්තාවූ; ලිය, ස්ත්‍රීන්ඇත්තාවූ; තූ
රුරුව්, තූර්යනාදය; වතළ, පතළාවූ; සිදුවර, සිද්ධ
චාරවෘක්ෂහු; වරණ, වරුණවෘක්ෂඇත්තාවූ; මිහිපා,
භාඩගයන්ඇත්තාවූ; ලකළ, අලඬකෘතවූ; රදලිය, ර
දලියවැල්ඇත්තාවූ නොහොත්, සිදුවර, සෛන්ධව
ශ්‍රෙෂ්ඨයන්හා; වරණ, හස්තීන්ද; මිහිපා, පෘථිවිපාල
යෝද; ලකළ, (ආභරණයෙන්) සමලඬකෘතවූ; රදලිය,
රාජාඞ්ගනාවන්ද(ඇත්තාවූ); වනපුරවරසිරිසර, වන
නමැතිනගරයගේ ශ්‍රීසාරය; තඹසිළ, තාම්‍රචූඩාධා
රිය; හෙවත් කුක්කුටය; නරඹ, අවලොකණය කරව.

136 සි සිල් සොඳුරුගංහෝ ඇලකඳුරපෑ නා
ගහුල් හැලිසෙමෙරනලවිඳ දැහැගිම නා
විසල් ගල්තලාසිහසනෙහි හිඳිමි නා
විපුල් රජසිරින් ගොස්එවන ගෙවමි නා

සිහිල්, ශීතලවූ; සොඳුරු, සුන්දරවූ; ගං, ගඞ්ගාය; හෝ, හොයවල්ය; ඇල, ඇලය; කඳුරු, කන්දරය (යනමේජලස්ථානයන්); පෑනා, උල්ලඞ්ඝනයකොට; ගහුල්හැලිසෙමරනල, ගඞ්ගානිර්ඣරනමැති චාම රමාරුතය; විඳ, ලබා; ගිමනා, ග්‍රීෂ්මය; දැහැ, පහ කොට; විසල්, විශාලවූ; ගල්තලාසිහසනෙහි, ශෛල තලනමැතිසිංහාසනයෙහි; හිඳිමිනා, නිසීදනයකොට; විපුල්, මහත්වූ; රජසිරින්, රාජ්‍යශ්‍රියෙන්; ගොස්, ගමනායකොට; එවන, ඒ වනය; ගෙවමිනා, අතික්‍රා න්තකොට.

137 රිවි රුස් මැඩ දිසිගණිඳුරු යුත්සොබ නා
තුඟු ගස් උඩ පැනපැනයන සාමුව නා
දැකතොස් වඩවමින්සැතපී ඉඳගෙයෙහ නා
යවකොස් ගොඩ පසුකරමින් යහඳස නා

රිවිරුස්මැඩ, සූර්‍ය්‍යරශ්මියමර්දනයකොට; දිසි, දෘශ්‍ය මානවූ; සොබනා, ශොභනවූ; ගණිඳුරුයුත්, සඝණාන්ධ කාරයෙන්යුක්තවූ; තුඟු උස්වූ; ගස්උඩ, වෘක්ෂම ස්තකයෙහි; පැනපැනා, පනිමින්; යනා, යන්නාවූ; සා මුවනා, ශාඛාමෘගයන්; දැක, අවලොකනය කොට; තොස්වඩවමින්, සන්තුෂ්ටියවර්ධනයකොට; යෙහෙ නා, යහපත්සේ; සැතපීඉඳ, සන්තර්පිතවසිට; කො ස්ගොඩ, මෙනම්ග්‍රාමය; පසුකරමින්, ඉක්මවා; යහ දසනා, ප්‍රියදැකුම්ඇතිමිත්‍රය; යව, ගමනයකරව.

138 අනුනත් තේ සිලිලෙව් පැහැති සුනිම ල
දියමත් තේ ඉපිලිපිලී පැපෑ ඇ ල
එකරොත් තේ එනමින්කැලදැකනුමු ල
බෙලිඅත් තේ වලපසුකර යව සැවු ල

අනූතත්තේසිලිල්එව්, අනොතත්තතඩාගයෙහි ජලයමෙන්; සුනිමල, ඉතානිර්මලවූ; පැහැති, වර්ණ ඇත්තාවූ; දියමත්තේ, ජලයමත්තෙහි; ඇල පැපෑ ඇලයදක්වා; ඉපිලිපිලී, ඉල්පෙමින්; එකරොත්තේ, එකටරැලගැසී; එන, එන්නාවූ; තුමුල, මහත්වූ; මින්කැල, මත්ස්‍යසමූහයා; දක, අවලොකනයකොට; බෙලිඅත්තේවලපසුකර, බෙලිඅත්තේවලඉක්මවා; සැවිල, තුකකුටය; යව, ප්‍රයාණය කරව.

139 දිලෙනා මගදෙපස තුඟුතුල් ගිරිම ත් ත
රඟ නා මොනරගනවිදගා පිල්සැ ත් ත
ස පු නා තුරුපෙලැති පිපිකුසුමෙන්යු ත් ත
ද කි නා මැනවිපෙරමග බමුණව ත් ත

මගදෙපස, මාර්ගයෙහිඋභයපාර්ශ්වයේ; දිලෙනා,බබලන්නාවූ; තුඟු, උස්වූ; තුල්, මහත්වූ; ගිරිමත්ත, පර්වතමස්තකයෙහි; පිල්සැත්ත, පිල්ජත්‍රය; විදහා, දිගහැරගණ; මොනරගන,මයූරසමූහයා; රඟනා, නෘත්‍යයකරන්නාවූ; පිපි, සුපිෂ්පිතවූ; කුසුමෙන්යුත්ත, පුෂ්පයෙන්යුක්තවූ;සපු, චම්පකය; නා, නාගය සන; තුරුපෙලැති,වෘක්ෂපඞ්ක්තිඇත්තාවූ; බමුණවත්ත, එනම්ස්ථානය; පෙරමග, පූර්වපථයෙහි; දකිනා මැනවි, බලනුයෙගෙනි.

140 දිගුතර නිල් වරලගවසා කුසුම් ක ඩ
දියතුරු පසිඳු යුදජයගෙණ කුසුම් ක ඩ
තුනුසිර ලියන් රඳනාසුරඹ මත් මැ ඩ
මිම් තුර වඩින් පසුකරමින් ගණේ ගො ඩ

දිගුතර, අතිශයින්දීඝවූ; නිල්වරල්, නීලවර්ණකෙශකලාපයෙහි; කුසුම්කඩ, පුෂ්පයන්කඩා; ගවසා, සමන්විතකොට, දියතුර, ලොකයතුළෙහි; කුසුම්කඩයුදජයගෙණ, කාමයුඩයෙන්දිනා;පසිඳු,ප්‍රසිඩවූ; සුරඹ, දිව්‍යස්ත්‍රීන්ගේ; මත්, මානයන්; තුනුසිර,ශරී

රශ්මීන්; මැඩ, මර්දනයකොට; ලියන්, ස්ත්‍රීන්; රඳනා, වසන්නාවූ; ගණේගොඩ, මෙනම්ග්‍රාමය; පසුකරමින්, ඉක්මවා; මම්තුර, මාගේමිත්‍රය; වඩින්, ප්‍රයාණයකර.

141 පවර අමර පුරසර වන් රුසිරු ස ර
සමර සමර දිනුවර ගන රැඳිනිතො ර
පැතිර ඉතිර තිරපිරි සිරිනි නොවිත ර
පතර සපර ගමුපුර වර වදුමිතු ර

පවර, උතුම්වූ; අමරපුරසරවන්, දිව්‍යස්ත්‍රීන්මෙන්; රුසිරුසර, රූපශ්‍රීයෙන්සාරවූ; සමරසමරදිනූ, කාම යුධයජයගත්; වරගන, උත්තමස්ත්‍රීන්; නිතොර, නිරන්තරයෙන්; රැඳී, වාසයකරන්නාවූ; පැතිර, විස්තෘතවූ; ඉතිර, අතිරික්තවූ; තිර, ස්ථිරවූ; පිරි, පරිපූර්ණවූ; සිරිනි, සම්පත්තියෙන්; නොවිතර, ප්‍රමාණනොමැත්තාවූ; පතර, මහත්වූ; සපුරගමුපුරවර, සඵරග්‍රාමපුරප්‍රවරයට; මිතුර, මිත්‍රය; වදු, ප්‍රවිෂ්ටවෙව.

142 රගන රුසිරුනලගනවිදුකිඳු ලෙලෙ න
වයන නොයෙක් තුරුගුම්ගැඹුරු ගුම්දෙ න
දිලෙන මෙපුරවරඉඳුනිල් විමන් ග න
නිති න සතුටුකෙළෙගෙම්යුරු කැලන්ම න

රගන, නෘත්‍යකරන්නාවූ; රුසිරු, රූපශ්‍රීන්යුක්තවූ; නලගන; නාමිකාඞ්ගනාවන්නාමැති; විදුකිඳු, විදුලිකෙළිවලින්; ලෙලෙන, ලීලොපෙතවූ; වයන, වාදනයකරන්නාවූ, නොයෙක්තුරුගුම්, නානාවිධ තූර්‍ය්‍යඝොෂානාමැති; ගැඹුරුගුම්, ගම්භීරස්තගර්ජනාව; දෙන, ප්‍රදානයකරන්නාවූ; දිලෙන, දීප්තිමත්වූ; මෙ පුරවර, මේනගරවරයෙහි; ඉඳුනිල්විමන්ගණ, ඉන්ද්‍රනීලවිමානනාමැතිමෙඝයතෙමේ; නිතින, නිරන්තරයෙන්; ගෙම්යුරුකැලන්, ගෘහමයූර සමූහයාගේ; මන, චිත්තය; සතුටුකෙළෙ, සන්තුෂ්ටකෙළේය.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

143 ග ති නා කනා ලියරතදරිනි නා ලි ය
තෙනිනා ර නා හසගමනින් එනා ලි ය
නිති නා දි නා එහිසරනා මනා ලි ය
න ත නා වි නා වනිකවරෙක් වණ ලි ය

ගතිනා, ශරීරයෙන්; කනාලිය, සුවර්ණලතාවන්ද; රතඅදරිනි, රක්තාධරයෙන්; නාලිය, නාගපල්ලව යන්ද; තෙනිනා, පයොධරයෙන්; රණහස, ස්වර්ණ හංසයන්ද; ගමනින්, යාත්‍රාවෙන්; එනාලිය, හංසී නීන්ද; නිතිනා, නිරන්තරයෙන්; දිනා, පරයා; එහි සරණ, එහිහැසිරෙන්නාවූ; මනාලිය, යහපත්ස්ත්‍රීන්; නතනාවිනා, අනන්‍යාහැර; කවරෙක්, කවරකෙ ණෙක්; වණලිය, වර්ණනාකොටලියහැකිවෙත්ද?.

144 සොබන දිවසරන්මෙන් රුවැති මනන ද
සිටි න දෙපසවරඟනනෙත් කැලුම් ක ද
යනෙන වේමැදෙහි සලෙලුන්ගේ ලොබබැ ද
අ දි න සුනිල්දිගුරුගැණෙක විලස් ල ද

මනනද, මනොනන්‍දනවූ; සොබන, ශොභාමාන වූ; දිවසරන්මෙන්, දිව්‍යස්ත්‍රීන්මෙන්; රුවැති, රූප ශ්‍රීඇත්තාවූ; දෙපස,(වීථියේ) උභයපාර්ශ්වයෙහි; සිටි නා, සිටින්නාවූ; වරඟන, උත්තමස්ත්‍රීන්ගේ; නෙත් කැලුම්කද, නෙත්‍රකාන්තිස්කන්ධය; වේමැදහි, වීථිම ධ්‍යයෙහි; යනෙන, ගමනාගමනය කරන්නාවූ; ස ලෙලුන්ගේ. සල්ලාලයන්ගේ; ලොබ, ලොභය; බැ ඳ, බන්ධනයකොට; අදින, ආකර්ෂණයකරන්නාවූ; සු නිල්, ඉතානිල්වූ; දිගුරුගැණෙක, දීර්ඝරජ්ජුවක; විල ස්, ආකාරය; ලද, ලද්දේය.

145 අ ද ර කරසරණනවදල දසන් කො ඳ
තඹ ර වදනකලහස ගමන මන න ඳ
පව ර රණබරණ දරඅමරසර බ ඳ
නාගර වරසරණවරඟන බල සබ ඳ

නවදල, බාලපල්ලවසදෘශවූ; අදරකරසරණ, අධරඝාතපාදයන් ඇත්තාවූ; කොඳ, කෞමදවැනිවූ; දසන්, දන්තඇත්තාවූ; තඹර, පදුමබඳුවූ; වදන, මුඛඇත්තාවූ; කලහස, කාලහංසයන්බඳු; ගමන, ගමන්ඇත්තාවූ; මනනද, මනොනන්දනවූ; පවර, උතුම්වූ; රණබරණදර, ස්වර්ණාභරණදරන්නාවූ; අමර සරබඳ, දිව්‍යස්ත්‍රීන්සදෘශවූ; නාගරවර, උත්තමනගරයෙහි; සරණ, හැසිරෙන්නාවූ; වරඟන, උත්තම ස්ත්‍රීන්; සබඳ, මිත්‍රය; බල, අවලොකනයකරව.

146 මන කල් සමන්සුරිඳුගෙපසිඳු තෙදී ය ත
තුනුනිල් කැළුම්පතළාසේ දසදිග ත
පුර කල් බඳුන්නෙත්කැන් තිඳුසේ අන ත
ඉඳු නිල් මිණිතොරණ රැස්පැතිරෙයි දිග ත

තෙදියත, තුන්ලොවෙහි; පසිඳු, ප්‍රසිඬවූ; මනකල්, සිත්කලුවූ; සමන්සුරිඳුගේ, සුමනදිව්‍යරාජයාගේ; තුනු, ශරීරයේ; නිල්කැළුම්, නීලකාන්තිය; දසදිගත, දශදිශාවෙහි; පතළාසේ, පැතුරුණපරිද්දෙන්; පුරකල්බඳුන්, නගරවනිතාවන්ගේ; අනත, අප්‍රමාණවූ; නෙත්කැන් තිඳුසේ; නෙත්‍රකාන්තිකෙඳිමෙන් ද; දිගත, දිශාන්තයෙහි; ඉඳුනිල්මිණිතොරණ, ඉන්ද්‍රනීලමාණික්‍යතොරණයෙහි; රැස්, රශ්මිය; පැතිරෙයි, ව්‍යාප්තවෙයි.

147 ද නා රඳනයදියදිහට දෙවන ද නා
ද නා දිපපුරෙව් දිසිමෙපුර සිරි න නා
නනා සවනසිව්වන සරසවිය වි නා
වි නා කවරතිවියර ඇතිවිලස ව නා

යදි, යාචකකලාවූ; යදිහට, යාචකයන්ට; දනාදෙවන, වස්තුපරිත්‍යාගකරන්නාවූ; දනා, ජනයන්; රඳන, රඳන්නාවූ; දනාදිපපුරෙව්, වෛශ්‍රවණයාගේ පුරයබඳුවූ; දිසි, දෘශ්‍යමානවූ; මෙපුර, මේනගරයෙහි;

නානාසිරි, නානාප්‍රකාරශ්‍රීය; නනා, අනනයාය; ස චන, සනත්කුමාරයාය; සිව්වන, බ්‍රහ්මයාය; සරස විය, සරස්වතිය (යනමේදෙවියන්); විනා,හැර; කවි රකිවියර, කවරකාව්‍යකාරයෙක්; ඇතිවිලස, විදූමා නවිලාසයෑ වනා, වණ්නා කෙරේදැ?

148 ලකා ගන සමන් ගිරසිරසින් ගොනා ග ලී
මලි ගිය මලින් සැදිවරලසමෙන් උදු ලී
එනු වර මැදින් හුනුකලුයගපෙන විසු ලී
සතිසඳගොසින් බලසපුරාතමන දෙ ලී

ලකාගන, ලංකාඞ්ගනාවවිසින්; සමන්ගිර සිරසි න්, සමනනකූටපර්වතමස්තකයෙන්; ගොනා, ග්‍රන්ථි නායකොට; ලී, හැරියාවූ; උදුල, බබලන්නාවූ; ම ලිගියමලින්, මාලතිකුසුමයන්ගෙන්; සැදි, සජ්ජිත වූ; වරලසමෙන්, කෙශකලාපයබඳුවූ, පෙනවිපුල, විස්තෘතඵෙනඇත්තාවූ; එනුවරමැදින්හුනු, ඒනග රයමධ්‍යයෙන්පතිතවූ; කලුගග, කාලනදීය; සතිස ඳ, මිත්‍රත්තමය; තමනදෙළ, තාගේආශාව;සපුරා, සම්පූර්ණකොට; බල, නිරීක්ෂණය කරව.

149 වතල තරගබැමදියරොන ලුවෙන් යු ති
නැබල සළානැබතිල්සෙවෙල වරලැ ති
වෙරළ පුලිනතලහර සහ රඳන නි ති
ලකල එගගවරළමයගන සිරි ග ති

වතළ, විස්තෘතවූ; තරඟ, තරඞ්ගනමැති;බැම,භ්‍රෑ ඇත්තාවූ; දියරොන්, ජලරේණුනමැති; අලුවෙන්යු ති, හස්මයෙන්යුක්තවූ; නැබල, මහත්වූ; සළා, ජටා නමැති; නැබ, නාභියක්ඇත්තාවූ; තිල්සෙවෙල්, නීලශෛවාලනමැති; වරළැති, කෙශකලාපයක්ඇ ත්තාවූ; වෙරළ, මයඝිදෑයෙහි; පුලිනතල, වැලිතලා නමැති; හරසහ, ඊශ්වරයාසමඟ; නිති, නිරන්තර යෙන්;රඳන,රඳන්නාවූ; ලකල,අලඞ්කෘතවූ; එගඟ,

එනාදිය; වර, උතුම්වූ; උමයගනසිරිගති,උමාවගේ ශ්‍රියග්‍රහණය කෙළේය.

150 හිම වතිනා ගෙණමල්සුවඳ මුව ර ද
මද මදි නා එනනලපහස විඳ වි ද
තුනු ගිමනා දුහැසැනසී සිතු පැහැ ද
ගඟ සමනා බලමල්තුරු සිරෙක ඉ ද

හිමවතිනා, හිමාලයවනයෙන්; මල්සුවඳමුවරඳ, පුෂ්පගන්ධමකරන්දයන්; ගෙණ, ග්‍රහණයකොට; මඳ මදිනා, මඳින්මඳ; එනා, හමන්නාවූ; නලපහස, මාරුතස්පර්ශය; විඳවිඳ, ලබමින්; තුනුගිමනා, ශරීරශ්‍රමය; දුහැ, දුරුකොට; සැනසී, සන්සුන්ව; සිතුපැහැද, චිත්තප්‍රසන්නව; ගඟස, ගඟඅසල; මනා, මනොඥවූ; මල්තුරුසිරෙක, පුෂ්පවෘක්ෂමස්තකයෙක්හි; ඉඳ, සිටගෙන; බල, අවලොකනය කරව.

151 ම ල වු ල් කරබඳිමින් නිල් වර ළ ස
රතු නි ල් වත්ඇඳවසමින් මැද දෙ ස
සිහි ලැ ල් ගඟපැනරණ විදුලිය ලෙ ස
බලලොල් කරඅයකෙළිනා මියු ලැ ස

නිල්වරළස, නීලධම්මිල්ලය; මලවුල්කරබඳිමින්, මල්ගවසාබැඳ; මැදදෙස, මධ්‍යප්‍රදෙශය; වසමින්, ඡාදනයකොට; රතුනිල්වත්ඇඳ, රක්තනීලවස්ත්‍රහැඳගෙන; රණවිදුලියලෙස, ස්වර්ණවිද්‍යුල්ලතාමෙන්; සිහිලැල්ගඟ, ශීතලභාවය ඇලවනගඟාජලයට; පැනා, අවතීර්ණව; ලොල්කර, (චිත්ත) ලොභකොට; දියකෙළිනා, ජලක්‍රීඩාකරන්නාවූ; මියුලැස, මෘගාක්ෂීන් හෙවත් මුවදෙනුන්ගේ ඇස්වැනි ඇස්ඇතිස්ත්‍රීන්; බල, අවලොකනය කරව.

152 වත් සඳදියකෙළියට පූරවරඟ නා
රත් හසගඟහැරගියරඟ කෙළෙසි නා
උන් පියයුරුසරිනොව තදවිළියෙ නා
රන් ගැබසෙව්වැනිමුතුදින වනමෙ නා

පූරවරඟනා, පුරයෙහිඋත්තමස්ත්‍රීන්; දියකෙළිය ට, ජලක්‍රීඩාවට; වත්සඳ, පැමිනිකාලයෙහි; රත්හ ස, ස්වර්ණහංසයන්; ගඟහැර, නදියපහකොට; ගිය රඟ, ගියආකාරය; කෙළෙසින, කෙසෙදයත්; උන්, ඒ ස්ත්‍රීන්ගේ; පියයුරු, පයොධරයන්ට; සරිනොව, සමානනොවනහෙයින්; තදවිළියෙන, තදලජ්ජා වෙන්; මතු අනාගතකාලයෙහි; දිනවනමෙන, දි නවනපිණිස; රන්ගැබ, මහාබ්‍රහ්මයා; සෙව්වැනි, සෙවනයනිරීමටගියාවැනි විය.

153 රත් තුඹුපදපබලකුරෙව් වොරැදි නා
සිත් හසගඟපැලඹෙන රඟ කෙළෙසි නා
ගත් ගඟගනකෙළිනටසඟ පූරඟ නා
රත් මිණිබන්කලදෙදිය වත් මෙ නා

පබලකුරෙව්, ප්‍රවාලාඞ්කූරමෙන්; වොරැදින, විරාජමානවූ; රත්තුඹුපද, රක්තතුණ්ඩපාදයන් ඇත්තාවූ; සිත්හස, ශ්වෙතහංසයන්; ගඟ, නදියෙහි; පැලඹෙනරඟ, ප්‍රලම්බමානආකාරය; කෙළෙසින, කෙසේදයත්; ගඟගන, ගඞ්ගානම්ඇති ස්ත්‍රියවිසින්; පූරගනසඟ, පූරාඞ්ගනාවන්සමග; කෙළිනට, ක්‍රීඩාකරණපිණිස; ගත්, ග්‍රහණයකළාවූ; රත්මිණිබන්, රත්නමාණික්‍යබන්ධනයකළාවූ; කලදෙදියවත්මෙන කලධෞතජලභාජන සමානයි.

154 ව ර සූ ර ඹා තුනු රුසිරෙන් පසු ඹා
පූ ර පි ය ඹා දුදුදනමන පොළ ඹා
සි ප් ල දෙඹා කෙළරඟ පෑසසො ඹා
මෙනගණඹා ලෙලවිදුලිය කල ඹා

තුනුරු සිරෙන්,ශරීරශ්‍රීයෙන්; වරසුරඹා, උත්තමවූ දිව්‍යාඞ්ගනාවන්; පසුබා, පසුකොට; සිඹිලදෙඹාකොළ, ජලයටඅවතීර්ණව ක්‍රීඩාකොට; සගොසාබා, ශොභාසහිතව; රඟපෑ, නෘත්‍යදැක්වූ; දුටුදනමනපොළඹා, දර්ශනයකළජනයන්ගේසිත්සතුටුකරණ; පුරපියඹා, නාගරයෙහි ප්‍රියස්ත්‍රීයෝ; ලෙළු, ලීලොපෙතවූ; විදුලියකළඹා, විද්‍යුල්ලතාකළාපඇති; ගණඹාමෙන, මේඝසමානයි.

155 සි සි ව ත් තුඟුබැමනිල්නෙත් පිරිත න
යුතු කත් උඩකුරුවෙමිනි කෙළිනුයෙ න
සි ය ප ත් බිඟුදැල්නිලුපුල් තිස රු න
නැතිවත් ඇතිමෙන්වියගඟ හැමතැ න

සිසිවත්; චන්ද්‍රයාබඳුමුඛද; තුඟුබැම, උස්වූබැමද; නිල්නෙත්, නීලවර්ණනෙත්‍රද; පිරිතන, පරිපූර්ණපයොධරද (යනමේඅවයවවලින්); යුතුකත්, යුක්තවූ ස්ත්‍රීන්; උඩුකුරුවෙමින්, උත්තානවෙමින්; කෙළිනුයෙන, ක්‍රීඩාකරණහෙයින්; සියපත්, ශතපත්‍රය; බිඟුදැල්, භෘඞ්ගජාලාව; නිල්පුල්, නීලොත්පලය; තිසරුණ, හංසය (යනමොවුන්): නැතිවත්, අවිද්‍යමානවූවත්; ගඟ,ගඞ්ගාවෙහි; හැමතැන, සකලස්ථානයෙහි; ඇතිමෙන්විය, විද්‍යමානවූවාක්මෙන් විය.

156 මනංපිනවනවරඟන උරබිත වැ ද
ගෙණ දළදරමුදුනෙන් සිව්තහසෙ ද
ගෙණ සිව්තුඩගින්සියපත කුරු ඇ ඳ
ර ණ හසතියලියසිරිසර පෑහැ න ද

මනප්නවන, සිත්ප්‍රියකරණ; වරඟන, උත්තමස්ත්‍රීන්ගේ; උරබිතවැද, වක්ෂස්ථලයනමැති භිත්තියෙහිසටහනාව; සෙද, ශීඝ්‍රව; මුදුනෙන්, මස්තකයෙන්; දළදර, ජලධාරාව; ගෙණ,ග්‍රහණයකොට; සිව්

පැවති; තන, පයොධර; තුඩගින්, තුණ්ඩාග්‍රයෙන්;
සියපතකුරුඇදගෙණ, ශතපත්‍රාඞ්කුරයන්ආකර්ෂණ
යකරගෙන; සිටි, සිටියාවූ; පැහැනද, ප්‍රභාවෙන්නි
සුතවූ; රණහසසිරිසර, සුවර්ණහංසයන්ගේශ්‍රීසාරය;
තියලිය, ප්‍රකාශකෙළේය.

157 අ ග නන් වතයසිහැඟපුල් පියු ම ද
පි පි ර න් පියුමැසිහැගලද උව න් ද
බිඟු කැන් සහඑහිකෙළිනා සලෙලු ද
සැකයෙන් විමසාබලතිවෙමින් නා ද

පුල්පියුම, ප්‍රඵුල්ලපද්මය; අඟනන් වතයසිහැගද, ස්ත්‍රීන්ගේමුඛනයසිසිතාද; ලදඋවන, ස්ත්‍රීන්ගේමුඛනා; පිපිරන්පියුමැසි, සුපිෂ්පිතසුවර්ණපද්මයසි; හැගද, තකීණයකොටද, බිඟුකැන්සහ, භෘඞ්ගසමූහයාහා; එහි, ඒ නදියෙහි; කෙළිනා, ක්‍රීඩාකරණ; සලෙලුද, සලොලයෝද; නදවෙමින්, සනතුෂ්ටව; සැකයෙන්, ශඞ්කාවෙන්; විමසාබලති, පරීක්ෂාකොට බලත්ය.

158 දුල පියයුරුසරිවනරණ කු ම් බා
පළ හෙලවැලිළුකුලැති එනින ම් බා
අල ලනකිරිසිඳුහිමි පියු ම ම් බා
පළ කලොපත්සිරිසර කම ල ම් බා

රණකුම්බාසරිවන, සුවර්ණමයඝටසදෘශවූ; දුලපියයුරු, බබලනපයොධරඇත්තාවූ; පළ, ව්‍යක්තවූ; හෙල, ධවලවූ; වැලි, වැලිතලාවැතිවූ; උකුලැති, ශ්‍රොණිප්‍රදෙශඇත්තාවූ; එන්නම්බා, ඒස්ත්‍රීයෝ: පියුමම්බාහිමි, විෂ්ණුදිව්‍යරාජයා; කිරිසිඳු, ක්ෂීරාර්ණවය; අලලන, ආලොලනයකකල්හි: පත්, ප්‍රාප්තවූ: කමලම්බාසිරිසර, පද්මාවතියගේශ්‍රීසාරය; පළකලො; ප්‍රකාශකළෝය.

159 බිඟු කැන් දිඟුබැමසියපත් වතී නා
ගහ ස පුන් පියපුරුරතුපුල් ලව නා
සොබමන් ගඟගතකොඳමද හසී නා
සතොසින් තොපබලනෙව් මීන්නෙතී නා

බිඟුකැන්, භෘඞ්ගශ්‍රෙණිනමැති; දිඟුබැම; දීඝීභ්‍රෑ (යුගම) ඇත්තාවූ; සියපත්වතීනා, ශතපත්‍රනමැ තිමුඛයෙන්යුක්තවූ; හස, හංසයන්නමැති; පුන්පිය පුරු,පීනපයොධරඇත්තාවූ;රතුපුල්ලවනා,රක්තො ත්පලනමැති අධරඇත්තාවූ; සොබමන්, ශොභා මානවූ; ගඟගත, නදියනමැතීඝත්‍රිය; කොඳ, කො මදනමැති; මදහසිනා, මන්දස්මිතයෙන් යුක්තව; මී න්නෙතිනා, මත්‍ස්‍යයන්නමැතිනෙත්‍රයෙන්; සතො සින්, සන්තුෂ්ටියෙන්;තොපබලනෙව්, යුෂමතුන්අව ලොකනය කරන්නාක්මෙනි.

160 පැ න පැනදියතුළකොමලඟ උනු නු නා
ගෙණ ඉසිදලදරඋරබින ගැසෙ මි නා
න න සිලගින්නික්මුණුරඟ කෙලෙ සි නා
හෙන හැලිසිර්කියළියගිර් මුදුනෙ නා

කොමලඟ, කොමලාඞ්ගීන්විසින්;දියතුළ,ජලයා භ්‍යන්තරයට; පැනපැන, පනිමින්; උනුනුන, ඔවු නොවුන්ට; ගෙණ, ග්‍රහණයකොට; ඉසි, සිඤ්චනය කළාවූ; දලදර, ජලධාරාව; උරබින, (ඔවුන්ගේ) උ රභිත්තියෙහි; ගැසෙමින, ඝට්ටනයවීමෙන්; තනසි ලගින්, පයොධරශිඛරාග්‍රයෙන්; නික්මුණුරඟ, නිෂ් ක්‍රාන්තවූආකාරය; කෙලෙසින, කෙසේදයත්; ගිරි මුදුනෙන, පර්වතශිඛරයෙන්; හෙන, පතිතවන්නා වූ; හැලිසිරි, නිර්ඣරවිලාසය; කියලිය, ප්‍රකාශකො ළේය.

161 මුදුනෙන් හළමුහුලසසැඬපත රි        නා
පැහැසන් කලදෙසිලිලග පැතිරෙ        නා
සොබමන් එපුරඟනෝ ගඟබසිමි        නා
මනමෙන් දියකෙළියෝ හරසිරි ගෙ        නා

මුදුනෙන්, මස්තකයෙන්; හළ, හෙලුවාවූ; මුහුලස, කේශකලාපනම්වූ; සැඬපතරිනා, සැඬපලුඇත්තාවූ; පැහැසන්, ප්‍රභායෙන්සඤ්ඤාතනාවූ; කලදෙසිලිල, කලඹෝන මෙන් ශුභ්‍රවර්ණවූජලය; ඇඟපැතිරෙණ, ශරීරයේපැතිරෙන්නාවූ; සොබමන්, ශෝභාමානවූ; එපුරඅඟනෝ, ඒ පුරයෙහිස්ත්‍රීහු; ගඟ, ගඞ්ගාවට; බසිමින, අවතීර්ණව; හරසිරිගෙණ, ඊශ්වරයාගේ ශෝභාවහැරගෙන; මනමෙන්, සිත්සේ; දියකෙළියෝ, ජලක්‍රීඩාකළෝය.

162 මුතුපල වන්පළහෙලවැලිතල පි        ට
කෙළකෙළ උන්කොමලඟනන් දුටුවි        ට
කිරිමුහුදින් පහළුවදිසිමන තු        ට
පබලකුරන්යයි සැලකේ න සිත        ට

පළ, ව්‍යක්තවූ; හෙළ, ධවලවූ; මුතුපලවන්, මුක්තාඵලබඳුවූ; වැලිතලපිට, වැලිතලාමස්තකයෙහි; කෙළකෙළඋන්, ක්‍රීඩාකරමින්සිටියාවූ; කොමලඟනන්, කොමලාඞ්ගනාවන්; දුටුවිට, දර්ශනයකළකාලයෙහි; කිරිමුහුදින්, ක්ෂීරාර්ණවයෙන්; පහළුව, ප්‍රාදුර්භූතව; දිසි, දෘශ්‍යමානවූ; මනතුට, චිත්තසන්තුෂ්ටිය (උපුලන්නාවූ); පබලකුරන්යයි, ප්‍රවාලාඞ්කුරයයි; නසිතට, නොපගේචිත්තයට; සැලකේ, වැටහේයි.

163 උවනින් පුන්සඳරතදර නා        ලිය
නුවනින් නිලුපුල්ගතිනික නා        ලිය
මනමෙන් දියකෙළිවිලස මනා        ලිය
උවිදුන් මිසවෙනකවුරු වණ        ලිය

උවතින්, වක්ත්‍රයෙන්; පුන්සඳ, පූර්ණචන්ද්‍රයා බඳුවූ; රතදර, රක්තාධරයෙන්; නාලිය, තාඃ අලුවැනිවූ; නුවතින්, නේත්‍රයෙන්; නිලුපුල්, නීලොත්පලවැනිවූ; ගතිනි, ශරීරයෙන්; කතාලිය, ස්වර්ණලතාවැනිවූ; මනාලිය, මනාස්ත්‍රීන්; මනමෙන්, යථාභිලාසයෙන්; දියකෙළිවිලස, ජලක්‍රීඩාකළආකාරය; උවිඳුන්මිස, ශක්‍රයාහැර; වෙනකවුරු, අන්‍යකවරෙක්; වණලිය, වර්ණනාකොට ලියහෙන්ද ? .

164 රුසි රෙන් පසුකරසුරඹලෙ දේ යා
සත මන් තුටුකරවමිනි ත දේ යා
සොබ මන් එපුරගතන් පැහැ දෙ යා
මෙලෙසින් දියකෙළනිමුණු ස දේ යා

සුරඹලෙදේයා, දිව්‍යාඞ්ගනාවන්ගේආකාරය: රුසිරෙන්, රූපශ්‍රීයෙන්; පසුකර, පරයා; තදේයා, තරයේ: සතමන්, සත්වයන්ගේසිත්; තුටුකරවමිනි, සතුටුකරවමින්; සොබමන්, ශොභාමානවූ; එපුරගතන්, එපුරස්ත්‍රීන්; පැහැදේයා, ප්‍රසන්නව; මෙලෙසින්, උක්තප්‍රකාරයෙන්; දියකෙළ, ජලක්‍රීඩාවකොට; නිමුණුසදේයා, සැනසුනු කල්හි.

165 කපුරුසඳුන් වෙනනවපලු තනව මි නා
පරපුටු සන් සඟබිඟුනදද හැර ගෙ නා
හමුනපවන් විඳපහකර තුනු ගිම නා
මිතුර වඩින් එහිවෙහෙරට පළමු වෙ නා

කපුරුසඳුන්වෙන, කර්පූරචන්දනවනයෙහි; නවපලු, අභිනවපල්ලවයන්; තනවමින, කම්පාකරමින්; පරපුටුසන්සඟ, කොකිලනාදසමග; බිඟුනදද, භෘඞ්ගනාදයද; හැරගෙන, ග්‍රහණයකොට, හමන, හමන්නාවූ; පවන්, මාරුතය; විඳ, ලබා, තුනුගිමන, ශරීරග්‍රීෂ්මය; පහකර, දුරුකොට; මිතුර, මිත්‍රය; එහි, ඒ ස්ථානයෙහි; වෙහෙරට, විහාරයට; පළමුවෙන, ප්‍රථමකොට; වඩින්, ප්‍රයාණය කරව.

166 ඝොරසප් දරණවැඩඉඳදම් දෙසූතොම් නා
දියබප් මුනිරජුගෙදතුඳ කරනාද නා
කිසි ලප් නොවකරවූ මහපිණැතිද නා
දහ ගැප් හිමිනමඳු මමිතුරතමන පි නා

ඝොරසප්දරණවැඩඉඳ, ඝොරවූනාගදරණයෙහි වැඩසිට; තොම්නා, බොහෝ; දම්දෙසූ, ධර්මදෙශනාකළාවූ; දියබප්මුනිරජුගෙ, ජගත්ස්වාමිවූ සර්වඥරාජයාන්වහන්සේගේ; දතුඳ ධාතූන්; නදනාකර, නිධානකොට; මහප්ණැතිදනා, මහත්පුණ්‍යවත්බෝධසත්වයන්විසින්; කිසිලප්නොව, කිසිකලඞ්කයක්නොමැතිසේ; කරවූ, කෙරෙව්වාවූ; දහගැප්හිමි, ධාතුගර්භස්වාමීන්; මමිතුර, මාගේමිත්‍රය; තමනපිනා, තාගේ චිත්තයපිණවා; නමඳු, නමස්කාරකරව.

167 සිදුහත් ගැබෙහිසිව්ඉරියව්ව හැකි ව නා
දෙළසත් බුදුබදින්යුතුඅප දියනාද නා
වැදහොත් විලසදකුණැලයෙන් පළකර නා
වඳු ඔත් පිළිමහිමිහට මිතුර අදරී නා

සිදුහත්ගැබෙහි, සිද්ධාර්ථබිම්බගර්භයතුළ; සිව්ඉරියව්ව, චතුර්විධඊර්‍යාපථය (පැවැත්වීමට); හැකිවනා, ශක්‍යවන්නාවූ; දෙළසත්බුදුබදින්යුතු, ද්වාදශහස්තබුද්ධශරීරයෙන්යුක්තවූ; අප, අපගේ; දියනාදනා, ජගන්නාථවූ සර්වඥරාජයා; දකුණුඇලයෙන්, දක්ෂිණාංශයෙන්; වැදහොත්විලස, ශයනයකළආකාරය; පළකරනා, ප්‍රකාශකරන්නාවූ; ඔත්පිළිමහිමිහට, ශයනාකාරප්‍රතිමාස්වාමීන්ට; මිතුර, මිත්‍රය; අදරිනා, භක්ත්‍යාදරයෙන්; වඳු, නමස්කාරකරව.

168 අඩ යව් ඛගපලගදුනුනත විදරමි නා
සැඩලෙව් මරුයුදමවන්සදෙහි සරොසි නා
මැඩ පැව් කරදිනුඅපසුගතිඳු සොබ නා
වැඩ සිව් පිළිමහිමිවඳු පිරිසිදුසිති නා

අඩයටි, අඩයටිනම්ආයුධයෙ; කඟ, ඛඩ්ගය: පලිඟී, පලිඝ: දුනු, දුනුය (යන); නානවි, නානායුධයන්; ද රම්නා, දරාගෙන; සැඩලෙට්මරු, චණ්ඩචිත්තඹය න්යුක්තමාරසෙනාව; ස්රොසින, කොපයෙන්; යුද වචන්සඳෙහි, යුඩයටපැමිනිකාලයෙහි; මැඩ, මඩීන් යකොට; පැටිකර, හතුළුවා නොහොත් අලපභාව යටපමුණුවා; දිනූ, ජයගත්තාවූ; අපසුගතිඳු, අපගේ සර්වඥයන්වහන්සේගේ; සොබන, ශොභන්තාවූ: වැඩ සිටිපලිමහිමි, වැඩසිටිපිළිමසවාමීන්ට: පිරිසිදුසිතින, පරිශුඬචිත්තයෙන්; වඳු, නමස්කාර කරව·

169 පැහැසර විදුලිරුඳිමහගණකුළුහර ණ
තරසර තිස්ලගණසාමඩුලෙන් දිලෙ න්
තුඟුතර දුමරදුටඑවෙහෙර තුරරඳ න්
මම් තුර නමඳුසගසිරිලබනුව බැති න

පැහැසර, ප්‍රභාවෙන්සාරවූ; විදුලිරුදි, විද්‍යුල්ලතා වෙන්යුක්තවූ; මහගණකුළුහරණ, මහාමෙඝකූටය ක්වැනිවූ; තරසර, සථිරසාරවූ: තිසල, පලලවඇති; ගණසාමඩුලෙන්, සාන්‍ද්‍රශාඛා මණ්ඩලයෙන්; දිලෙ න, ජවලිතවූ; තුඟුතර, දීර්ඝශාඛාඇත්තාවූ; එවෙහෙ රතුරරඳන, ඒ විහාරාභ්‍යන්තරයෙහිරඳන්නාවූ; දුම රදුට, බොධිද්‍රැමරාජයාහට; මම්තුර, භාග්‍යෙම්ත්‍රයෙ:ස ගසිරිලබනුව, ස්වර්ගසුඛ ලබනපිණිස; බැතින, භ ක්තියෙන්; නමඳු, නමස්කාරකරව.

170 එවෙහෙරසරසරණතිසරඩුරු ගුණිරඳ නා
සිව්පිරිසිදුසිල් සියසක්මෙත් රැති නා
සිවබඹවිහරණින් හැමවර දවසරි නා
දිව්නදතෙදින් ඝුත්ඝුගකොළුරිවිතිරණ මෙ නා
පැහැපත්පුන්සඳෙව්දිසිතරුපිරි වරි නා
පිළිවෙත්සරුසහඟනසමඟ වැජ බෙ නා

දී ඝ මි මහසයුරමොක්වෙරළින් සොබ න්
සි යු මි තුවන මෙරපහරින් අලල මි න්
නොහිම් මියුරුපදරුත් මිණි ලොවට දෙ න
ද හ මි ලකර යතිහිමිනමදු අද රි න

එවෙහෙර, ඒව්හාරනාමැතිසර, සරසියෙහි හෙවත් තටාකයෙහි; සරණ, සඤ්චාරණයකරන්නාවූ; තිසර යුරු, හංසයෙක්බඳුවූ; ගුණරඳනා, ගුණයෙන්යුක්තාවූ; සිව්පිරිසිදුසිල්, චතුපාරිශුද්ධිශීලය; සියසක්මෙන්, ස්වකීයචක්ෂුව නපරිද්දෙන්; රකිනා, රක්ෂාකරන්නාවූ; හැමවර, හැමකාලයෙහි සිව්බඹවිහරණින්, චතුර්බ්‍රහ්මවිහරණයෙන්; දවසරිනා, දවස්යවන්නාවූ; යුගකෙළ, කල්පාන්තයෙහි; රිවිකිරණමෙන, සූර්‍ය්‍ය රශ්මියබඳුවූ; දිව, (ලොකයෙහි) ධාවනයකළ; තද තෙදින්යුත්, ස්ථබ්ධතෙජොගුණයෙන්යුක්තවූ; තරු පිරිවරිනා, තාරකාපරිවාරයෙන්; දිසි, දෘශ්‍යමානවූ; පැහැපත්, ප්‍රභාප්‍රාප්තවූ; පුන්සදෙව්, පූර්ණචන්ද්‍රයාබඳුවූ; පිළිවෙත්සරු, ප්‍රතිපත්තියෙන්සාරවූ; සඟගණ සමග, සඞ්ඝසමූහයාකැටිව; වැජඹෙනා, විජෘම්භමාන වන්නාවූ; මොක්වෙරළින්සොබනා, නිර්වාණනාමැති වෙරළින්බබළන්නාවූ; දහම්මහසයුර, ධර්මනාමැති මහාසාගරය; සියුම්තුවන, තීක්ෂ්ණඥානනාමැති; මෙරපහරින්, මෙරුමථනයෙන්; අලලමිනා, ආලොලනයකරමින්; නොහිම්, අප්‍රමාණවූ; මියුරුපදරුත් මිණි, මධුරපදාර්ථනාමැතිමාණික්‍යයන්; ලොවට, ලොකයාට; දෙනා, ප්‍රදානයකරන්නාවූ; දහම්ලකරයති හිමි, ධර්මාලඞ්කාරනම්ස්ථවිර ස්වාමීන්නාන්සේ; අද රිනා, ආදරයෙන්; නමදු, නමස්කාරකරව.

171 ව දි මි න් මෙලෙසහැමතැන්බැති සිතින්නද
පු ර මි න් මෙනෙහිඑවැඳුම් ජලසිරි නොමඳ
වෙසෙසින් අනගිවත්සපිරුණු නැවක්ලෙ ද
ඒ න නි න් වඩුවදෙව්රජගෙට මිතුරු ස ද

නාද, මනොඥවූ; හැමතැන්, (වනුනියවූ) සකල ස්ථානයන්; මෙලෙස, මෙපරිද්දෙන්; බැතිසිතින්, භක්තිමත් චිත්තයෙන්; වදිමින්, නමස්කාරකොට; නොමද, අමනුවූ; ඒවැඳුම්පලසිරි, ඒනමස්කාරපුණ්‍යඵලසම්පත්තිය; මෙනෙහි, චිත්තයෙහි; පුරමින්, පූරවාගෙන; වෙසෙසින්, විශෙෂයෙන්; අනගිවුන්, අනර්ඝවස්තු: සප්රණු, සම්පූර්ණකළාවූ; නැවක්ලෙද, නෞකාවක්මෙන්; මිතුරුසඳ, මිත්‍රාත්මය; එතනින්, ඒ ස්ථානයෙන්; දෙව්රජගෙට, දෙවරාජමන්දිරයට; වඩුව, ප්‍රයාණය කරව.

172 පතගකුලකිරුළසුලකළ අගමිණෙකු ර ග
රුපුරජගජනෙඩිමැඩිකෙසරමෙන් දූ ඩී
සිරිරජසිහ රජුසිරිපදසෙවන වැ ඩී
සව්අවිසිප්සයුරරණගිරලෙස පමණ දු ටු
කාණ්ඩාපසගුරුසෙවිකුමෙන් යුතු පුව ල
බණ්ඩාරනායකතනතුරු ලත් තුමු ළු
සියකුලකමල විලසුලකළසෙ හස ර ඳ
සුනිමලනානම්බිකුරුප්පු මැතිඳු ස ඳ
එක්තිලකරණ ගරුහැමදෙන හා පබ ඳ
සිව්කලසබකිරණ ඔදකර තරිඳු ලෙ ඳ

පතගකුල, සූර්ය්‍යවංශයනමැති; කිරුළ, කිරීටය; සුලකළ, සවලඞ්කෘතකළාවූ; අගමිණෙකුරග, අග්‍ර (චූඩා) මාණික්‍යාකාරවූ; දූඩී, දුඪවූ; රුපුරජගජන්, ශත්‍රුරාජනමැති හස්තීන්ගේ; එඩිමැඩි, දර්පදීනය කළාවූ; කෙසරමෙන්, සිංහාකාරවූ; සිරි, ශ්‍රීමත්වූ; රජසිහරජු, රාජසිංහරාජයාගේ; සිරිපදසෙවනවැඩී, ශ්‍රීපාදච්ඡායාවෙහි වඩීනවූ; සව්අවිසිප්සයුර, සකල ආයුධශිල්පනමැති සාගරයේ; පමණ, ප්‍රමාණය: රණගිරලෙස, මෙරුවමෙන්: දුටු, දර්ශනයකළාවූ; පුවළු, ප්‍රෞඪවූ; විකුමෙන්; වික්‍රමයෙන්; යුතු, යුක්තවූ;

කණ්ඩාපසගුරුසෙ, විෂ්ණුසදෘශවූ; තුමුල, මහත්වූ; බණ්ඩාරනායකනානතුරු, බණ්ඩාරනායකනානාන්තරය; ලත්, ලැබූවාවූ; හසරදණෙ, හංසරාජයෙක්සේ; සුනිමල, ඉතානිර්මලවූ; සියකුල, ස්වකීයවංශයනමැති; කමලවිල, පද්මාකරය; සුලකල, සවලඛනෘතකලාවූ; නානාම්බිකුරුප්පුමැතිඳුසඳ, එනම් මහාත්‍රිනෙත්‍රාත්මයා; එති, ඒ දේවාලයේ; තිලකාරණ, තිලදරත්නාවූ; ගරු, ගරුවූ; පබඳ, ප්‍රසිද්ධවූ; හැමදෙනාහා, සියලුදෙනාසමග; සබකිරණ, සභානාමැතික්ෂීරාර්ණවය; තරිඳුලෙද, චන්ද්‍රයාමෙන්; ඔදකර, සන්තුෂ්ටකොට; සිටිකල, සිටිනාවූකාලයෙහි.

173 මිණිබන් අනගිඅබරණදරමින් රුව ට
සුර ඹුන් සිරින්සැරසීවිත් දෙපස සි ට
ගණ රන් තලිරිදුතලිගණිමින් අත ට
සිරී තින් ආවඩාලඳගණ නැවති වි ට

රුවට, ලක්ෂණලෙස; මිණිබන්, මාණික්‍යයන්බඳිනායකලාවූ; අනගිඅබරණ, අනර්ඝආභරණ; දරමින්, පැලඳගෙන; සුරඹුන්සිරින්, දෙවස්ත්‍රීන්ගේවිලාසයෙන්, සැරසීවිත්, විභූෂිතවඇවිත්; දෙපසසිට, උභයපාර්ශ්වයේසිටගෙන; අතට, හස්තයට; ගණරන්තලිරිදිතලි, ස්වර්ණරජතභාණ්ඩම්; ගණිමින්, ග්‍රහණයකොට; සිරිතින්, සිරිත්සේ; ලඳගන, තරුණස්ත්‍රීන්; ආවඩා, ශාන්තිකොට; නැවතිවිට, නිවෘත්තවූකල්හි.

174 මල වුල් කරවරල්දිගුනිල් වරල් බැ ඳ
නිලු පුල් සඳිසිනෙතරසඳුන් තනා ඇ ඳ
සු නිම ල් දුහුල්ඇඳනතඅබරණ පැල ඳ
බලලොල් සිනින්එහිරඟකරණ කල් බ ඳ

සරල්, රැලිසහිතවූ; දිගු, දීර්ඝවූ; වරල්, කෙශකලාපයන්; මලවුල්කර, මලින්අවුල්කොට; නිලුපුල්සදිසි, නීලොත්පලසදෘශවූ; නෙත, නෙත්‍රය; රසඳුන්

තතා, රසාඤ්ජනතා; ඇඳ, අඤ්ජනයකොට; සුනී මල්, අනිත්මිමලවූ; දුහුල්, වස්ත්‍රයන්; ඇඳ, නිවාසන යකොට; තත්අබරණ, නානාවිධආභරණයන්; පැළ ඳ, පිළන්ධනයකොට; එහි, ඒස්ථානයෙහි; රඟකරණ, නෘත්‍යයකරන්නාවූ; කල්බඳ, ස්ත්‍රීන්; ලොල්සිතින්, ආදරයෙන්; බල, අවලොකනයකරව·

175 බ ර ත සතෙහිපෙරඉසිවර තීලෙස ට
දෙනෙත යුගතදෙපයෙහි පමණ සරිකො ට
ස ම ත තාලමද්දලගියට එක් කො ට
දී මු ත නළඹරඟ දෙතිදිවනළ ලෙස ට

භරතසතෙහි, භාරතශාස්ත්‍රයෙහි; පෙරඉසිවර, පූර්වර්ෂීන්; තීලෙසට, තිපරිද්දෙන්; දෙනෙත, උභය නෙත්‍රය; යුගත, යුගමධ්‍යය; දෙපයෙහි, පාදද්වයෙ හි; පමණ, ප්‍රමාණය; සරිකොට, සමානකොට; සම තතාලමද්දලගියට එක්කොට, (මේඅවයවයන්) සකලතාලවාද්‍යගීතිකාවන්ට අනුරූපකොට; දිමුත දීප්තිමත්වූ; නළඹ, නාටිකාවෝ; දිවනළලෙසට, දිව්‍යනාටිකාවන්මෙන්; රඟදෙති, නෘත්‍යදානය කෙරෙති.

176 ඉගෙණ සිතුලෙසට නිසිතාල බේ ද ය
ව ය නා සුද්දමද්දල නදට පෑ ද ය
ගෙලනා නගනඅතපය නොව විරෝ ද ය
ර ඟ නා නළඹබලමම්තුර සුබෝ ද ය

සිතුලෙසට, සිත්සේ; නිසි, යොග්‍යවූ; තාලබේදය, තාලභේදයන්; ඉගෙණ, අවබොධකොට; වයනා, වාදනයකරන්නාවූ; සුද්ද, ශුද්ධවූ; මද්දලනදට; මෘදඞ්ගභෙරිනාදය (අනුව); පෑදය, නිර්මලලෙස; විරෝදයනොව, විරුද්ධනොව; අතපය, හස්තපාදයන්; ගෙලනනගනා, අවක්ෂෙපන උත්ක්ෂෙපනයකරන්නාවූ;

රඟන, නෘත්‍යකරණ; නළඹ, නාටිකාඞ්ගනාවන්; සුබෝදය, යථාපත්අවබෝධයක්ඇති; මම්තුර, මා ගේමිත්‍රය; බල, අවලොකනායකරව.

177 ගත ව ර බඹුර්රඟඅඟනක් වෙසිනඹ ලු
ඇයවෙර විසිරඳුසිරඟඅවට සළුගෙ ලු
පැහැසර පද කනායටියෙන් ගෙබිනැබ ලු
ම ද සි ර උදුලසේසුත් විලස පළක ලු

වෙසින්,වෙගයෙන්; අඹල, ආවෘතවූ ගෙවත්කැරි කැවුනාවූ; අඟනක්, ස්ත්‍රියක්;බඹුර්රඟ,එනම්නෘත්‍යඃ; ගතවර, ගත්කල්හි; ඇයවෙර,ඇගේශරීරයෙහි අවට, හාත්පස; ගෙලසළු, ශොභනවස්ත්‍රයන්; විසිර් ඳුසිරඟ, විහිදීදෘශ්‍යමානවූආකාරය;(කෙසේදයත්)පැ හැසර, ප්‍රභාසාරයඇත්තාවූ; පදකනායටියෙන්, පා දනාමැතිකණකයෂ්ටියෙන්; ගෙබි, ගෙබියාවූ; නැබ ල, මහත්වූ; මදසිර, අනඞ්ගයාගේශ්‍රීයෙහි; උදුල, උජ්වලිතවූ; සේසත්විලස, ශ්වේතච්ඡත්‍රවිලාසය; පළ කල, ප්‍රකාශකෙළේය.

178 විසුරණ ලෙසින්විසිතුරුනව රුවන් රැස ක්
අමුනන මෙන්නොයෙකපැහැයුතුකුසුම්දම ක්
සසො බන නළඟනන් සුරනළඹ ලෙසළද ක්
වෙසෙසින රුඟුම්දක්වති වරදනොවමද ක්

විසිතුරු, විචිත්‍රවූ;නවරුවන්රැසක්, අභිනවරත්න රාශියක්; විසුරණලෙසින්, විසිණීකරන්නාක්මෙන්; නොයෙකපැහැයුතු, අනෙකවර්ණයෙන්යුක්තවූ; කු සුම්දමක්, පුෂ්පදාමයක්; අමුණනමෙන්, ග්‍රන්ථනය කරන්නාක්මෙන්;ළදක්, බොහොසේ; සුරනළඹලෙ ස, සුරනාටිකාවන්මෙන්; සසොබන; ශොභාමානවූ; නළඟනන්, නාටිකාඞ්ගනාවන්; වෙසෙසින, විශෙ ෂයෙන්; මදක්වරදනොව; මදකුත්නොවරදවා; රැ ඟුම්දක්වති, නෘත්‍යදක්වත්ය.

179 තඳකොට කිංකිණි පුළුළුකුලෙහි සරන් ද මා
ම න තුට වඩන තළගත්දව සර න් ද මා
පළ කොට තුනුරුසිරු කෙළිරඟ වස න් ද මා
දු ටු ව් ම නොමතිබෙයි තවසරවරන් ද මා

සරන්දමා, සවර්ණදම්සඟිනමූ; පුළුළුකුලෙහි; පෘෂ්ඨ ලවුවකණ්ඨස්ථලයෙහි: කිංකිණි, කිංකිණිකයන්; තද කොට, තාදපවත්වා; දිව්සරන්දමා, දිව්‍යජසරාවන් ගේආකාරඇත්තාවූ; මන්තුටවඩන, චිත්තසන්තො ෂවඩවන්නාවූ; තළගත, තාටිකාවන්; තුනුරුසිරු, ශරීරශ්‍රීන්; පළකොට, ප්‍රකාශකොට; කෙළිරඟ, ක්‍රීඩාකළුවිලාසය; දුටුවිට, දර්ශනයකළකාලයෙහි; තව සරවරන්, තපොචාරීවර්යයන්ගේ; දමා, ධර්මයවූවත්; නොමතිබෙයි, නොතිබෙයි.

180 ඊ සි රි තදනලියමෙන් දිලෙනහැම ස ඳ
රුසිරි යුතුනලඟන බරන සතලෙ ඳ
බූසැරි අඟස්සැරිඅගසැරි ලෝසැරී ඳ
මෙසිරි මත්රුඟුම්පෙන්වති සුරඹ ලෙ ඳ

ඊ, අනඞ්ගයාගේ; සිරිතදනලියමෙන්, ශ්‍රීන්තඳ තවූරතිනම්අඞ්ගනාවමෙන්; හැමසඳ, සියලුකල්හි; දිලෙන, බබලන්නාවූ: රුසිරියුතු, රූපශ්‍රියෙන්යුක්ත වූ; නළඟන, නාටිකාස්ත්‍රීහු; බරතසතලෙද, භරතර්ෂීන්විසින්ප්‍රණීතසඞ්ගීතශාස්ත්‍රයෙහි උක්තප්‍රකාරයෙන්; බූසිරි, බූසිරිය; අඟස්සැරි, අඟස්සැරිය; අගසැරි, අගසැරිය: ලෝසැරි, ලෝසැරිය (යන); මෙ සිරිමත්, උක්තශ්‍රීන් නොහොත් නාමයෙන් යුක්තවූ; රුඟුම්, නෘත්‍යයන්; සුරඹලෙද, දිව්‍යස්ත්‍රීන්මෙන්; පෙන්වති, ප්‍රකාශකෙරෙති.

181 සොබන නළඹනෙත්කැත්මියුරු පිළඹ ළු
ස ළ න සොඳුරු යුවලතකොකවැලි තුදු ළු
ච ය න සුද්දම්ද්දලනද ගොස වන ළු
එ දි න එරඟගනකලවිලස පළකා ළු

සොබන, ශොභමානවූ: නළඹ, නාටිකාඞ්ගනාවන්ගේ; නෙත්කැන්, නෙත්‍රකාන්තිනමැති; මියුරුපිළඹළ, ආවර්ත්තිතමයුරපිඤ්ජාඇත්තාවූ: සළුනා, චාලනයකරන්නාවූ; සොඳුරු, සුන්දරවූ; යුවලත, ඝනස්තයුගමයනමැති; කොකවැලින්, බලාකාවලියෙන්: උදුල, උජ්වලිතවූ; වයන, වාදනයකරන්නාවූ; සුද්ද, ශුඬවූ; මද්දලනද, මෘදඞ්ගභෙරිනාදයනමැති: ඝොෂ, ඝොෂාවෙන්; වතළ, ව්‍යාප්තවූ; එරඟ, ඒනෘත්‍ය (භූමි) ය; එදින, ඒ දවසෙහි; ගනකාලවිලස, මේඝකාලශොභාව; පලකළ, ප්‍රකාශකෙළේය.

182 තුනුරුසිරෙන් පළකළසුරඹ නා ලි ය
මඳ පව නින් ලෙලදෙන මෙන්කනා ලි ය
එහි රඟ දුන් රඟරුසිරු ම නා ලි ය
නත් ළව් දුන් මිසකවරෙක් ව නා ලි ය

තුනුරුසිරෙන්, ශරීරශ්‍රියෙන්; සුරඹනාළිය, දිව්‍යනාගකන්‍යාශොභාව; පළකළ, (ලොකයාට) ප්‍රකාශකළාවූ; මදපවනින්, මන්දමාරුතයෙන්; ලෙලදෙන, ලීලොපෙතවූ; කණලියමෙන්, සුවර්ණලතාවන්වැනිවූ; රුසිරි, රූපශ්‍රීන්යුක්තවූ: මනාලිය, මනොඥරස්ත්‍රීන්; එහි, ඒ ස්ථානයෙහි; රඟදුන්රඟ, නෘත්‍යදුන්යකළආකාරය: නත, අත නතාකාර: උව්දුන්මිස, උප්‍රේක්‍ෂය හැර; කවරෙක්, කවර කණෙක්: වර්ණලිය, වර්ණනාකොටලියහෙද්ද? (නොහෙත්මය).

183 වෙසෙස බරතසතරෙහිහසර නොවි හි ඳ
මෙලෙස ගිරිගුම්අනතුරුව එමස ඳ
ස හ ස කරකිරණවන්තෙද යුතුපබ ඳ
ත අැ ස පුරාදකුළුසුමනසුරිඳු ස ඳ

වෙසෙස, විශෙෂයෙන්ම; බරතසතරෙහි, සඞ්ගීතශාස්ත්‍රයෙහි: හසර, උපදෙශමාර්ගය; නොවිහිඳ, අත්නොහැර; මෙලෙස, උක්තප්‍රකාරවූ; ගිරිගුම්,

ශීතිකාන්තත්‍යයට; අනතුරුව, ඉක්බිතිව; එම්සඳ, ඒ මකාලයෙහි; සහසකරකිරණවන්, සූර්‍ය්‍යරශ්මියසදෘශවූ; තේදයුත, තේජසින්යුක්තවූ; පබඳ, ප්‍රසිද්ධවූ; සුමනසුරිඳුසඳ, සුමනසුරේන්ද්‍රෝත්තමයා; තඇසපුරා, තාගේනෙත්‍රයපුරා; දකු, දර්‍ශනයකරව.

184 සුපුන් සිසිකැලුම්මෙන් යසැතිනික ස ළ
සමන් සුරිඳුඋතුමඟසැදිරන් කිරු ළු
අඳුන් ගිරිමුදුනනෙහිරුඳි පැහැවිසු ළු
සුවන් මොනරසිරිසරලොවට පළකා ළු

සුපුන්සිසිකැලුම්මෙන්, පූර්ණචන්ද්‍රරශ්මිබඳුවූ; නිකසළ, නිර්මලවූ; යසැති, කීර්ත්‍යිඇත්තාවූ; සමන්සුරිඳු, සුමනසුරේන්ද්‍රයාගේ; උතුමඟ, උත්තමාඞ්ගය; සැදි, සජ්ජිතකළාවූ; රන්කිරුළ, ස්වර්ණකිරීටයතෙමේ; අඳුන්ගිරිමුදුනනෙහිරුඳි, අඤ්ජනකූටමස්තකයෙක්හිරඳන්නාවූ; පැහැ, ප්‍රභාව; විසුළ, විස්තීර්ණවූ; සුවන්මොනරසිරිසර, ස්වර්ණමයූරශ්‍රීසාරයක්; ලොවට, ලොකයාට; පළකළ, ප්‍රකාශකෙළේයි.

185 සුග තිඳු සිරිසරණසරපැලඳි මුදුන ත
පර සි දු සුරරදුගෙමුළුතෙදියතෙක නෙ ත
පැහැවිදු රන්පටින්හෙබිසොඳුරු නළල ත
විදු කි ඳු තොරතොවනගණතුළෙකසිරිග ත

මුදුනත, මස්තකයෙහි; සුගතිඳු, සුගතෙන්ද්‍රයාගේ හෙවත් සර්‍වඥරාජයාගේ; සිරිසරණසර, ශ්‍රීපාදපද්මය; පැලඳි, පැළැන්දවූ; මුළුතෙදියත, සකලත්‍රෛලොක්‍යයට; එකනෙත, අසහායනෙත්‍රාකාරවූ; පරසිදු, ප්‍රසිද්ධවූ; සුරරදුගෙ, (සුමන) දෙවරාජයාගේ; පැහැවිදු, ප්‍රභානමැතිවිද්‍යුල්ලතාඇති; රන්පටින්හෙබි, ස්වර්ණපට්ටයෙන්හෙබියාවූ; සොඳුරු, සුන්දරවූ; නළලත, ලලාටතලයෙහි; විදුකිඳු, විදුලිකෙඳි; තොරතො

චන, අවිච්ඡින්නවත්නාවූ; ගණකුලෙක, මෙඝකූට යෙක්හි; සිරි, ශොභාව; ගත, ග්‍රහණයකෙළේය.

186 ඉ ඳු නිල් යටගලෙලනිල්දද යුවල මෙ න
පැහැ දුල් බැමසගළසුරරදුගෙ වොරදි න
නෙතුපුල් උපුල්සුසඳුතොරතොව කෙළෙ න
මිහිලොල් වැලයුවලක සිරිගති සොබ න

ඉඳුනිල්යටගලෙල, ඉන්ද්‍රනීලයෂ්ට්‍යග්‍රයෙහි චඤ්චලවූ; නිල්දදයුවලමෙන, නීලවර්ණධ්වජයුග්මයක්බඳුවූ; සුරරදුගේ, (සුමන) දිව්‍යරාජයාගේ; වොරදින, විරාජමානවන්නාවූ; පැහැදුල්බැමසගළ, ප්‍රභාවසෙන්ජ්වලිතභ්‍රෑයුග්මය; නෙතු, නෙත්‍රනමැති; පුල් උපුල්, ප්‍රඵුල්ලනීලොත්පලයන්; සුසඳ, සුසජ්ජිතකොට; තොරතොව, වියොගනොවී; කෙළෙන, ක්‍රීඩාකරන්නාවූ; සොබන, ශොභනවූ; මිහිලොල්වැලයුවලකසිරි, මධුලොලශ්‍රෙණීයුග්මයකශ්‍රීය; ගත, ග්‍රහණයකෙළේයි.

187 දිලෙන මහඟුඉඳුනිල්ඉඳුවරන් ර ඟ
සු ම න සුරරජුගෙ දිගුනිල් නුවන් යු ග
නිති න සව්සතන්වෙතපතළ එකර ඟ
ස ර ණ සොඳුරුමින්යුවලෙක කුළුණුග ඟ

දිලෙන, බබලන්නාවූ; මහඟු, මහාර්ඝවූ; ඉඳුනිල්, ඉන්ද්‍රනීලමාණික්‍යයා; ඉඳුවරන්රඟ, ඉන්දීවරයන්වැනිවූ; සුමනසුරරජුගේ, සුමනදිව්‍යරාජයාගේ; දිගු, දීර්ඝවූ; නිල්, නීලවර්ණවූ; නුවන්යුග, නෙත්‍රයුග්මය; නිතින, නිරන්තරයෙන්; එකරඟ, එකාකාරව; සව් සතන්වෙත, සකලසත්ත්වයන්කෙරෙහි; පතළ, ව්‍යාප්තවූ; කුළුණුගඟ, කරුණානමැතිනදියෙහි; සරණ, සඤ්චාරණයකරන්නාවූ; සොඳුරු, සුන්දරවූ; මින්යුවලෙක, මත්ස්‍යයුග්මයෙකි,

188 ලොවසත් සතන්කොඳනඳකළ තරිඳු යු ත
සිරිමත් සුරනිඳුගෙ නිසිසොමි ගුණනුමු ත
යශපත් බැමතිලකයෙන්සුසැදි නළල ත
යුගපත් ගොබින්සෙබිරඹපැළෙකසිරිග ත

ලොවසත්සතන්, ලොකසත්වයාගේ චිත්තසන්තා
නයන්නමැති; කොඳ, කෞමුදයන්; නඳකළ, සන්තු
ෂ්ටකළාවූ; තරිඳුයුත, චන්ද්‍රයාබඳුවූ; නිසි, යොග්‍යවූ;
සොමිගුණ, සෞම්‍යගුණයෙන්: නුමුත, යුක්තවූ; සිරි
මත්සුරනිඳුගේ, ශ්‍රීමත්සුරෙන්ද්‍රයාගේ; යශපත්, යශ
පත්වූ; බැමතිලකයෙන්, භ්‍රෑනමැති තිලකයෙන්;
සුසැදි, සුසජ්ජිතවූ: නළලත, ලලාටය; යුගපත්ගො
බින්, පත්‍රයුග්මයක්සහිතගොබයකින්; සෙබි, ශො
භිතවූ; රඹපැළෙක, රම්භාවෘක්ෂයෙක්හි; සිරි, ශො
භාව; ගත, ග්‍රහණයකෙළේය.

189 දසන දිමුතුමුතුහසතරඟින් දිමු ත
දසන වසනපැහැදුලපබල පෙලයු ත
නදන සුරනරන්වදනම පිරිසන ත
සුමන දෙව්ළවනසමුදුර විලස් ග ත

දසන, දන්තනාමැති, දිමුතු, දීප්තිමත්වූ; මුතු, මු
ක්තාඵලඇත්තාවූ; හස, හිනානාමැති; තරඟින්, රශ්මි
න්; දිමුත, දීප්තිමත්වූ; දසනවසන, තොල්නාමැති;
පැහැදුල, ප්‍රභාවෙන්උජ්වලිතවූ; පබලපෙලයුත, ප්‍ර
වාලපඞ්ක්තියෙන්යුක්තවූ; සුරනරන්, දෙවමනුෂ්‍යය
න්; සතත, නිතර; නදන, පිනවන්නාවූ; වදන, වච
නනාමැති; අමපිර, ජලයෙන්පරිපූර්ණවූ: සුමනදෙව්ළ
වන, සමන්දෙවයාගේමුඛය; සමුදුරවිලස්, සමුද්‍රශො
භාව; ගත, ග්‍රහණයකෙළේයී.

190 සිරිසර සව්කෙළිනරණෙවිළි යුරුසොබ න
සුරවර සවණයුගමිණිතෝඩු බබල න
තුඟුතර අඳුන්ගිරිකුළුයුග පසදිලෙ න
පැහැසර ලශිරුයුවලෙක්ඇත හොත්එමෙ න

සිරිසරසවි, ශ්‍රීකාන්තාවගාසරස්වතීදෙවිය; කෙළිනා, ක්‍රීඩාකරන්නාවූ; සොබනා, ශොභාමානවූ; රණෙවිලිසුරු, ස්වර්ණලන්සිල්ලාවැතිවූ; සුරවර, සුමනාදේවයාගේ; සවණයුග, කර්ණයුග්මයෙහි; බබලනා, භ්‍රාජමානවූ; මිණිතෝඩු, මාණික්‍යතාඩඞක; තුඟු, උස්වූ; තර, මහත්වූ; අඳුන්ගිරිකුළු, අඤ්ජනපර්වතකූටයාගේ; යුගපස, උභයපාර්ශ්වයෙහි; දිලෙනා, බබලන්නාවූ; පැහැසර, ප්‍රභාස්වරවූ; ලහිරුයුවලෙක්, බාලසූර්ය්‍යයුග්මයෙක්; ඇතහොත්, විද්‍යමානවීනම්; එමෙනා, ඒ සමානයි.

191 දිගුතර සුරතැඟිලිදලුනියකුසුම් ස ර
පියකර සුනිල්මිණිඅබරණ රැඳිබම ර
සුරනර නඳනකරසව්සිරිදෙන නිතො ර
සුරතුර අතුවිලසනියලිය සුරිඳු ක ර

දිගු, දීර්ඝවූ; තර, මහත්වූ; සුරතැඟිලිදලු, රක්තාඞ්ගුලිනමැති පල්ලවඇත්තාවූ; නියකුසුම්සර, නඛනමැතිපුෂ්පයෙන්සාරවූ; පියකර, ප්‍රියඞ්කරවූ; සුනිල් මිණිඅබරණ, අතිනීලමාණික්‍යාභරණනමැති; බමර, භෘඞ්ගයන්; රැඳි, රඳන්නාවූ; සුරනර, දිව්‍යමනුෂ්‍යයන්; නඳනකර, සන්තුෂ්ටකොට; නිතොර, නිරන්තරයෙන්; සව්සිරිදෙන, සකලෛශ්වර්ය්‍යදායකවූ; සුරිඳුකර, සුරෙන්ද්‍රයාගේහස්තය; සුරතුරඅතුවිලස, කල්පවෘක්ෂශාඛාශ්‍රිය; නියලිය, ප්‍රකාශකෙළේයි.

192 සුනිල් වසාරොදගැවසුනුනිල් සෙවෙ ල
ලකල් සුරඹනෙත්කැන් කෙළිනමිහිලො ල
විපුල් මෙසුරිඳුගෙනිසිපුළුළුර මඩ ල
සිහිල් කුළුණඹින්පිරිවිලෙක මනක ල

සුනිල්, අතිනීලවූ; වසාරොද, වසාරාජීකාවනමැති; නිල්සෙවෙල, නීලශෛවාලයෙන්; ගැවසුනු, ගැවසුනාවූහෙවත්යුක්තවූ; ලකල්, අලඞ්කෘතවූ; සුරඹ

නෙත්කැන්, අවංසත්‍රීන්ගේ නෙත්‍රකාන්තිනමැති; මිහිලොල.මධුලොලයන්; කෙළිත,ක්‍රීඩාකරන්නාවූ; විපුල්, මහත්වූ; මෙසුර නිඳුගෙ, මේ සුරේන්ද්‍රයාගේ; නිසි, යොග්‍යවූ; පුළුලුරමඩල, විශාලවක්ෂස්ථලය; සිහිල්,ශීතලවූ; කුළුණඹින්, කාරුණ්‍යජලයෙන්; පිරි, පරිපූර්ණවූ; මනකල, මනොඥවූ;විලෙක,තටාකයකි.

193 පැහැනඳ අනගිනවමිණිගණරැණින් කළ
ඉන සැඳ වොරැදිපැහැසරනිසි පුළුලුකුළ
සුර රද තුනුකලිඳුගගසුලකළ පූවළ
මන නඳ රුවන්වැලිතලවිලස පළකළ

පැහැනඳ, ප්‍රභාවෙන්ආඪ්‍යවූ; අනගි, අනර්ඝවූ; නව මිණි, අභිනවමාණික්‍ය නමැති; ගණරැණින්, සණ ස්වර්ණයෙන්; කළ, කළාවූ; ඉනසැඳ, කටිසජ්ජාවෙන්; වොරැදි, විරාජමානවූ; පැහැසර, ප්‍රභාස්වරවූ; නිසි, යොග්‍යවූ; පුළුලුකුල, පෘථුලවූජඝනතලය; සුර රද,දෙවේන්ද්‍රයාගේ;තුනු, ශරීරයනමැති; කලිඳුගඟ, කාලින්දිගඞ්ගාවෙහි; පූවළ, මහත්වූ; සුලකළ, සව ලඞ්කෘතවූ; මනනඳ, මනොනන්දනවූ; රුවන්වැලි තලවිලස,රත්නවාලුකාතලයාගේවිලාසය; පළකළ, ප්‍රකාශකෙළේයි.

194 නි න යන දළනයනරිවිවිලස යුග කෙළ
වැජඹෙන තෙදැතිමෙසුමනසුරිඳුගෙ පූවළ
ළසු ලන දියවම්මනඉඳුනිල් වැම්සඟ ළ
සිර ගෙණ පිලෙළිපැහැසර දෙවවොරයුවළ

නිනයන,ඊශ්වරයාගේ;දළනයන,ලලාටනයනයා ගේභා; යුගකෙළ,කල්පාන්තයෙහි;රිවි, සූර්යයාගේ; විලස, ආකාරයෙන්;වැජඹෙන, විජෘම්භමානවන්නා වූ; තෙදැති, තෙජස්ඇත්තාවූ; පූවළ, ප්‍රෞඪවූ; මෙසු මනසුරිඳුගෙ, මේසුමනසුරේන්ද්‍රයාගේ; පැහැසර, ප්‍ර භාස්වරවූ; දෙවවොරයුවළ, වෘතෙත්‍රාරුයුග්මයාදිය

ශ්‍රීමත, ලොකයතමැතිවිමානය; උසුලන, උද්වහන් යකරන්නාවූ; ඉඳුනිල්වැමිසගළ, ඉන්ද්‍රනීලසත්මහ ස්තම්භයක; සිරි, ශොභාතිශය; ගෙණ, ග්‍රහණයකර; දිලෙයි, ජ්වලිතවෙයි.

195 දිලෙන් සොඳුරුසැහැසරමොනර කරර ග
සුමන සුරරජුගෙපරසිදුවූ දස දි ග
නොමින් රුවැතිසසිලිටිවූකොමල සුගඳ ග
දිතින සුරඹමනනෙත්කරවාය ද ගි

පැහැසර, ප්‍රභාශ්වරවූ; සොඳුර, සුන්දරවූ; මොනර කරරග, මයුරග්‍රීවයමෙන්; දිලෙන, (සංස්ථානක්‍රම යෙන්) බබලන්නාවූ; දසදිග, දශදිශාවෙහි; පරසිදු වූ; ප්‍රසිද්ධවූ; සුමනසුරරජුගෙ, සුමනසුරේන්ද්‍රයාගේ; නොමිනරුවැති, අප්‍රමාණශොභාසම්පන්නවූ; සසිලි ටිවූ; ශ්ලිෂ්ටවූ; කොමල, කොමලවූ; දගසුග, ජඞ්ඝායුග්මය; දිතින, දර්ශනයකරන්නාවූ; සුරඹ, සුරස්ත්‍රීන්ගේ; මනනෙත්, මනොනෙත්‍රයන්; දගකරවාය, වශීකෘතකරවයි.

196 තරසර සුනිල්මිණිඅබරණ බිඟුන් රැ දි
දිඟුතර සුරතැඹිලිදිලිදල පෙලින්සැ දි
සුරතර වරනිසරකැලසෙව්නා නිසැ දි
සුර වර සරණතලරතකමල සිරිල දි

තරසර, ස්ථිරසාරවූ; සුනිල්, අතිනීලවූ; මිණිඅබරණ, මාණික්‍යාභරණනාමැති; බිඟුන්, භෘඞ්ගයන්; රැඳි, රඳන්නාවූ, දිගු, දීර්ඝවූ; තර, ස්ථිරවූ; සුරතැඹිලි, රක්ත ඩඹුරුනමැති; දිලි, ජ්වලිතවූ; දලපෙලින්, පත්‍ර පඞ්ක්තියෙන්; සැදි, සජ්ජිතවූ; සුරතරවර, දිව්‍යතර ශ්‍රෙෂ්ඨයන්නාමැති; නිසරකැල, හංසසමූහයා; නිසැදි, නිරන්තරයෙන්; සෙව්නා, සෙවනයකරන්නාවූ; සුරවර, සුමනදෙවෙන්ද්‍රයාගේ; සරණතල, චරණයුග්මය; රතකමලසිරි, රක්තපද්මශ්‍රීය; ලදි, ලැබුවේයි.

197 සම ත සුරනරන්නෙතරස අඳුන් යු ත
දිමු ත සුමනසුරිඳුගෙ තනුසිරි වණ ත
සතත සවතසුරගුරු ගනිසුරු අන ත
සමු ත මෙසුරම්සඅන්කෙවියත සම ත

සමතසුරනරන්නෙත, සමස්තදිව්‍යමනුෂ්‍යයන්ගේ නෙත්‍රයෙහි; රසඅඳුන්යුත, රසාඤ්ජනයන් සදෘශවූ; දිමුත, දීප්තිමත්වූ; සුමනසුරිඳුගෙ, සුමනසුරෙන්ද්‍රයාගේ; තනුසිරි, ශරීරශ්‍රීය; වණත, වර්ණනාකරත්හොත්; සතත, මහාබ්‍රහ්මයාය; සවත, සනත්කුමාරයාය; සුරගුරු, බෘහස්පතිය; ගනිසුරු, ගණදෙවියාය; අනත, අනන්තනම්නාගරාජයාය (යන); සමත, සමර්ථවූ; මෙසුරම්ස, මෛත්‍රීදෙවගනායාහැර; අන්කෙවියත, අන්‍යකවරපණ්ඩිතයෙක්; සමත, සමර්ථද?.

සබඳ, ඒ සුරෙන්ද්‍රයාහට මෙබඳුවූ වාර්තාවිශෙෂයක් විඥාපනය කරව.

198 නමකළසුරඅසුර නරනාකිරුළු කෙමි දු ල
වෙසෙස්නිදෙස් රතැඟිලිපෙත්නෙත් තෙව් න
අපිස්තවුස් හස්කැත්නිත්නෙත් සෙව් ... න
මුනිසරණසියපත මුදුනතපෑලදී හැමු ස ඳ
සවණබරණකළනෙවළා දහම් කා ... ... ඳ
සුමනසුමන සුරරජුසිරි පද නැම ... ... ඳ
පවර මෙඅපමුනිසස්නඳ සත්ලොව ... ... ඳ
ලතර රජසිහනිරිඳුඳ මැති ගණ .. ... ඳ
පත ර ඇතස්රියපාබලසෙන් පබ ... ... ඳ
නිතර රකිනලෙසඅයදින් මිතුරු ස ... ... ඳ

නමකළ, නමස්කාරකළාවූ; සුර, දෙවය; අසුර, අසුරය; නර, මනුෂ්‍යය; නා, නාගය (යනමොවුන්ගේ); කිරුළු, කිරීටනමැති; කෙමිදුල, කර්ණිකාවෙන්බබලන්නාවූ; වෙසෙස්, විශෙෂවූ; නිදෙස්, නිර්දෝෂවූ;

රතැඹිලිපෙත්තෙන්, රක්තාඞ්ගුලිපත්‍රයෙන්; තෙව්
නා, බබලන් නාවූ; අපිස්, අලෙපවත්වූ; තවුස්, තාපස
නමැති; හුස්කැත්, හංසසමූහයාවිසින්; නිත්තෙන්,
නිරන්තරයෙන්; සෙව්නා, සේවනයකරන්නාවූ; මුනි
සරණ, සර්වඥචරණය නමැති; සියපත, ශතපත්‍රය; හැ
මසඳ, සියලුකල්හි; මුදුනත, මස්තකයෙහි; පැලඳි, පි
ළඬනයකළාවූ; තෙවළාදහම්කඳ, ත්‍රිපිටකධර්මස්ක
න්ධය; සවණඅබරණකළ, කර්ණාභරණකළාවූ; සුම
න, යහපත්සිත්ඇති; සුමනසුරරජු, සුමනදෙවරාජ
යාගේ; සිරිපද, ශ්‍රීපාදය; නැමද, වැඳ; පවර, උතුම්
වූ; මෙමඅපමුනිසස්නද, මේඅපගේසර්වඥ ශාසනයද;
සත්ලොවද, සත්ත්වලොකයාද; ලතර, දුශ්චිත්තයක්
ඇත්තාවූ; රජසිහනිරිඳුද, රාජසිංහනරෙන්ද්‍රයාද; ප
තර, මහත්වූ; මැතිගණද, මන්ත්‍රීන්සමූහයාද; පබ
ඳ, ප්‍රකෘෂ්ඨදෙහඇත්තාවූ; ඇතැස්රියපාබලසෙන්, හ
ස්ත්‍යශ්වරථපාදාතියන චතුරඞ්ගනීසෙනාවද; නිතර,
අනවරතයෙන්; රකිනලෙස, ආරක්ෂාකරණපරිද්දෙ
න්; මිතුරුසඳ, මිත්‍රොත්තමය, අයදින්, යාච්ඤාකරව.

199 සිරි සර මෙසුරනිඳුසුරතුර වැලඳිසො ද
මනහර කප්ලියක්මෙන් දිලෙන ඇමස ද
පුව තර බිසෝදෙවියන්පඳ කමලවැ ද
සැලකර එක්පසෙකසිට මෙපුවත සබ ද

සිරිසර, සම්පත්තීන්ආඪ්‍යවූ; මෙසුරනිඳු, මේසුරෙ
න්ද්‍රයානමැති; සොඳ, සුන්දරවූ; සුරතුරු, කල්පවෘක්ෂ
ය; වැළඳි, ආලිඞ්ගනයකළාවූ; මනහර, මනොඥවූ;
කප්ලියක්මෙන්, කල්පලතාවක්මෙන්; හැමසඳ, සි
යලුකල්හි; දිලෙන, දීප්තිමත්වූ; පුවතර, ප්‍රසිද්ධවූ; බි
සෝදෙවියන්, මහෙසිකාදේවියගේ; පඳකමල, පාද
පද්මය; වැඳ, නමස්කාරකොට; සබඳ, මිත්‍රය; එක්ප
සෙකසිට, එක්පාශර්වයෙක්හිඳිනව; මෙපුවත, මේ
ප්‍රවෘත්තිය; සැලකර, සැලකරව.

200 සිසිර කරකිරණ කිරණව තරඟයු ත
පතර යසරැසින් හෙළිකළ මුළුදිය ත
කුමර දෙවිඳු යුගසිරිසරණ සියප ත
තසිර පැලඳ සකිසැලකරව මෙපුව ත

සිසිරකරකිරණ, චන්ද්‍රකාන්තිය; කිරණවතරඟ, ක්ෂීරසාගරතරඞ්ගය; (යනම්ට) යුත, සදෘශවූ; පතර, ගත්වූ; යසරැසින්, කීර්ත්තිරාශියෙන්; මුළුදියත, සකලලෝකය; හෙළිකළ, ධවලකළාවූ; කුමරදෙවිඳු, විභීෂණදෙවකුමරුන්ගේ; යුගසිරිසරණසියපත, ශ්‍රීපාදයුග්මයනමැති ශතපත්‍රය; තසිරපැලඳ, තාගේ ශිරසිපිළන්ධනයකොට; සකී, මිත්‍රය; මෙපුවත, මේ ප්‍රවෘත්තිය; සැලකරව, මතක්කරව.

201 තිපුර දැවූහරදළනෙත ගෙව්තෙද ණ
ස පුර කළයසස්රැසලොව තුළසොබ ත
ස පු සුරිඳුගෙ නමකර යුග සිරිසර න
මෙපු වතසැලකරව මමිතුරු තුමකල ණ

තිපුර, ත්‍රිපුරය; දැවූ, භස්මකළාවූ; හර, ඊශ්වරයාගේ; දළනෙතඅගෙව්, ලලාටනෙත්‍රවහන් සදෘශවූ; තෙදඅණ, තේජෝඥාඇත්තාවූ; සොබන, ශෝභනවූ; යසස්රැස, යශෝරාශිය; ලොවතුළ; ලෝකාභ්‍යන්තරයෙහි; සපුරකළ, සම්පූර්ණකළාවූ; සපුසුරිඳුගෙ, සප්‍රසුරේන්ද්‍රයාගේ; සිරිසරණයුග, ශ්‍රීපාදයුග්මය; නමකර, නමස්කාරකොට; කලණි, කල්‍යාණවූ; මමිතුරුතුම, මාගේමිත්‍රෝත්තමය; මෙපුවත, මේ ප්‍රවෘත්තිය; සැලකරව, මතක්කරව.

202 නුඹ මිණතෙදැති එසුමනසුරිඳුට සොබ නා
සුබ මෙගසුන් දන්වාඇප අයදුමෙ න
බඹ මුදුනත යසහිරවරණ සඳමි න
තඹ සිරිමිතුර පවතින් සඟ නෑසිය නා

නුඹමිණතෙදැති, සූර්‍ය්‍යාටබඳුතෙජස්ඇත්තාවූ; සොභන, ශොභනවූ; එසුමනසුරිඳුට, ඒ සුමනසුරේන්ද්‍රයාට; සුබ, මඞ්ගල්‍යයක්වූ; මෙගසුන්, මේසන්දේශය; අපඅයදුමෙන, අපගේයාච්ඤාවසේ; දන්වා, විඥාපනයකොට; යස, කීර්ත්තිය; බඹමුදුනත, බ්‍රහ්මයාගේමස්තකයට; හිරවරණසඳමින, ඡත්‍රයක්කොට හෙවත් බ්‍රහ්මයාගේමස්තකයෙහි ඡත්‍රයටබඳුයසස්ඇතිකොට; තඹසිරිමිතුර, කුකකුටමිත්‍රය; නෑසියනසඟ, ඥාතින්හා; පවතින්, ජීවත්වෙව.

203 ගැඹු රු සකු මගදකිව් නළු සිඳුහිමි දී
මි තු රු නොවන තිව්ගජසිඟ සිරින් බි දී
සොඳුරු අලගි වන්මුකවෙටි නමැති සු දී
මි යු රු පදරසැති මෙසැවුල් අසුන් යෙ දී

ගැඹුරු, ගම්භීරවූ; සකු, සංස්කෘතය; මගද, මාගධය; කිව්, කාව්‍යය; නළු, නාටකය;(යන)සිඳු, සමුද්‍රයෙහි; හිමිදි, හිමින්දවූ; මිතුරුනොවනතිව්ගජ, ශත්‍රුකාව්‍යකාරයන්නමැති හස්තීන්; සිඟසිරින්, සිංහලීලාවෙන්; බිදී, භගනකළාවූ; සොඳුරු, සුන්දරවූ; අලගිවන්නමැති, අලගියවන්නනමැත්තාවූ; සුදීමුකවෙටී, පණ්ඩිතමුකවෙට්ටිතුමා; මියුරු, මධුරවූ; පදරසැති, පදරසඇත්තාවූ; මෙසැවුල්අසුන්, මේකුක්කුටසන්දේශය; යෙදී, රචනාකොළේයි.

නිමි.

# වෛශාඛ බෞද්ධ සංගීතය.

---

වෘත්තය—තෙරාමුජේබවාන්-උසමකෝංගි

1 සඳ මෙයී උතුම්-සඳ මෙයී උතුම්
ශාක්‍යසිංහ සාදරේනහිස් නමාවදිම්
සසරවාස සව්සතුන්-ඉවත්දයා සිතින්
දම්දෙසූ සිසුම්-දම්දෙසූ සිසුම්
ශාක්‍යසිංහ සාදරේනහිස් නමාවදිම්

2 සඳ මෙයී සවන්-සඳ මෙයී සවන්
බුද්ධරාජ ශාක්‍යසිංහ දූන් වදිව් බැතින්
කුදිටුදුපිසුන් ළතා-සත්‍යධර්මීනා
දෙව්බඹුන් පිදූ-දෙව්බඹුන් පිදූ
බුද්ධරාජ ශාක්‍යසිංහ දූන් වදිව් බැතින්

3 තබා දෙහොත්මුදුන්-තබා දෙහොත්මුදුන්
ධර්මරාජ ශාක්‍යසිංහ දූන් වදිව් බැතින්
කියමු ගීත ප්‍රීතියෙන්-භක්ති ප්‍රේමයෙන්
ශ්‍රී තිලෝ පියා-ශ්‍රී තිලෝ පියා
ධර්මරාජ ශාක්‍යසිංහ දූන් වදිව් බැතින්

4 සැදූ මගක් නිවන්-සැදූ මගක් නිවන්
ලොව්තුරා මුණීස්වරට දූන් වදිව් තොසින්
සුදිටු සව්සතුන් දයා-බැඳූ ලෝපියා
හිස් නමා නමා-හිස් නමා නමා
ලොව්තුරා මුණීස්වරට දූන් වදිව් තොසින්

---

## දෙවෙනි ගීතය.

වෘත්තය—රමාබජන්කර්පායාරයේනෝ

1 ශ්‍රීපා කමල මුණීඳුන්ගේ තිලෝනා
ශ්‍රීපා කමල නමදිම්මෝ
බඹ සුර් නරනා-සියලූ බිඟුන්කැන්
ලොබකර සෙව්-සුරතැඟිලිදලින්සන්

294.341.
VAI



2 ශ්‍රීපා කමල මුණින්දුන්ගේ තිලෝනා
ශ්‍රීපා කමල නමදිම්මෝ
මිසදිටු මඩණා—දෙසුව උතුම් දම්
කුලදෙටුවන් මත—යුහුම කඩස්වත්

3 ශ්‍රීපා කමල මුණින්දුන්ගේ තිලෝනා
ශ්‍රීපා කමල නමදිම්මෝ
ඝෝරතර භවයේ හරණ විරම් දම්
දෙසූ නිරසාරවූ නැතැයි මනෝරම්

4 ශ්‍රීපා කමල මුණින්දුන්ගේ තිලෝනා
ශ්‍රීපා කමල නමදිම්මෝ
මිහිරිවූ මෙම ය් චරිත නොබිඳැ
කියමිනි දූන් වැඳගණිමු මුණිඳු

---

## තුන්වෙනි ගීතය.

චත්තය—කුදපාහි—සදිල්පිකාබලාසකාර.

1 මෙලෝ සැසි—උපන්දිනේ කියා මෙගීත සොම්නසින්
වඳිම්—
මෙලෝක සැප මෝක්ෂ මාර්ගයේ
ලූ දෙසා දහම්, උතුම් ඒබුබරාජ මම් වඳිම්

2 මෙලෝ සැසි—උපන් දිනේ කියා මෙගීත සොම්නසින්
වඳිම්—
අනේක රාජසම්පතින් යුතු
රාජනි කුසින්, උපන් කුමාර වන්දනාකරම්

3 මෙලෝ සැසි—උපන් දිනේ කියා මෙගීත සොම්නසින්
වඳිම්—
විරාජමාන රුසිරින් උතුම්
සැ සිපා පියුම්, වඳිම් වදාළ ධර්ම දිසවත්

4 මෙලෝ සැසි—උපන් දිනේ කියා මෙගීත සොම්නසින්
වඳිම්.
එපුණ්‍යවනත ශ්‍රී කුමාරයා
ලෝසතුන් දුකින්, මුදන්ට ආවෙ පාරමී පුරා

## හතරවෙනි ගීතය.

වෘත්තය—සබ්ගෞම්බාර.

1 ගුම්ගුම් නදින්ම-භාඪග ලුම්බිණි වනේ
පිපි දසමන් උපුල් පියුම් ගණී රෙණේ
සුදෙවුන් නිසා උතුම් කුමාර මේදිනේ මෙලෝකුසේ
බිහිවිය මායා දේවිගේ කුසින්

2 දුර්ලබ්බි අන්ධකාර සූන්‍ළනා මෙද
බුදු සූසඞ් ධර්මරශ්මියෙන් මෙලෝකුසා
සුර බ්‍රහ්ම නා මනුෂ්‍ය ඈ සතුන්ට ආදරෙන් මුණී
බිහිවිය මායා දේවියේ කුසින්

3 වස්වර්තියාගෙ තේජගම්භීරතිරා
සිදු ධර්මරාජ ලොව්තුරා මුණි ස්වරා
සසරේහි වාස සත්ව සෑම බේරයෑන්ම සිත්දරා
බිහිවිය මායා දේවියේ කුසින්

4 සර්වඥ බුධරාජ දම්රද තුමා
ලොව සත්ව මෝක්ෂ මාර්ගයේ දමාදමා
බව දුක්ඛ සංසිද්ම ලොකයාට පෑව ධර්මනී
බිහිවිය මායා දේවියේ කුසින්

---

## පස්වෙනි ගීතය.

වෘත්තය—දිල්මෙරාතුජේ.

1 ලුම්බිනීවනේ, මායා දේවිකුසින් උපන්නේ
සිඩාර්ථ කුමාරේන්ද්‍ර පුණ්‍යවන්ත මේ දිනේ

2 දම් දෙසා මුණි, ලෝකයාට කළේ උදව්වක්
ශ්‍රී මෝක්ෂ ලබාගන්ට හැකි ඒමගින් උදක්

3 පින් සිරින් පිරූ, ශ්‍රීකුමාරවියේ පසෑසේ
සව්නේ මඩලා දත්තසේක හස්තාමලකසේ

4 දූන් වදිව් වදිව්, සෑසි සීලබෑතින් රැකීමෙන්
මෛත්‍රිය කළේ කව්ද ලෝකෙ උන්වහන්සෙ මෙන්

---

## හවෙනි ගීතය.

වෘත්තය—නාථොනාවොබස්කුසීමෙ.

1 ලෝකනාථ බුදුරජ යැව් මෝක්ෂ දක්වනා
දම්දෙසා ගම්භීර ඤාණයෙන්ම තීර්ථවකීනා
සාධු, සාධු
වේවා මංගලම්

2 පුණ්‍යවන්ත ධර්මරජ දුන්ක ධර්ම බෝ ප්‍රසාද
ඉන් ලොවේ දුක් රාශියක්ම සංසිඳී ගියා තමද
සාධු, සාධු
වේවා මංගලම්

3 මෝඩ සතු බුද්ධධර්ම තේරුමක් නැතිනමින්
අන් දහම් විශ්වාසයෙන්ම නෙක් නිකාකරත් තදින්
වේවා, වේවා
උත්තම් මංගලම්

4 ප්‍රාණඝාත ආදි පාපද්වේෂ බැව් හැඟීසනා
ඉන් මිදී පින්සාර බුද්ධරජ වන්දනාමනා
සාධු, සාධු
වේවා මංගලම්

---

## හත්වෙනි ගීතය.

වෘත්තය—ලාගසසා.

1 රජිනි මායා කුසින්, ලෙවහාබ මේ දිනේ
ප්‍රසූතවී තිලෝ පියා, පුණ්‍ය භාජනේ

2 රජ සැපත් දෙව් සැපත්, අල්ලාදමා ඉවත්
මෙලෝක සත්තුන් නිසා, බුධභාව ලත්

3 සැසියෙ ශ්‍රී පාපිසුම්, අත්දී මුදුන් නමා
මෙගීත ප්‍රීතියෙන් කියා, දෙන් කුපි සැමා

4 පාපක්‍රියාවෙන් මිදී, ධර්මෙන් ක්‍රියා කරව්
විපාක ඉන් ලැබේ සැතින්, සීලයත් රකිව්

---

## අටවෙනි ගීතය.

වෘත්තය—දිරනර්දර්දර්කර්.

1 ප්‍රීතිඝෝෂා දූන් පවත්වව්
ප්‍රීතිඝෝෂා දූන් පවත්වව්
සැසි සිලේ රැක්මා වේවා නිත්තෙන්

2 ශාක්‍යවංශොත්භූත ශ්‍රී පුත්
ශාක්‍යවංශොත්භූත ශ්‍රී පුත්
ලෝකාලෝකේ පැවේ ධම්මසකෙඩන්

3 මෝක්ෂ සම්පත් සව් ලෙවන් වෙත්
මෝක්ෂ සම්පත් සව් ලෙවන් වෙත්
පැවේ සැසි දල්වා විදහ පානක්

4 භාග්‍යවත් මායා තෙණේ මම්
භාග්‍යවත් මායා තෙණේ මම්
ආලෙන් ප්‍රේමෙන් සාධු සාධු වැන්දෙම්

---

## නවවෙනි ගීතය.

වෘත්තය—රාජභූමස්.

1 ත්‍රෛලෝකේ ආචාය්‍යීමූ සුන්‍දර සැසිතුම්
මෙත් කොට ලෝසත් දුක් මිදී–දෙසා සියුම්මූ දම්

2 මායාදේවියේ කුසින් පින්සරු ඒ ස්‍වාමී
මේලොව සත්වෙත් මෙත්සිතින් දිනී නමව් ස්‍වාමී

3 සත්නුන්ගේ ඇස් පෑදුනා ලෙඩ්ඩු සුවෙ ලද්දේ
සක්දෙව් සක් පිම්බා එද සුරෝ ඇවිත් වැන්දේ

4 පින්වත් සැසියේ දහම් රැක්ම යෙහේ ජෙව්වී
මොක්සැප සත්තය් ඉන් ලැබේ කියව් මෙයි තෝස්වී

---

## දසවෙනි ගීතය.

වෘත්තය—මෝරිත තත්තෝම්ජ්.

1 මෝරණ් බවයේ දුක් සින්දු ඇවේ
තෙනුලොසෝ පියතුම් සුදෙවුන්ටා දැවේ
ගුම් නාද දුන් රංගා හෑ නාදි එක්වී
මේලොව සැසි ඉසඳුනකල්හි නොස්වී

2 රූපෙකි ගතරන් දුල් මායාදේවී
ලුම්බිනි උයනේ වැදුවා ඒ සැසි
සංගීතයෙන් ලංකාවාසින්ට තෝර
ආදරයෙන්ම පවසමු දන්වා මේවා

3 සින්දර නිරයේ වන්... ම්වතා සාධු
දෙව්ලෝවාසිහු ... නාස් තුති දුන්නෝ සාධු
පසිඳු රුවදුන්නෝ සැසි උපන්දා
ආදරයෙන්ම පවසමු දන්වා මේවා

4 වේදතු බමුණෝ විත් සිනේ තෝරා
දුක්නාහු සිදුහත් බුදුවන් බැව් තෝරා
ශ්‍රී බුධරජේන්ද්‍ර, ඊක්වී සැවෝමා
මුක්තක දේහයෙණ නමදිම්මෝ ප්‍රේමා

---

## 11 වෙනි ගීතය.

වෘත්තය—ඩගරි ඉණු යාරිදේ, කරෙමොරි

1 වැඳගණු ලෝවාසී-මුණිපද
වැඳගණු ලෝවාසී
සතාංධර්ම ලෝකයාට දුන්න පෙන්වලා මෝක්ෂ

2 අද දින සැසිගේ-උපතය
සිදුවිය මේ ලෝකේ
ශාක්‍යවංශ සාගරේට පෑව චන්ද්‍රයා සැසි

3 මන්කොඳ ලෙව්වන්ගේ-මුණිසඳ
නදදුනි එක්රංගේ
ලෝකනාථ භාග්‍යවත් බුදුන්ට වන්දනාමාන

4 ඝෝරතර සංසාරේ - බියරැස
හල මුණි මෙවාරේ
සාධුකාරදී වදින්ට සැහෙ ලෝකවාසීන්ට

---

## 12 වෙනි ගීතය.

වෘත්තය—සරිඝරිගරිනරි ණිදපදං

1 බලමොල මරයුදයෙන් දිනලා
සව්නේ දත් මුණිඳු ලඳ
සතට මෝක්‍ෂය දක්කු ර
කදිම තමා හළදප් පලනා
මුණිසඳු සරණේ ගන්ට සොඳ
සංසාරේ දුක ගන්ට සිඳ

2 අටජ්ඝ දූනගෙණ කල්යවනු
සැසියේ සරණේ වසනු
ලොවට ශාන්තිය දුන් පසැසා
දෙසුව දහම් දිවගේ සරසා
වැඳ මැන සිරසේ දෝත සඳ
සැසියේ සිරිපාද මෙඳ

3 මෙදියත සතනට සෙත් සැදෙනා
සැසි දුන් දහමේ සරණී
මුදුන දෝත් බැඳගම්මු මෙඳ
සොඳින දැනා එකී අත්විසඳ
ජයකොඩි ලොවේ නංගවමු
දම්පාලා කුදිමුත් මඩමු

4 අකැඹුලලෙස දූත නේමඩලා
ලෙව්වන්ගේ දුක සංසිඳලා
ශාසන සැසි ලොවේ

රසික සතුන් සරණෙහි බැතිනේ
ගණුමැන සිරසේ දෝත සඟ
මේ කවි තුන් සරණේ නිබඳ

---

## 13 වෙනි ගීතය.

'වෘත්තය—තාර්වල්ලිපාරනේතු'

1 පෙම් බුද් සිල රම්‍ය ලෝකවාසියී
ලෝකවාසියි රසිවි දූත් ලෝකවාසියි
පෙම් බුද් &c.
ජිත්සිදිණි ලකුණෙණ සුසිරුවඩින ශ්‍රී මුණීශ්වර
දින් සනි මෝක්‍ෂ ලත්ට පාරමී දැකම්පුර

2 පැම බසුයා විලාස-මායරජිනි
මායරජිනි රුවින් ගත්-මායරජිනි
පැම බසුයා &c
සිල්ලවරල ලකුණෙස ශ්‍රී-සරපල් සිකි දක්කමින් මුහු
වැදුමාස බෝසැපෙන්ම ලුම්බිනී වනෙන් පුතු

3 සංවතුසහිතාද දිදි-බෝධි ගීතිකා
බෝධිගීතිකා-කියවි දූත්-බෝධි ගීතිකා
ලසාදිවටි සෙත්සල මුණිඳුතුම් ගුණ වණිකාවෙනා
මෙම ගීත ප්‍රීතියෙන්ම ගායනා කරවි දූනා

4 මෝහ අන්ධකාර සුන්‍යවිය මේදිනේ
විය මේදිනේ ලොවෙන් සුන්විය මේදිනේ
මෝහ අන්ධකාර &c
දම්රැසිති නන්දන හෙදියබෙප්රවිනේ කිරසරු
බුම්ලෝක් ලෝකවිය මංගලම් කියවි කිරා

---

## 14 වෙනි ගීතය

වෘත්තය—යාපිරතනුමුසේයාර්

සාධුකදදී මුණිඳුගේ සිරිපා සරා-සාධු වදිවි
කොණ්කර මිරිහදගම
දූනා මුණි සිව්සස් උතුම්

# සිරිලක බෝ උපත

හෙවත්

ශ්‍රී මහා බෝධීන්වහන්සේ

ලංකාවට ගෙනාවාවූ

# පිළිවෙල කථාව.


ආර්ජ්. පී. අමරසිංහ

සහ

පී. ජේ. කරුණාධාර යන

අපවිසින්



වැල්ලන්පිටියේ

විද්‍යාසාගර යන්ත්‍රාලයෙහි

අච්චුගස්වනලදී.

ශ්‍රී බුද්ධ වර්ෂ 2446.

1902.

# සිරිලක බෝ උපත

හෙවත්

## ශ්‍රී මහා බෝධීන්වහන්සේ ලංකාවට ගෙණා

# පිළිවෙල කථාව.

වී රං විසාරද මපාර ගුණම්බුරසිං
ධී රං ධරෙ පමධීහිං පිරධම්මකායං
පා රං ගතා භව භයාකාර සාගරස්ස
සා රං ජනෙසු සුගතං සිරසා නමාමි.

සා රං සුරදුමනිභං සතාරම්රතනං
පා රං දදතාමනසං පරමං රසාන්තං
සො රං ජරා මරණ රොගනුදංගදංයං
සු රං මහාසුර සධම්මවරං නමාමි.

සා රං සුර සුරනරම්හිත පුඤ්ඤක්ඛෙත්තං
සු රං පරයන ගුණං කාරුණාගුණගණං
භා රං ච චාරුවර සංවර ධාරිනෙකං
දු රං ගණං දුරිත වෙරිගණං නමාමි.

1. සරණ පලමු ගව්තම මුනි සරණා
සරණ දෙවනු දෙසු සදහම් සරණා
සරණ තෙවනු මහ සඟගණ සරණා
සරණ ගනිමු අපි මෙම තුන් සරණා

2. සිරිමා බෝමුල අප මුනි බුදුට 〃
සිරිමා සත නම මිහිරකි සැමදි 〃
සිරිමා බෝදිය ලකතුල පිහිටු 〃
සිරිමා පිළිවෙල කියනෙම් සතුටි 〃

3. ග  ච්  තම පිරිනිවි දෙසියක් වරු  සේ
කී  ච්  ගණිනින් තිස්හයකුත් පිවි  සේ
ලෙ ච්  දන වඩිනා එපොසොන් මා  සේ
ස  ච්  සිරි මිහිඳුන් තෙර වැඩියස  සේ

4. වැ ඩ ලා  අහසින් ලකතුල එදි  නා
ක ර ලා  අදිමන් පැතිස්නර  නා
එ ක ලා  සක්‍රජ ගෙණ ආ බැව්  නා
දෙ ස ලා  මුනිදම් පැහැදුව ඇසි  නා

5. එ සි න්  පසුව ලක සසුනය වැඩු  නා
උ තු න්  දනෝ සැම පිළිගෙණ තොසි  නා
ය සි න්  වෙහෙර කරමින් ලක එදි  නා
නි ව න්  ලබනලෙස පතමින් උන්  නා

6. අ නු ලා  බිසව්ය දහමට සුපැහැ  දු
එ ක ලා  මහණය වෙන්නට සිතන  දු
ක ප ලා  හිසකෙස් මහණකරන ලෙ  දු
වැ ද ලා  තෙරිඳුට කීවයි මනන  දු

7. එ  බ ස  අසා අප මිහිඳු තෙරි  ඳු
ස තො ස  රජුම කීවයි මනන  ඳු
එ  ලෙ ස  ගැණු මහණය කරම්  ඳු
ය  ස ස  මෙමට බැරිවේය නිරි  ඳු

8. එ  නි සා  දඹදිව අප පිය රජ  ටා
ස තො සා  මේබව දැන්නුව කල  ටා
ය  ස සා  මාගේ නැගනිය සතු  ටා
මෙ දෙ සා  එවතිය බොරු නොව යස  ටා

9. මෙ හෙ නි  සස්න ලැබු සංගමිත්තය  න
දු  වෙ නි  ඔබගෙ එව්වොත් සිත සතොසි  න
අ  වෙ නි  නැතුව ලක මෙහෙණින් කරග  න
මෙ වෙ නි  දෙසේ සිරි පතුරයි නොපම  න

10. ළී ය ලා  මෙලෙසින් පතකුත් දී  ලා
කී ය ලා  තම ඇමතියහට සිය  ලා
නුමු ලා  මේ පත දෙනු වැඳවැටි  ලා
එ ක ලා  ඇමතිය ඇරි නැව්නඟ  ලා

11. දු ව ලා  ඒ නැව රුවලින් යස  සේ
එ ක ලා  ගිය දඹදිව නම් දේ  සේ
බැ ස ලා  ඒරට රජ දැක දෙ ඇ  සේ
වැ ඳ ලා  මේපත දුන්නයි විග  සේ

12. බ ල මි න්  ධර්මාසෝක එරජ ප  න
ක ර මි න්  ඇමතිට ඉස්තුති නොනැව  න
කී ය මි න්  තම ඇමතින්හට මෙපුව  න
සො ය මි න්  උපමා සිටිනාකල යු  න

13. උ තු න්  එබෝමුල මරසෙන් බිඳ  ලා
පැ තු න්  බලෙන් බුදුබවද ලබා  ලා
ඉ ති න්  එසතියක් නෙත් පුදකර  ලා
බු දු න්  මෙලෙස අදිටන් කෙරු විජු  ලා

14. බෝ දි ය  දකුණේ සාකාවක් ගෙ  න
වී රි ය  බලයෙන් ලකතුල පිහිට  න
සු රි ය  කුල මුනි අදිටන් කරමි  න
කා රි ය  දැක මොග්ගලි මහතෙර ය  න

15. ම හ තෙ ර  මොග්ගලි නිරිඳුට දෙසමි  න
පෙ ල හැ ර  කර රජ නික්මුනි යනමෙ  න
ස ක් සු ර  විලසින් සැරසී එමදි  න
සි ත යු ර  පැලළුප් නුවරින් නික්මු  න

16. ප ස් රි ය න ක්  උස එගණ රණි  න් නෝ
න ව රි ය න ක්  වටකර දිලිසෙ  න් නේ
තුන් රි ය න ක්  පලලින් ඇතිව  න් නේ
එ අ ට හු ල ක්  ගණකමද තිබෙ  න් නේ

17. මෙ ලෙ ස  කටාරම අරගණ සිතු  සේ
අ  ලෙ ස  නොවී මග ගෙවමින් විග  සේ
ස තො ස  සිතින් ගොස් බෝමැඩ පිවි  සේ
වි  ග ස  තේවර පැදකුණුකොට සස  සේ

18. අ ට තැ න  වැඳවැටී අවසර අරගෙ  න
ර න් හි න  තබමින් පුටුවට නාගමි  න
අ න කි න  හිරියල් තෙමූ තෙලියක් ගෙ  න
ස්තු ටි න  බෝකඳ ලකුණක් කරමි  න

19. ඇ ඳ ලා  වට ඉර වැඳ වැටෙමි  න් නේ
කි ය ලා  කන්නළු රජ අඩමි  න් නේ
සි ය ලා  දෙත බලමින් එති උ  න් නේ
කා ප ලා  ගත්ලෙස වෙන්වී ස  න් නේ

20. එ ස ල කු ණෙ න්  බෝරුක වෙන්වි  ලා
එ ග ණ ර ණෙ න්  පුටුවේ තිබූ ලක  ලා
එ සි රි උ තු න්  සැල තුලටම වැඩ  ලා
එ වි ට සැ තෙ න්  මුල් ඇදුනසි පතු  ලා

21. ස ව න ක්  ගණ බුදුරැස් විහිදෙ  න් නේ
වි ග ස ක්  බඹලොව පටන් දුව  න් නේ
ර ග ස ක්  ලෙස මේ පොළව නාට  න් නේ
නි ම ය ක්  නැතිලෙස පුදුම දකි  න් නේ

22. උ ත්  තම මුනිඳුගෙ අදිටන් බලය  ට
ස ත්  තව බෝදිය නැගුනසි අහස  ට
ස ත්  දවසක් යනතුරු කිසිකෙණෙකු  ට
ඇ ත්  තට නොපෙනී අහසේ වැඩසි  ට

23. මෙ සේ  එබෝරුක අහසේ සිට  ලා
දෙ සේ  නොයෙක් බුදුරැස් පතුරා  ලා
වි සේ  සයෙන් සත්දවස ගෙවී  ලා
ය සේ  ලෙසට වැඩී දෙරණට නුමු  ලා

24. ප වර බෝදි දෙරණට වැඩි සැනි නා
කු මර චන්ද ගුත්තය නම් කිය නා
කෙස ර සමින් සැදු බෙරයක් රැගෙ නා
අ දර සිතින් ගැසුවයි නෙකහඬි නා

25. මෙම ප්‍රතිහාරිය දැකලා නර නා
සැ ම පිරිවර සමගින් සන්තොසි නා
නි ම නැති දඹදිව රජසිරි පුද නා
න ම බිසවුන් සැම ඒබව දකි නා

26. එ ලෙ ස් එරජ සිරි පිදුවා දකි මි න්
සො ලො ස් දහස පිදු අබරණ ගණි මි න්
ද හ ස් ගණන් රජ ඔටුනුද පුද මි න්
මෙ ලෙ ස් සතියකුත් සැමදෙන වදි මි න්

27. ඉ න් පසු ධර්මාසෝක නිරි ඳු
ස න් ග මිත්තා තම දූවනිය කැ ඳු
තු න් ග මෙ බෝදිය වඩමින් නා ඳු
ග න් බිර ලක නුඹ යනුය පබ ඳු

28. අ නු ලා බිසවිය මහණය කර ලා
නු මු ලා බෝමැඩ පිහිටා වැඳ ලා
දෙ ස ලා දහමය සතහට මෙක ලා
නි ම ලා ශාසන පතුරණු නෙප ලා

29. නි ය ම කලා රජ මෙලෙසින් දුවනි ට
සු දු ම අසුන් යොදමින් රන් රතය ට
පු දු ම එබෝදිය වඩමින් සහතු ට
එ හෙ ම ගෙනාවයි පැළළුප් නුවර ට

30. ත බ මි න් විසිතුරු මන්ඩප මුදු නේ
ක ර මි න් සතියක් පූජ නොමි නේ
ය ස සි න් ගංගානම් ගඟ තිබු නේ
එ රු ව න් නැව පිට තබමින් තොසි නේ

31. ඝ ණ ර න්  නැව රුවළුත් ඇද එමදි  ක
ගෙ ව මි න්  සත්දවසින් සින්දුව ව  ක
තොට න න්  තැඹිලිය මුහුදුතෙරට ගෙ  ක
ක බ මි න්  මන්ඩපයක් සරසාංග  ක

32. දෙ වි ය න්  ගෙණදුන් අනෝතත්ත ජ  ළ
ඉ සි මි න්  අබිසේකය කර එමක  ළ
මු නි ඳු න්  පිරිනිවි දෙසිය සතිස්ක  ළ
ග ණ නි ත්  උඳුවප් මසයෙදි සුනිම  ළ

33. තු න්  ග එබෝමැඩ පැන් වඩනාමෙ  ක
ව න්  ස එසූරිය බිසවුන් සිව්දෙ  නා
න න්  ගරු කුමරුන් බෝදිගුත්ත ය  නා
ග න්  බිර එක කුලයෙන් අට අටදෙ  නා

34. මෙලෙසින්  සූවිසි කුලයක් සදමි  නා
සතොසින්  සුමිතය කුමරුට අණඳු  නා
වි ග සි න්  විදුරිඳ නාරජ  ගෙණෙමි  නා
කි ය මි න්  සමුදුර බෝ රකිනාමෙ  නා

35. ස හ තො ස්  ළෙස මෙම කරුණු සඳ  ලා
අ ට  ලො ස්  දෙවතාවන් ගෙන්නා  ලා
එ ම  ලෙ ස්  බෝදිස බාරය කර  ලා
පි රි  ලෙ ස්  කුමරුන්හට සැළකර  ලා

36. ග ණී මි න්  බෝදිය තිබූ රන්සැලය  ද
බ සි මි න්  මුහුදට නරනිඳු එමස  ද
න බ මි න්  සැරසූ නැවපිට එකළෙ  ද
න ග මි න්  දුවතින් නැවටම පිරිස  ද

37. කු ම රු න්  ගුත්නය සුමිතය දෙදෙ  නා
න ග මි න්  මේ නැවටම සන්තොසි  නා
කු ළ ය් න්  වෙන වෙන ගණිමින් එදි  නා
න ග මි න්  වෙන නැව්වල එම සදි  නා

38. කරවා මෙම වැඩ පිළිවෙල සොඳ සේ
නිමවා කාරණ නරනඳු විග සේ
ඛණවා මෙතරින් ගිය අය නොළ සේ
කිව්වා අරිටය ඇමතිට මෙලෙ සේ

39. සුපසන් බෝදියහට මම මෙලෙ සේ
කැප කෙරුවෙමි මගෙ රජසිරි සතො සේ
අප කුල කාරණ බලමින් සොඳ සේ
තොප නිරිඳුන්හට පවසනු යස සේ

40. මෙලෙසින් කියලා ගිය එම ඇමති ට
සතොසින් ඉදුවාලා එම නැවපි ට
අඹමින් බෝ වැදලා වරගෙණ තු ට
විගසින් පාකෙරුවයි මහ මුහුද ට

41. එනකල මුහුදේ නැවපිට බෝදිය
සුනිමල නාගයො දුටුවයි බෝදිය
එම කල නොපෙනෙන්නට එම බෝදිය
නයිකැල අඳුරට යටකෙරු බෝදිය

42. සන් ගමිත්තා තෙර ඒබව දැක ලා
බන් ග කරණලෙස නයිකැල අල් ලා
ගන් බිර ගුරුළෙකු වේසය මව ලා
පෙන් නු නයින්හට නෙත් යොමුකර ලා

43. කනසේ හදමස් නයිකැල අල් ලා
විගසේ නයිහට පෙණුනයි එක ලා
අහසේ සිටිනා ගුරුළා දැක ලා
විගසේ දිව්වයි පස්සත් නොබ ලා

44. ඉවත දුවල බලමින් තම පස් සේ
නැවත ඇවිත් වැන්දයි සිත දුක් සේ
පුවත මෙලෙස කියමින් එම විග සේ
කියත මෙසේ කාන්නාළු උන් යස සේ

45. මු ච ලි ඳු  දරණේ මුනිවැඩ උන් නා
සු ග ති ඳු  අපහට තලිසත් දුන් නා
නා ර දු  නාන්දය දූමුවසි දම නා
මෙම බ දු  ලෙස මුනි අපහට කරු නා

46. මු නි ඳු න්  මෙමලෙස අනුකම්පාක ර
ස තො සි න්  අපහට දෙසු දම් මතාහ ර
අ පි දූ න්  කල මේ වරද සමාක ර
නු ඹ දූ න්  බෝදෙනු සත් දවසට නි ර

47. පො ල වෙ න්  යට තිබුනත් මම ගණි මි
අ හ සි න්  උඩ තැබුවත් එය දකි මි
නොපෙනෙන්  නට තැනකුත් නැතනොසිත මි
එ බැ වි න්  බෝදිය නොපහට දෙන්නෙ මි

48. කි යා  මෙලෙස බෝදියද දෙම් න් නේ
ගි යා  අරන් නයි එපෙළහරි න් නේ
නි යා  නාගබවනේ වඩිම් න් නේ
මෙ යා  කාර සත්දවස ගෙව න් නේ

49. ස ත්  දවසද ගණනින් පසුවෙමි නා
යු ත්  ලෙස බෝදිය ගෙනෙමින් දුන් නා
ඇ ත්  තට එම දවසේ නැව දුව නා
ස ත්  තට ලක්දිව පැමුණුනි එදි නා

50. ද ඹ කො ල  පටුනට ඒ නැව එනදි න
තෙ ද බ ල  මිහිඳුන් තෙරිඳුගෙ අණසෙ න
සි රි බ ල  බෝදිය මුහුදේ දිලිසෙ න
සු නි ම ල  පැතිස් රජ්දූක එමදි න

51. අ නු රා  පුර සිට අඹකොල පටුන ට
ස පු රා  වීදිය සරහා මොනව ට
අ ඳු රා  එක දවසින් නොටමුනය ට
එ ව රා  ආවසි රජ පිරිසක් කො ට

52. රු වි න් නැවේ දිලිසෙන බෝදූක ලා
පි ණි න් සපිරි රජගේ සිත පිරි ලා
ගො සි න් දියේ කරවටක් පිනා ලා
නැ වි න් රැගෙණ බෝ හිසපිට දර ලා

53. ස තු ට බෝධි ගුන්තය නම් කිය නා
රු ව ට ආව සිටුවරු සහ එදි නා
ගොඩ ට රැගෙණ බෝදිය සන්තොසි නා
ය ස ට තැබිය තැනූ මන්ඩප මුදු නා

54. ත බ ලා රන්පුටුවක මනන ඥා
ක ර ලා බුහුමන් රජ වඩිම් ඥා
එ ක ලා රජ දොරටුව ළඟ න ඥා
ඉ ඳ ලා තුන්දින ලක පුදම් ඥා

55. ඉ න් පසු රතයට බෝදි වඩ න් නේ
ය න් නට නික්මුනි එපෙල හරි න් නේ
තු න් මුනි නසිහට දම් දෙසම් න් නේ
ව න් තැනදී සඟනට දන්දු න් නේ

56. මෙ ලෙ සි න් බෝදිය අනුරපුරය ට
ස තො සි න් ගෙණගොස් රජවාසලය ට
ග ණි මි න් මහමෙව්නා නම් උයන ට
ස තු ටි න් කලදේ අසනුය එමවි ට

57. මි න් පෙර කකුසඳ කෝනාගම ය ත
ග න් බිර කක්සප මුනිඳුන්ගේ ගු ත
නන් ගරු බෝදිය පිහිටුන තැනව ත
පි න් සිරි ඉඩමට අරගෙණ සතොසි ත

58. එ ර න් කවාරම පිටින්ම සතො සේ
අ ර න් ගොසින් බිම තැබුවයි යස සේ
රු වි න් එනන අසූරියනක් විග සේ
උ තු න් එබෝදිය වැඩියයි අහ සේ

59. වැ ඩ ලා අහසට බුදුරැස් ක ඳු
නි ම ලා දසදිග පතුරවමි ඳු
එ ක ලා බඹලොවතෙක් දුවමි ඳු
දූ ක ලා දසදහසක් ජනයි ඳු

60. පී ති සි ති න් පිනමින් එම සඳි තේ
ගී ත න දි න් හඬදුන්නයි තදි තේ
බිත නොව න් රහසත් බව ලැබූ තේ
එසිත තොසින් මහණයවු එදි තේ

61. සු ර බඹ පිරිවර සිටිනා එදි තේ
ඉ ර බසිනාතුරු සිට බෝ ගුව තේ
නි ර ලෙසිනා බසිමින් එම සඳි තේ
දෙ ර නට සත්රියනක් උඩතිබූ තේ

62. දු ටු වා ඒබව පැතිස් නර ණා
ඇසූ වා රහතුන්ගෙන් කිමකරු ණා
කිවූ වා සඟගණ උපදෙස එදි නා
නැබූවා රන් සැල් සත එක්උඩි නා

63. එ ක පි ට තබමින් සිටිනා කා ලේ
ම තු පි ට තිබූ සැලතුලසට තිම ලේ
ම න තු ට රෙහෙනේ නැකතින් එක ලේ
වි ග ස ට පිහිටුනි බෝදිය පත ලේ

64. සි ය ල දනන් බලමින් සිටිනාක ළ
එ ක ල එබෝමුල් ඇදුනායි මනලො ළ
ප ත ල කටාරම උඩිතුත් ගියක ළ
ප තු ල පලා පොලවේ බැස්සයි මූ ළ

65. අ හ සි න් දෙවියෝ දිව්‍ය කුසුමන්ගෙ න
එ ක සි න් මල්වැසි වැස්සු එම දි න
වි ග සි න් සීතල හිමකැටි අවුදි න
සැනකි න් වහගත්තයි නොපෙනෙනමෙ න

66. දෙ ව් ලොව දෙව්යෝ සතුටුව එදි නා
ස ව් සිරි සුවඳින් පිදුවයි තුටි නා
සි ව් දිග නොපෙනීගන යන ලෙසි නා
දෙ ව් වලහක සත්දවසක් වසි නා

67. ග ණ නි න් සත්දවසක් පසු උනක ළ
මි හි ඳු න් මහතෙර සමගින් තෙදබ ළ
ම් නා ර න් සංඝමිත්ත එසුනිම ළ
මෙ හෙ ණි න් සහ අප පැතිස් රජලො ළ

68. ඇ ම ති න් රුස්වී පිරිවර එක සේ
බ ළ මි න් බෝමැඩ සිටිනා ද්ව සේ
ද කි මි න් බෝපල පසඛුත් යස සේ
වි ලි කු න් පලයක් වැටුනයි විග සේ

69. මි හි ඳු න් මහතෙර අත පැසැනි නා
ඇ වි දි න් ඒපල අතටම වසි නා
දෙහොතින් ගෙණ තෙර අදිටන් බෙලෙ නා
නි රි ඳු න් හට දුනි වවනා ලෙසි නා

70. නි රි ඳු රුගෙණ පල සුවඳ පැනි න් නේ
න රි ඳු විසල නහවා විගසි න් නේ
සි නි ඳු සුවඳ පස්ගෙණ දමමි න් නේ
පු රු ඳු ලෙසට සිටුවා බලමි න් නේ

71. දෙ වි ය න් රුස්වී රුකවල් උ න් නේ
සු ද න න් තැන තැන වඩිමින් උ න් නේ
ර හ තු න් සිත සන්තෝස වෙමි න් නේ
වි ග සි න් පැලඋනි බෝදි යසි න් නේ

72. ප ව ර උතුන් මුනිඳුගෙ අනුහසය ට
ස ත ර රියන් උස පැලඋනි බෝඅ ට
එ ව ර නිරිඳු දකිමින් තම දෙනෙත ට
ඉ ව ර නොවනලෙස මහඵපළ රකො ට

73. එකක් එ ථූපාරාමේ පිහිටූ
එකක් එ දඹකොල පටුනේ පිහිටූ
එකක් තවක්කය නම් ගම පිහිටූ
එකක් ඉසුරුමුනි වෙහෙරේ පිහිටූ

74. උතුන් අනුරපුර පව්රෙන් පිට වා
කොලොන් හො ඒ තෙර එකකුත් පිහි ටා
යසින් කතරගම එකබෝ සත වා
සඳුන් නරුවගම ඇති එක දූන ටා

75. මිහිත් තලාගල අන්තිම එක ඒ
ඉතින් එබෝ අට මෙලෙස පිහිටි ඒ
උතුන් නිරිඳු සිත සන්තොස උනි ඒ
නිවන් ලබනාලෙස ඒරජ පැති ඒ

76. මනරන් බෝදිය තිබුනු යසි න්නේ
සතරින් ඒපල මෙලෙස වෙම් න්නේ
එකකින් අට අට බෝ පැලවෙ න්නේ
ගණනින් දෙතිසක් සැදුනි ඉති න්නේ

ඒ පැල උනාවූ තිස්දෙකක් බෝදීන්වහන්සේලා මෙලෙස පිහිටුවන ලද්දේය. එනම්, මල් වැස්සා නම් වෙහෙර එක නමක්ද,තන්ත්‍රිමාලේ එක් නමක් ද,මහාජල්ලික නාම් කෙවුල්හම එක් නාමක්ද, කොච්චියාරම නම් දනව්වෙහි එක් නමක්ද, පොලොන්නරු වෙහෙර එක් නමක්ද, රුසිගම් වෙහෙර එක් නමක්ද, මාගම් වෙහෙර එක් නමක්ද, විල්වල නමක්ද, මහියංගනයෙහි එක්නමක්ද, සේරුවාවිල නමක්ද,විල්ගම් වෙහෙර නමක්ද, බුත්හල හප්පෝරු නම් වෙහෙර නමක්ද, සිතුල්පව්වෙහෙර නමක්ද, තංගළු වනවාස විහාරයෙහි නමක්ද, වැලිගම් වෙහෙර නමක්ද, ගාළුපුර පරගොඩ වෙහෙර නමක්ද, මැද්දේගම වෙහෙරඑක් නමක්ද,ගතේගම නමක්ද,

පුසුල්පිටි වෙහෙර නමක්ද, මායාරට වතුරනම් ගම නාමක්ද බෙලිගල් වෙහෙර නාමක්ද, බෙල්ලන්විල නාමක්ද යන පිළිවෙලින් වඩුරවය, වට්ටාරමය, රජමහ වෙහෙර සුළුගල්ලය, රුස්වේරුවය, කටිකාවය, ගිරිබාවෙහෙරය, සාපවුසුනැරගිරි පර්වතය, කාසාගළු වෙහෙරය, රන්ගල් වෙහෙරය, යන මෙකී ස්ථාන වල දෙතිස්මහා බෝධිසිහිටුවා ඒ දෙවෙනි පෑතිස්ස මහරජතුමා ඉතා සන්තෝසයෙන් නිවන්සැප ප්‍රාර්ථනාකළේය.

යොයං දුම්න්දංයති නාන්දහොන
සම්පූජිතං පූජයතෙ සපඤ්ඤ
ස හොගවා හොති අතීතකොම
සබ්බාසු සො හොති පසත්ථරූපො.

යනුහෙයින් බෝධි පිහිටුවා ශාසනාධාරව දිවුනු කල්හිවූ යම් ශ්‍රද්ධාවන්ත ස්ත්‍රී පුරුෂ කෙණෙක් ඇත් නම් මහ බෝමළු ඇමදීම් වැලි හෙණවූත් මළුවෙහි දූම්ම් පැන් පෙරයණවුත් බෝධියට වත්කිරීම් යටත් පිරිසෙයින් වියළී වැටුනාවූ පත්‍රයක් පවා මළුවෙන් ඉවත්කළ තැනැත්තාට මේ ජාතියෙහි රෙගපීඩාදි කිසි උවදුරක් නොව දේවතාරක්‍ෂාධි ආනිශංස ප්‍රතිලාභයට පැමිණෙන්නේය, ඉන් මිදී මිය පරලොව ගියකල මහත් උදාරතර භවභෝග සම්පත්තියෙන් අමුඹිව සැපතට පැමිණෙන්නේය. මෙවෙනි ආනිශංස ගෙණදෙන්නාවූ බෝධීන්වහන්සේලාට ආදරයෙන් මල් පහන් පූජාකොට මතු මෛත්‍රී බුදුරජාන්වහන්සේ දැක බන අසා බුදු පසේබුදු අනීත් යන තුන්තරා බෝධියෙන් එක්තරා බෝධියකට පැමිණ අජරාමර අමෘත මහා නිර්වාණ සම්පත් සිද්ධකර ගතයුතුයි.

ආකාසඪාච භුම්මඪා–දෙවානාගා මහිඬ්ඪිකා,
පුඤ්ඤං තං අනුමොදිත්වා–චිරං රක්ඛනතු සාසනං.

# දැන්වීමයි.

අප සම්‍යක් සම්බුද්ධ ගෞතම සර්වඥරාජෝත්තමයාණන්වහන්සේ මාරපරාජයකොට ලොවුතුරු බුද්ධත්වයට පැමිණීම සඳහා පිටදී වැඩලාවූ ජයශ්‍රී මහා බෝධීන්වහන්සේගේ දකුණු ශ්‍රී සාඛාව ලක්වැසි, සියළු බෞද්ධයන්ගේ මව් භූමියවූ අනුරාධ පුරප්‍රවරයෙහි අති මනෝහර මහාමේඝනා නම් උයන්හි පිහිටා තිබෙනබව බෞද්ධ ස්ත්‍රී පුරුෂ සියළුදෙනාම විශ්වාස කරත්. නමුත් එය ලංකාවට ගෙණෙන්මට හේතුව මොකද? ගෙනෙන්නේ කව්ද? එසේ ගෙණ එන්නාවූ කල මාර්ගයෙහිදී වූ ආශ්චර්යයන් මොනවාද, පිළිගත්තෝ කවුද, පූජාකළේ කව්ද, යනාදි කාරණා දත් බෞද්ධ පිරිස ඉතා ටිකනිසා සැමදෙනාටම දැනගැණීම පිණිස එහි විස්තර කථාව සිංහලට නගා කවියෙන් වර්ණනාකළෙමු.

මෙහි මතු අයිතිවාසිකම කවිකර අවුගස්වතලද අපටම තබාගනිමු.

ඇ. ජ්. සී. අමරසිංහ.
පී. එජ්. කරුණාධාර
වන අප විසිනි.

වර්ෂ 1902 ක්වූ දෙසැම්බර්
මස 23 වෙනි දින දීය.

# සංඥාපනිත්‍ර.

# PREFACE.

සුරසොඬ සන්දේශයනම් මෙම කුඩා කව්පොත මාතර සිට මහනුවර රේන්දරාල කෙණෙකුට බෙබද්දෙකුඅත යවන පණිවිඩ වචනයන් පරිද්දෙන් යොදනලද්දකි. නුමුත් පොත සම්පූර්ණකර න්ට මත්තෙන් කර්තෘවන ජෝන් පේද්‍රික් කොරයා දෙව්ගැතිතුමා කාලක්‍රියාකළබැවින් කව්සාදා තිබෙන්නේ මාතරපටන් කොළඹ දක්වා පමණකි. මෙම කවි 1857 තේදී ප්‍රසිඬ කරණලද ලඬකානිධා නයනම් සඟරාවේ වරින්වර ප්‍රසිඬ කරතිබේ.

මෙම කව්බැලීමෙන් ලංකාවේ එවකට ඒඒගම් තුබුන ප්‍රසිඬ ස්ථානද පැවති අන්දමද මනාසේ දැනගන්ට පිළිවන්වේ. තවද ඒඒ ගම් කුමක්ගැන ප්‍රසිඬව තුබුනේදයන බවත් දැනගත හැකිවේ. එබැවින් මෙම පොතෙන්ද අන්‍ය සන්දේශ පොත්වලින් ප්‍රධාන ව... යෙන් ගතහැකි ප්‍රයෝජනය ගන්ට පිළිවන්බැව් සතුටින් කියමු ... මෙය බීමත්කමෙහි නින්දිතභාවය ප්‍රකාශකිරීම සඳහා රචනාකරණ ලද්දක්බැවින් සැමදෙනාටම එකාකාර පහසුවෙන් තේරුම්ගතහැ... ව්‍යවහාර සිංහල භාෂාවෙන් යොදාතිබේ. ඇතම්තැන ව්‍යාකරණට ... නතන නැතිවාක්මෙන් පෙණීයේ. එ... ... යේ ව්‍යවහාර භාෂාවෙ... ගැලපීමට කැත් කිරිමෙනැයි ... නුමුත් මෙහි කවි ඉ... ... ණීරසායනයවන පරිද්දෙන් රචනාක... ... ඬබැව් නොකියා... ...හැකිය. අපවිසින් මේ පොත ශුඬකළ නුමුත් කාව්‍ය කර්තෘගේ අදහ... ...ල්පයකුදු වෙනස්කිරීමට නොකමැති හෙයින් ව්‍යාකරණට රැ... ...නාවය සමහරස්ථානද වෙනස් නොකළබැව් කරුණාවෙන් ස... ...න්වා.

වැදගත් බොහෝදෙනෙකුගේ ඉල්ලීමපිට මෙය මෙසේ ... නොට කොරයා දෙව්ගැති තුමාගේ ජීවිත කථාවත් අන්තගීතකො... මුද්‍රණයකරවා ප්‍රසිඬකළ බැව් මතක් කරම්හ.

තවද පොත අන්තිමට අපවිසින් රචනාකරණලද කවි පන... යක් යෙදූබවද කියමු.

මෙම පොත ශුඬකිරීමට පොත් සපයාදුන් කොළඹ මාඒදණ ... පිදියේ ගරු. ජේ. ඇස් ප්‍රේරා පාද්‍රි උන්නාන්සේට සහ මීගමු... ජේ. ඩී. පොන්සේකා මහත්මයාටද, කොරයා උන්නාන්සේ... මුල්අත්පොතද ජීවිතකථාව සම්බන්ධ කාරණාද ලියාඒවීමෙ... අපට ආධාරකළාවූ කොරයා උන්නාන්සේගේ බෑනාවන ඩී. ... සිල්වා මුදලිතුමාටද අපගේ අවංක සතුතිය පුදකරම්හ.

ALBERT DE SILV

1893 මාර්තු මස 25 වෙනි දින
කොළඹදිය.

# ජෝන් පේද්‍රිස් කොරයා දෙව්ගැතිතුමා.

## THE REV. JOHN. F. COREA.

විලියම් පලෑක් ලඬකෙශ්වරයානන් විසින් මාතර කච්චේරියේ
ප්පසිකම ඇතුළුව තඩවත් හතරේ මුහන්දිරම්කමට පත්කරණු
බු ජොහන්නැස් කොරයා අභයරත්න ගුණසේකර රාලහාමි සහ
ම රාලහාමින්ගේ ලමාඑකනිවන ක්‍රිසන්ත්‍රිනාද සිල්වා (ක්‍රිසතුවෂී
70ව පමණේදී) ලඬකාවේ මුහුදුබඩ ප්‍රදෙශ ඕලන්දක්කාර
ණ්ඩුව යටතේ පවතින කාලයෙහි කොළඹින් අවුත් මාතර කොටු
නුදුරු පල්ලිමුල්ලනම් ගමෙහි පදිංචිවූහ. මේ දෙදෙනා නො
ම වැදගත් පවුල්වලට අයිති ක්‍රිස්තියානි කාරයෝය. මෙම ජොහ
නැස් කොරයා අභයරත්න ගුණසේකර මුහන්දිරම් මහතා වෂී
00දී පමණ කාලක්‍රියාකෙළේය.

ක්‍රිසතුවෂී 1596 පමණේදී සෙංකඩගල නුවර රජකම් කළ
මලබම් රජයේ සේනාධිපතියෙක්ව සිටි "ඩොමිනිකස් කොරයා" ද
1627 පමණේදී සෙනෙරත් රජ කාලේ සේනාධිපති ධුරයක්
රූ "සයිමන් කොරයා" ද ඉන්මෑත ලංකා ඉංග්‍රීසි ආණ්ඩු යටතේ ලං
වේ බටහිර පලාතේ ප්‍රසිඬ නිලදරු තිපදෙනෙක්ද මේ පෙල
තේ පසුපලමු කුලජ්‍යෙෂ්ඨයෝයයි සලකානිබේ.

මෙම දෙදෙනාගේ දරුවන් අතුරෙන් වැඩිමල් පුත්‍රවූ හැන්රිකස්
ස්තොෆර් කොරයා මහතා මෙරයා ජාකොබ් ඒකනායක නම්කුල
ක් සරණ කරගත්තේය. මේ මහතා නෝර්ත් උතුමානන්වහන්
ස්ගේ කාලයේදී නිලතුණක් දරමින්සිට අන්තිමේදී මොරවක්
කෝරළේ මුදලි තනතුරටද පත්විය. මෙතුමාටද කවිතැනීම පිළි
ක්ව සිට්බැව්පෙණේ. මාතර වැල්ලබඩ පත්තුවකළ අමරසේකර
ලිතුමාට මෙතුමා විසින් යැව් කවියක් මෙසේයි:—

පු පු න් සඳ කිරණ කිරිසිදු හෙළකු න් ද
ලෙයින් යස වදන් සවණට අම මෙ න් ද
වි කු ම් සී අමරසේකර මුදලි න් ද
ද කු ම් නොව ඉදින මෙඅපට සැපකි න් ද

නළුවර ලීවගයක් ඉල්ලායැව්කවියක්:—

රුක බලළුගේ ලෙවකෑ කරවල ලී සී
ගෙයතුළ යම් කිසිදේනැත ගරවේ සී
මුලපද ගණ පසෙහි මැද කුරු ගෙණ පෑ සී
මිට්යට එකනුනර බැඳ එව දෙමි කා සී

වැසිදවසක මගයන ස්ත්‍රියක් ලිස්සා වැටෙනුදැක කී කවියක්

මල්ල ඉසතබා තදකර බැඳ හෙර ලී
බෙල්ල වට ඉපුනූ ගෝමර පෙනි කැර ලී
නල්ල කත ඇඳන්සන සැට්ටෙක වැර ලී
එල්ල කර තුබු අඩියට බිම පෙර ළී

වර්ෂ 1815දී ආණ්ඩුවේ ආඥාවපිට උඩරට සටනනැත එයි යන ගමනේදී ගම්න්ගමට කවි කියමින් ගියබැව් ඇසීමු. නුමුත් එමකවි අපට සපයාගත නොහැකිවිය. ඒ ගැණ සොයනකල අපට ලැබුන කවි දෙපදයක් පමණක් මෙහි බහාලම්හ.

ක මු, වැ ල් ව ල ප ල පි ට අ ළු ඇ ති
ම න නැ ල් ග ම කො ත න ද ඇ සූ පෙ ර
එ පු, සු ල් වැ ල් ල ට අ ප ස පැ මි ණි—
ඉ ර බ ටු න ල සො දි නේ.

ම ද, නැ ල් එ හි සි ට. අ ප සැ ම දෙ න—
ගෙ ණ, වැ ල් ස ඟ වෙ ළු න පො ල් කො ල
පො ළු, හු ල් බැ ඳ ඒ හි නි එ ළි ක ර—
එ ම ය දි න හො සි නේ—

මෙතුමාගේ බාල සහෝදරවූ ජකෝවිස් කොරයා උන්නාන් සේත් කාව්‍යශාස්ත්‍රයදත් කෙණෙක්ව සිප්යේය. එතුමා නාමාවලිය ල්ලා යැව් කවියක් මෙසේයි:—

ගොනාගේ ගමන සුව මඟු ලි දිවිය යේ
උනා ගැණ බලාගත මැද තිබෙන ව යේ
මනාගුණ සොබන ඉතාමැති තුමනි ම ගේ
කනාවැනි මෙමට ලැබුනොත් සියැස ව ගේ

අලුත් නිවිසුමේ අඩංගු අවගාහක යොහන්ගේ ප්‍රකාශ කිරීම් මෙසේ කවිකරතිබේ:—

1 තුමුල සුරිදු පුත්වඩිනට සුරු ව
විපුල ගොතින් ඊශ්‍රාලිතනම් වූ ව
ලකල සොහන් අවගහ තෙම පෙරටු ව
සකල දනන්හට දම් දෙස් මෙබදු ව

2 මෙමට සපුව එන සුර කුමරි න් දු
නිවට නොවෙයි සත පච්මුල සී ස් දු
සතුට වඩන දම් දෙසනි පසි ස් දු
එයට පලමු මා එව්ය සුරි න් දු

3 දන වැනි කළ විට ඒ ඝිම් වැඩ ලා
දන වැනි දන අටුවෙහි රුස්කර ලා
දන ගිනි උදුනෙහි පිටුදන බහ ලා
දන දන සොලනුය ඒ හිමි කුල් ලා

4 පිවිසි දනන් හට මේ ලෙස නිත රේ
සතොස වදන් දී ඉද ගං ඉවු රේ
විගස නැවුලවව් සගවිය නුදු රේ
අලස නොවව් කී ඒ තෙම සති රේ

ජෝන් පේද්‍රික් කොරයා දෙව්ගැතිනුමා ඉහතකී හැන්ට්‍රිකස් ක්‍රිස්තෝෆර් කොරයා අබයරත්න සිරිවර්ධන මුදලිතුමානන්ගේ දෙවෙනි පුතනුවෝය. මෙතුමා උපන්නේ ක්‍රිස්තුවර්ෂ 1820 පමණේදීය. බාලකාලයේදී මෘදු ශරීරයකින් යුත් සුරතල් දරුවෙක්ව සිටියේය. ශරීරය කොපමණ සැහැල්ලුද කිවහොත් දිනක් වෙන ළමයින් සමග ක්‍රීඩාකරමින් සිටින අතර සුලඟට ගහගත ගොස් කෙසෙල් පදුරක රැඳී සිටියබැව් දැනට ජීවත්ව සිටින මෙතුමාගේ සහෝදරියකු විසින් කියන බැව් ඇසීමු.

මෙතුමා බාලකාලයේසිටම තීක්ෂණ කල්පනාවක්ඇතිව වැඩුන බැව් පෙණේ. දොළොසැවිරිදි පමණේදී මෙතුමා බලලෙකුට ගැසූ ල උ? මළේය. මෙය බලවත් පාපයකැයිසිතා පසුතැවිල්ලට පත් වූ ළමයා තමවලවව්වට නුදුරු පන්සැලට ගොස් එම පවින් මිදෙන්නේ කෙලෙසද්දැයි එහිසිටි මහණුන්නාන්සේ කෙණෙකුගෙන් ඇසී ඊට නිසි පිළිතුරක් නොලත් ළමයා ඒ ගැණ බොහෝදුර කල් .නා කිරීමට පටන්ගත්තේය.

ඊට නොබෝ කලකටපසු මහනුවර සිටි තම සහෝදරියෙක් වී ළමයා එක්ව ගොස් එහි පාඨශාලාවකට යවා මනාලෙස ඉගැන්වූවාය. නැවත මහ නුවර විසූ ජෝසැප් හැරිස් පාදිලි උන්නාන්සේ ටතේ ක්‍රිස්තියානි ධර්මය ඉගෙණ බැප්ටිස්ට් නිකායේ දෙව්ගැති යකනුරකට පත්විය.

වැඩිවිය පැමිණි කාලයේදී මෙතුමා ශොභමාන පෙණීමක්ද ධර්මතරමේ උසද ඇති ඉතා කඩිසර උත්සාහවන්තයෙක්ව සිට් ක්වී නුමුත් ශරීර සම්පූර්ණකමක් නොතිබුනබව මැනිදෙකුට යවන ද මෙහි පහතදක්වන කවි දෙකින් පෙණියේ:—

මහතා විකුම් සේකර මුදලි උතුම තේ
මහතා කිස කමට බෙහෙතක් යොදන මෙ තේ
අමතා සුණුවිකක් සපයා ලැබුනොති තේ
දෙනෙනා නැති මෙමට ලැබුනා වැනි තය නේ

හිස් නුබතල දිලෙන කොදනද කරයස ට
පස් මරුහල සඳෙව් ගුණසුනු මැතිසතු ට
අස් ගොදුඅල පිකක් සපසා දුකොත්ම ට
මස් තරකල වැන්න මගෙ ඇට සැකිල පි ඩ

ඉහතක් පරිද්දෙන් මෙතුමා වර්ෂ 1845 පමණේදී බැප්ටිස්ට් නිකායේ දේවගැතියෙක්ව මාතලේ ගම්පොල මහනුවර ආදී ස්ථානවල ස්ථිරලෙස මෙහෙ කරමින්ද නොයෙක් පොත්පත් රචනා කරමින් සහ පිටපත් කරමින්ද සිට වර්ෂ 1850 පමණේදී සියරටට (මාතරට) නැවත පැමුණුනේය. එහි තම නෑදෑ මිත්‍රාදීන්ට ගුණ දනුමැතිකම් කියාදෙමින් සහ යහපත්සේ හසුරුවමින්ද, දුගී ජනයාට උපකාර කරමින්ද සැමදෙනාගේම සිත් දිනාගෙණ ආදර බුහුමන් ලබමින් විසුයේය. දේවමෙහෙයත් සම්බන්ධ වැඩද තම මනාපයෙන්ම කළා පමණක් නොව ආචාර්ය මර්ඩොක් උන්නාන්සේගේ ඉල්ලීමපිට නොයෙක් පොත්පත්ද කෙළේය. නුමුත් මේ ප්‍රයෝජනවත් ජීවිතය වැඩිකලක් ගතකරණු නොහැකිවිය.

මෙතුමා දිඝීායුසලත්තෙක් නොවීය. ගැටවරකාලය අඩුකළ විට ප්‍රසිද්ධ මනුෂ්‍යයෙක් වශයෙන් ක්‍රියාකරන්ට පටන්ගෙණ ගත කළ කාලය ඉතා සවල්පය. නුමුත් ඒ ස්වල්ප කාලය අතරේදී සිසිපරීක්ෂාවෙන්ද, කථාවෙහි දක්ෂකමින්ද, යහපත් හැසිරීමෙන්ද බොහෝදෙනෙකුට පසුනොබසින අභියසට පැමිණ සිටියේය" ඒ කාලයතුල මෙතුමා විසින් කරණලද පොත්පත් ආදියදෙස බලනවිට මෙතුමාගේ උත්සාහ වත්තනම එසින්ම පෙණියේ නවද මෙනුමාගේ කල්පනාද දරසිටි ගුණධගද එසින් ප්‍රකාශවේ ඔවුන්ගේ එලවලින් නුඹලා ඔවුන් අඳුනති'' යන වාක්‍යය මෙහිදී සිහිකටයුතුවේ.

මෙතුමාවිසින් අකීකරු පුත්‍රයාගේ උපමාව, යක්දෙහිවිතය. ශ්‍රීපාදය, දූසමුනුමාලය, දැනියෙල් අනාගත වක්තෘගේ පුවත, යෝනාගේ පුවත, ගීතිකාපොත, වන්දනාකාරයාගේ ගමන, (සිංහල පිටපත) ආදී පොත් රචනාකරතිබේ මේ හැර බේබදුකමගැන බඹාගේ කථාව, තැවැරුම්කාරයාගේ ආරාධනාව, සැරුණ බේබද්දාගේ කථාව, සුරාභූතයාගය, සුරාමුද්ගරය, බේබදු කෝලම, සුරාසොඩ සන්දේශය, ආදී පොත් රචනාකරණලදී. මෙසින් දැනට මුද්‍රණය කරවා ප්‍රසිද්ධ නොකරණලද සුරා මුද්ගරය සහ බේබදු කෝලමයන මාතෘකාවලින් යුත් කවි පක්තිදෙකක් මෙහි අගට යෙදුවෙමු.

මෙතුමා අන්තිම කාලයේදී රචනාකිරීමට පටන්ගත් සුරාසොඩ සන්දේශය සම්පූර්ණයෙන්සාදා නිමකිරිමට මත්තෙන් වර්ෂ 1854දී රෝගයක්සැදී නොයෙක් ඖෂධ කලේවිනුමුත් ඉන් කිසි සුව

ක් නොලැබ ජනවාරිමස 19 වෙනි දින රෑ කාලක්‍රියා කෙළේය. ලක්‍රියා කිරීමට මත්තෙන් යාච්ඤාවක් ඔප්පුකිරීමට ලඟසිටි ජේම්ස් සිල්වා පාදිලි උන්නාන්සේගෙන් ඉල්ලාසිටියේය. උන් නාන්සේ එසේ යාච්ඤාවක් ඔප්පුකොට ඉන්පසු මරණයට භයදැයි මෙතුමාගෙන් ඇසූකල "ක්‍රිස්තුස් හාමුදුරුවෝ මාලඟය; මම භය නැතැ"යි උත්තර දුන්නේය. ඉන්පසු ක්ෂීරභක්තියෙන් පරලොව ර්ජනය කරණලදී.

මේ මරණය සිදුවූනේ මෙතුමාගේ මුත්තා පළමුවෙන් මාතරට ත් පදිංචිවසිටි වලව්වේදීය. මේ ගැන එවකට දෙවුන්දරවිසූ ාවුල් රුද්‍රිගු දෙවගැතිතුමාවිසින් මෙසේ කවිපන්තියක් රචනා රණලදී:—

1 සූපසන් අප සම්බුදුවසින් එක්
දහසින් අටසියක් වෙමින් සිව්
පණසින් මස ජනවරි දසනව
ගුරුදින රැය පැමිණී

වැසමුත් බර සිරිසර මහතොට
නිසකින් වත් මත්කල් කිවිදෙක්
විලසින් නෙක පොත්පත් කව්කළ
සත්වැඩ ඉත්යෙදුනී

වෙසෙසින් රජ දෙස්බස් තතුදත
සූරිදුන් සොඳ බැතිපෙම් සුදිළුන
සොබමක් ජොන් කොරයා දෙවුගැති
සොම්ගුණ නිති රැඳුනී

මෙමැනින් සියකුල මැතිසහ ඉට
මිතුරන් සිත් සොවසිදුමැද හෙව
වදිමින් මරු මුකයට මෙම දින
සුව මොක්පුර පැමිණී

2 සැපතින් මහ දිගුකල් වැජඹෙන
විලසින් හෙබි තරුණගපත්වම
දුටුවන් නිති පියබස්දුන් සොඳ
ගුණැතෙක පළවියේ

බිසහුන්විත් කලමුත් වරඹසු
නොතිරම් ලෙවු දිවිහිම් වනලෙස
සැපමින් තද රුදුලෙඩ ජයලැබ
මරුවිස්සල්වියේ

කුලයෙන් එන අනුකූලක් සිට
බුනුමත් විද ඉතිරිකොලැබ වැස
කරමින් නම පවතින සුබවැඩ
මෙලොවින් පහවිගේ

සිසිවත් සොම්නස රුස්වොරැඳින
සබඳුන් මෙත් විසුකල් සමරව
කවියෙන් මේ එදුපද ලිඡිකල
මහදත් පෙලවියේ

3 සැදැහිලිනිසා දුසිරින් මිදුම ලැබය සේ
අමරසබසා මතසින් නොවෙන්වම වැ සේ
දුකාදුරගසා නෙදිනෙත්රුපුගෙ ඹද රැ සේ
සගපුරදෙසා පවතින් සබද කරතො සේ

4 රුදුරු ලෙඩ වැලඳ නෙදිනෙත් මරුලං ව
මහරු නැසියත් සබඳුන්ගෙන් වෙන් ව
රුදුරු මරුමුවට පත්වම දිවිනිම ව
සොදුරු මොක් පුරෙහි වැජඹෙත් සැපතින් ව

5 සුමිනුරු ගනවතින් සැහැපත් හොබනේ යා
අමයුරු මුදුසිනින් නිනිබස් දෙඩනේ යා
සොහොයුරු නෑ මිතුරු ඇර සැම දෙරනේ යා
දිවයුරු අවරපත් වැනි මැකි නස් නේ යා

6 බොහො[redacted]ලේ මෙමැති දෙව් දහමත් දෙසූ වා
සැ ම වෙ ලේ සමිඳු බැතිපෙම් බැඳවිසූ වා
නොවකෝලේ පසත් පොත්පත් කළඋසු වා
ලො ව ආ ලේ බැනැරමරුවින් දිවිනැසූ වා

7 කුල යෙන් වයසිනේ කෙලෙසකමුත් මෙනු මා
කුළුණෙන් සැමදිනේ විසුසැවි විය අරු මා
මෙලොවින් පහලනේ දෙව්වර පෙරනිය මා
කවි යෙ න් මෙමනැනේ ලිපිකළෙ සුසුවමෙ මා

මෙසේ මෙනුමාගේ ජීවිත කථාව සංක්ෂෙපවශයෙන් ලීමට මෙනුමාගේම කිවිවුවර නැයෙක්වන දූනාව මාතර සිටින වි. හැ. ද සිල්වා මුදලි මැතිතුමානන්ගෙන් බොහෝ ආධාර ලැබුනබැව් නොමසුරු ස්තුතිසහිතව මෙහිදී මතක්කරමින.

# සුරා මුද්ගරය.

1 කා බර බඳු බලල් ඉත්සෑ සිවල් ඌරු මීගොන්
වඳුරු නැළි සතක් හා ඉන් අඩක් වච්වනාභින්
ජයපලහි මිරිස් මත් කන් යුසත් සිව් ලසක්හා
මෙසියල පෙර සී උන්ගේ මුවෙන් සත් දිනෙක්හී

2 සිනිඳුව අඹරා පොල්සේ වටාලා තොවේ ලා
කටුවක සරසා මල්හා බුලත් පානවුල් ලා
බෙහෙන එහි බහා පෝනක් මතේ ගොස්දපා ලා
කටුව ලය තබා ජීවම්කරන් මේකියා ලා

3 ඕං හිරීං සුරාපානයට අරක්ගත් බකුශ්වරයා සහ සුරාදේවීද ත්මේ මල්බුලත් කටුව කැපගෙණ සුරා මුද්නරයට දිළවිලා රා පානොත්තව අකාල මූර්තුවණ්ඩ විකාර මදෝන්මාද වර්දිවිරේ පුසුාව බ්‍රමනිර්ලජ්ජි චලිත විඤ්ජ්ත ඤුදු වෙශ්‍යාලොභාදී කෲර ඹකාර සඹදෝෂ පුලයන්තු ඉමංභෙෂජාති ජීවන්තු ලලිත ළලිත ම්බු කිලම්බු කුරුකුරුයේසි ඒඝවාහඃ—

4 මේ මන්තරෙන් කරජීවම් එබෙහෙත් අරන්ඉන්
මිනොන් සම්න් කළ පැසෙක්හි දමාසුරක්සේ
විතම් යමෙක් හට සුරා මැසනක් නොහේමුත්
දීපත් මෙසින් ගුලියොදමතු දක්වනාමෙන්

5 රෝගෙන් සුරා රළුවදත් මිනිසෙක් බණත්නම්
දීපන්වර හත මුවෙන් ගුලිතුන් සමාරක්
මුවෙන් බලල් නැවත නස්න තරන් බණිත්නම්
ගැනම් ඇසේ බඳුමුවෙන් නවනී කියාටක්

6 මෙපැවසූ ලෙස ලේ පත් අඤ්ජනත් නස්න පානත්
තිරුහනකන වැක්මත් තාපයත් දුම්ගැසීමත්
නොපැවසූ අනුපා තැන්හී අරත් පැන්ද ගෝඩා
දුන මෙකුලි සුරා දෝස් ඒ ගමෙන් සුත්ව යාවි

7 පොරණ ඉසී අලජ්ජි රෝ නසාලත්ට සැදූ
පවර ඉලපොතෙක් ගත් මේ සුරා මුද්ගරේනම්
ගුලිය මෙඅනුපානින් සෙවි සතුන්ගේ සුරාදෝස්
බලිය ඇරපුමෙන් සුන්වි වෙනැසී සෙත් සුරාබූ

# බේබදු කෝලම.

ගන්නාවූ පමණ බඩපුර බී සිතුලෙ ද
දන්නාවූ සියලු කුණුබස් දොඩා නොවම ද
දෙන්නාවූ නිබඳ ගුටි බාරිනට ඇද ඇ ද
සොන්නාගේ අප්ප එති අඹුව සහ සබමැ ද

පුරුෂයා

1 එනවා මචි නොදනිද තව මූන්මේ—බොල
මොනවා පිනන්නීද ගෙයි දූන්මේ
එනවානො මෙහෙ සොන්නගෙ අම්මේ—දූන්
දෙනවා කන්නට මට සැනෙක්න්මේ

ස්ත්‍රී

2 කිසියම් රැකීමක් නොකරමිනේ—බී
ඔය දූන් ගෙදර එනකොට මතිනේ
උයමින් මෙමගෙ මාලූද තිබුනේ—මට
කෑත යම් දෙයක් දෙන්නට මෙතනේ

පුරුෂයා

3 නිටඹිම නොකීවෙද නොදොඩනටා—නී
සැමදම කියස්බස් පරුසමටා
මතු ඕම නොදොඩනලෙස මෙමටා—ගුටි
බැට දීමමසි හොඳ බෙහෙත නිටා

ස්ත්‍රී

4 සත්තේ බී ගතවිත් හිම් මෙලෙදෑ—කොලු
හැත්තේ අඩවඩවා දූන් නොමදෑ
නිත්තේ මට ගැසුවොත් ලෙස වෙනදෑ—නුඹෙ
මත්තේම පණ නහගණිම්අදෑ

පුරුෂයා

5 තාසී මෙමගෙ දී බොන එකටා—දූන්
සීසී තෝකට රැකගන නොසිටා
වාසි බස් දොඩමින් එකාටෙකටා - නිට
ලේසිනම් කාපිය දෙන මෙබැටා

ස්ත්‍රී

6 විදලා දූක් මටනම් බැරියඅනේ—මා
මැරිලායන්නෙත් නැත මුගෙ අතිනේ
නුමුලා මේ මටගුටිදෙන තදිනේ—අත
බිඳිලා පලයන් දෙවියනි මුලිනේ

පුරුෂයා

7 ආයෙත් නොදෙඩ පුලවර ඔතනා—මට
ගෑණුත් හිඳ තී මලත් වෙනා
කීවොත් තවත්දෙස් මුසුවදනා—මම
ඊටත් දනිම් වැඩ නිටකරණා

ස්ත්‍රී

8 තැනතැන ගොසින්මා මෙහෙතරලා—හැම
ගෙණ දෙන දෙයත් කුඹ ලතවාලා
එමදින මටත් වෛරීපව සාලා—තව
ඇනබැණ ගියත් වැඩිතැන මෙකලා

පුරුෂයා

9 සත්තේ ඔයතට රැකනොම සිටියොත්--මේ
වැත්තේ මේතොප මරලා නොනැවත්
සත්තේ මපණ නහගණිම් මමත්—ඉන්
මත්තේ තව නොදෙඩන් ඔහොම පුවත්

ස්ත්‍රී

10 දිගෙ හොඳයි මා ආසොයලා—දූත්
වාගෙ ඇටත් නැත බැටකාලා
මුගුගෙමාළු කෑවද මම මෙකලා—මේ
වාගෙ එකෙක් නැත පල හෙනගහලා

පුරුෂයා

11 කීලාමා ගෙදරට පැමිණි සඳේ—මට
දීලා කන්නට කටරැක නොසිඳේ
මේලාගෙන් කරණ නිසා වදේ—මම
කාලායම් අද තිගෙ කැවුන ඇදේ

ස්ත්‍රී

12 බීලා මෙමගෙ කණකර විකුණ—තව
කෝලාහල කරණෙය ඒ මදිනා
කාලා මෙලෙස ගුටිබැට තදිනා—එක
වේලාවකයයි පණ නුඹෙ අතිනා
13 ඇන්නැවෙ මොන වලතුවදවුනේ—මූ
මෙන්න මා මරණෙය බැටදෙම්නේ
ඔන්න තවත් ලංවූනෝතිනේ—මේ
සොන්නපා තෝලග මියම් දූනේ
14 අම්මේ මේ මට බැරුවා ඉතිනේ—පහ
රිම්මේ කම් මූලපිටවත් තදිනේ
දූන්මේ ලෙසට දත් ඉගිලෙම්නේ—ඉන්
ඔම්මේ විදිනවද බලන් අනේ

ස්ත්‍රීගේ අම්මා

15 හා හා මොකද ඔය කරණවදේ—අර
ලේහා වැකෙයි කෙලෙ කව්ත තදේ
පාහාරකම් නොකරව මෙලෙඳේ—මම
මෑහා ගෙදරයම් ඇත මෙවදේ

පුරුෂයා

16 මාහා මෙකිත් අවුදෙද මෙසඳ—බොල
පාහාර බැල්ලී තෝනොවෙද
නාහා මගෙත් තිගෙ කතු පෙරද—දූත්
ගුහා නොගා පල මෙහි නොසිඳ

17 සීසී නොසිඳි කටරීක මෙරෙඩී—මේ
දූසී තිකුමකට තැතීද අඩී
වාසීබස් දෙඩුවොත් තව වැඩී—මහ
දූසී තිගෙත් හකු කරම් පොඩී

ස්ත්‍රීගේඅම්මා

18 කාසිරැගෙණ තිගත මෙලෙදි—බෝ
වෙහෙසි මසරිකළ බඩුම දිදි
වාසී බස්දෙඩමින් තව එමදි—මහ
දූසී කිවත් මට නැත වැරදි

පුරුෂයා

19 කල්ලී මෙතොජෙ බඩු මාවිකුටා—ගත්
සුල්ලී බොහොමඈත ලොකුව කටා
හෙල්ලී තිබෙත තිගෙ දත්අතටා—ගෙණ
බැල්ලි යන්ටවෙයි මෙහි නොසිටා

ස්ත්‍රීගේ අම්මා

20 කරදර මුගෙන් මේ ලෙස නොවිඳ—නිට
දෙරදෙර සිගාකත්නට බැරිද
අරගෙණ ඔයනොඑඇම්මත් මෙසඳ—මෙහෙ
වරබොල යන්ටතව වදනොවිඳ

පුරුෂයා

21 තිලා මට ආඩම්බර පෙන්නා—රිඹ
ලෝලා ඔය යනවද බයගන්නා
දීලා නොගියොත් මගෙ කොලු සොත්නා—අද
කාලා දමනෙම් මම නොපදෙත්නා

ALBERT DE SILV[A]

1893 මාර්තුමස 20 වෙනි
දින කොලඹදීය.

# සූ රා සො ඬ ස න්දේ ශ ය.

1 සැම් සුවඳුකෙහි එකලෙස පිහිටට ඔබි න
අම රසවැන් සුරා නිති බිගෙණ වස න
රම වන සුරා දූතය නමැති සබඳි න
හැම රස බිම ලැබ තොප යමතු දින අ න

2 සිතුරු වනෙව් මත්පැන් පානතරය සේ
සතුරු බයට සැකනොවනා කිසි දුව සේ
පතුරු වන සුරාපැන් ගුණය දස දෙ සේ
මිතුරු එයින් අසඟුව මකියන මෙබ සේ

3 සිරි සැළලිහිණි ආදී සත නිව ට
පුරා තැන කිව්වු යැවූ පණිවිඩවල ට
සුරා සොඬය තොප ලෙස එහෙම වැඩක ට
චිර ජීත කෙණෙක් ලොව නොහැගෙයි මෙම ට

4 බී කටගන්න නෙක් ගෙදරටවිත් මති නා
ගෑණිට ගුටිදෙමින් තම නෙද බලපා නා
ලෝකොට බැණ දෙඩා අන වැඩිව ගුටිකා නා
මේකට හුඹව්නා වෙන කවුරුද හප නා

5 මම්තුර තුඹෙ පිකුම්දිඩ බලඇති ලෙස ට
සිතවැර තරම් පවසා මම නිම වන ට
ඝොරතර ලෙඩින් පෙළෙනා මිනිහෙක් නිව ට
සමුදුර පීනනා වෙනි යනසෙ එතර ට

6 කාලාතුප් වෙහෙසවිද එන කෙණෙක් ලෙ ද
පාලා විසිදු වැනිවැනි වැකෙමින් කෙල ද
ගාලා ගනෙහි මඩ රලු බස් කියා න ද
බිලා එනුද මම්තුරු මත් පාන අ ද

7 වෙන අය සංසුන්ය මග යන එන කල ට
බොන තොප එලෙස නොව වැනිවැනිය දසන ට
බැණ මොර තලවමින් සෙන කෝලහල කො ට
වෙන සැප කිම මෙවැනි තොප දකිනා මෙම ට

2

8 කඳිම් අය ඉඳින වෙන සුළු පවු වැඩි ට
එගැම් චිත්‍ර බියය කොප ණිත් කම්වල ට
කොහොම දෙස්ක්වත් ලොව බැරි නැත තුඹ ට
තුඹම ඔබිය එබැවින් මෙපණිඹිඩය ට

9 තද මතික් වැටි තට ඇර ඉඳිනස ද
බලු කැලන් දෙපස මන සිව්නා හොම ද
ඉවලම්න් මුතය උස්තර පයක් සේ ද
සුළු දියෙන් තටට තුඹෙ යොතලෝද පු ද

10 මෙම ලක්දිව් සුර බොත සියළු පිරිවි ර
තම එක් ගුදමෙත්ම රැක වසතට නිත ර
සමතෙක්වන රේන්දේ මැතිදුට පව ර
ලියුමක් රැගෙණ යන ගමනකි මහනුව ර

11 මේලොව් සැපට සම්හර අය වේතිය ලො බා
එලොව සැප සොයති සමහරු සිතින් සු බා
දෙලොව් කිසිවකුත් නොහකායි බොන මෙනු බා
බලව ඉතින් පවිසම් තොස රුසිරු සො බා

12 වරල අවුල්වී පඹගාල විලස ට
සුවල කෙත් රතුව හින්පුපුරුසෙ සොද ට
දෙකොල පොල් ලෙලිසෙ හිය පෙරළි පිට ට
උදුල සොඩු පිටි පැනි ආරුම් ලෙස ට

13 සියමුකෙනා නෝඩා ගඳ නිකිහම් න
ලය පිපිහළුව බඩ දියලබු ගෙසිය මෙ න
කය සැමනැතම සුදුමැලි වරුණෙන් හොබ න
පය දෙක සවිනැතුව බොරුපා දෙනක් මෙ න

14 බොම්ජි සුරපැත් ගත ඇතුලට සෙදු න
නොම්නි දෙස්වලින් ගත පිටට විසිඳු න
මෙමැනි රුසිරුදුරු මගෙ සචදිනි සොබ න
ඉතිනි කියම් තුඹෙ බලවීකුම් සතුටි න

---

* බිබික්කම්ය කියා වැවහාරවන කැම වගීයටසමාන කෑමවගී යකට මාතරපලාත්වාසි පැනි ආරුම් හෙවත් පැනි ආරුම් ගෙසියයි කියත්.

15 මහතුන් ඉදිරියේ නුඹ මෙන් නිසැකමෙ ළ ස
වෙන අන් අයට නොහැකිය පවසන්ට බ ස
ඒලෙසින් මහත් අයවූනමුත් නුඹට රො ස
නුඹනම් සැලකුමක් නැත කිසියම් දව ස

16 බයනැතිකමට නුඹ කේසරයෙක් වැන් න
බැණන්තිමොර අන්ධ නුඹ සුනඛයෙක් වැන් න
නැත නැති කමට නුඹ සූකර යෙක් වැන් න
ගුණ ඇති මෙවැනි අය ලොවනැත නුඹ වැන් න

17 ගවයන් මැරුම සහ හොරකම් කරන්ට ත්
පවපිණ නොදැන නොපණත්කම් කරන්ට ත්
ඉවබවනැති කතා කිරියා කරන්ට ත්
ලොව වෙන යමෙක්නැත නුඹ සරිකරන්ට ත්

18 වැස්සට පින්නටද සීතල සුලඟට ද
අව්වට ගිමට දැඩිය වැටුමටද ත ද
බැස්මට නැගුමටද ගල්මුල් කටු ගැන ද
සත්තට බයක්නැති අය නුඹඇර කවු ද

19 බොමින් වමන කරවුන් සඳ මහ අස ළ
ළසින්වින් ලොවිනකල බල්ලෙක් දෙතො ළ
තමන්රැවුළ කපනෙය සීතමින් එන ළ
"හෙමින් මෙස්තිරි,, කිමෙ කෙණෙක තොපකු ළ

20 දෙවුන්දර ගොඩින් පෙළහරට තමල ද
දකින්නට නැතුව බීගන සොයන ස ද
වෙනින් එබඳු අඟනක් දැක පහරන ද
දෙමින් ජය ලදෙන් නුඹෙ නැ කෙණෙක්ව ද

21 පොළඟුන් නයින් ආදී විසකුරු සත
වලසුන් ඇතුන් කොටි වල්මඳ ආදිය
කිඹුලන් දැනිමෝරු දිය ගොඩ මෙසතුන්
කිසියම් බයක් නැතිවනූහැකි වෙන නා ට

22 වෙන දන නොදෙඩනා සුබනැති බස් නපු රු
මොර ඇන කියන ඇසෙනට සැමට තිලනු රු
කිසි දින තරා තිරමක් නොසොයා අබි රු
විල සීන බණින දුටුවත්නට නුඹ මිතු රු

---

* මානර පලාතේ එක් බෙබද්දෙක් සිහිනැතිව මගවැටී සිටිය
කල බල්ලෙක් මුහුන ලෙව්නබැව් හැඟී කියනලද ක්මෙකි

23 ගුරුන් නැදිමසිල්දු දරු මව් පිය දෑ
දුනම් දෙසනවුන් රජ අදිපතිවරු දෑ
අහන් සිව්සදම සුබකැතිවූ සිව්ප දෑ
කියන්ටද බණින්ටද සමත් නුඹව දෑ

24 ඇනුම්කන්ට සහ අනුනට අනින්ට දෑ
බැණුම්අහන්ටත් අනුනට බණින්ට දෑ
මැරුම්කන්ට සහ වෙන අය මරන්ට දෑ
සපත් අය මෙලොව නුඹලා මිසක් කො දෑ

25 ජඩවැඩ කරන්නට සහ ගියගිය තැන දී
මඩකුණුපිට ඉන්ට සහ යන්නටද ලැ දී
ලෙඩ අටගත් නුමුත් නොරදන්නට මග දී
අඩ දබරටද නුඹ පසුබසිද නොසිබ දී

26 සොඳතැන අප්පිරිසිදුවූ තැනයයි නොහැ ර
තදගත අදුරු රැ දුවල්ද එක යු ර
වැටිතැන නිදගන්නට නැතුවම පැදු ර
හැකිවන කෙණෙක් ලොවනැත සකි මෙනුඹ හැ ර

27 බිම මදක් වැඩිවුන කල තන්ට ඉ දෑ
කෑම කරක් විය කියම්න් ගෙණ වර දෑ
බෝම කිපි කපා වැඩකරුවන් නිබ දෑ
මේම විකුම් පැවේ නුඹෙ කෙණෙක්ව දෑ

28 වැත්තක් හීමනින් තම සතුරෙකු දුක ලා
කැත්තක් ගෙණ තුවක්කුවයයි එය සිත ලා
වත්තක් පහළ වෙඩිතිබුමට වුන් රැක ලා
ඇත්තත් නුඹෙ සමාගම් කරු වෙකි ලක ලා

29 මින්පෙර රැයෙක මග යනකලට බිග හ
නොම්මර කණුව දුක මින්සෙක සිනාග හ
ලංකර දෙඩා උත්තර නුදුනට රොසි හ
සුන්කරණට ගැසුවෙ නුඹෙ මිතුරෙකි සොබ හ

---

* මෙය 1852 පමණෙදි මාතර වලව්වක මඩගල්ලෑ කෑමකදී මත් පැන් අධිකලෙස පානයකිරීමෙන් සිදුවූ කරුණකි.

† මෙය මාතර මැද්දේවත්තයන ගමේ සිටි උපාසක අප්පු කිවූ අයෙකු විසින් කළ හපන්කමකි.

# 5

30 පියොස් කමිත් බිගන තුටුව යන තැ   න
පියොස් සිහිනැතුව ගෙදරට ගොස් පැමි   ණි
සබස් තනව කියමින් බාරිට රොසි   න
නොලස්වම ගැසුවෙ නුඹෙ මිතුරෙක පොර   ණි

31 දවසක් සිව් දෙනෙක් නානාකල මති   න
කිඹුලෙක් දැක ගඟේ අසබඩක ඊන   න
සැකයක් නොව ගියෝ උෟ අල්ලන්ට පැ   න
නුඹෙවික්මන් පතළවිය සබඳින් එයි   න

32 උනුම් සුරා බිගන ඔට්ටු තරම්   නා
සොඳින් අමු උෟරුමස් කෑවෙත් තුටි   නා
එමෙන් උෟරුමස් කිරි පැනි එකට අ   නා
ලොබින් කැවෙත් නුඹෙ මිතුරෝය පෙර දි   නා

33 නොබොන අයට අපහසකරණට බොහෝ   ම
නොබොනට කියන හැමටම බණිනට වහ   ම
නොබොන දනට පොවනට බලකර එහෙ   ම
නොබොන සනට නොහැකිය සකි නොපලෙස   ම

34 නොහොම නරක දෙයමුත් කරණනුඹ   ලා
බොහොම හොඳ දෙයක් බව ලොවට හඟව   ලා
වහම කතා කරණට සැරවැර කර   ලා
පුදුම නැණවතුය ලොව හැමටම නුඹ   ලා

35 කැමට වාඹිවි කට දෙකටක් කම්   න
බිමට නැගිට සව් දියකුත් පුරග   න
ලෝකෙට ඇති නොමැති කුල මල දොඩාග   න
වෙසෙට අත ගසා නොපසෙත හඩක්මෙ   න

36 සිරේ කෑල ඇති ඉස්සන්සෙ කදිම   ට
සැරේ ප්‍රසාසා කොට තම තමුන් හ   ට
මරේ ලංනොවෙන සුර සෙනනක් ලෙස   ට
හුරේ කියන බස නැසෙද මුලු ලොව   ට

37 සමහට බොන්ට රිසිවූ සඳ එබව ව   සා
යමෙකුට කතාකර සව්දිය බොන පිණි   සා
කදිමට ඔහු සමග බොති නමමින් සිර   සා
මෙහෙමට හොරනසලි නොපි දන්නාහු වෙසෙ   සා

38 මෙකියන විකුම් බල දරණ බැවින් හැ ඬ
මෙනමන යන්ට නිසි අයනැත මිසක් නු ඹ
මෙගමෙන තුරන්වීමෙන් නුඹ ගොසින් ඹ බ
නොපමණ අසල්වාසීන්ටත් වේය සු ඛ

39 ඒනම් නුඹ සිටිනවිට බොන බිම් හැ ම
යාමෙන් නුඹ ඉතුරුවෙයි යලි එනතුරු ම
මෙගම්වල සිටින නුඹෙ මිතුරන්ට සැ ම
දුමෙන් අඩුම්ලට බොනු හැකිය හොදට ම්

40 එසේ බිම වුනිනම් ලාබ මෙපිය සේ
මෙසේ වැඩි වැඩිව ලැබෙමින් සහ පිරි සේ
නොසේ නොබොන අය බිමට වැටී ය සේ
යසේ නුඹෙ පතලවෙයි සැම තැන එකා සේ

41 ඒ ඇරත් මෙරට නුඹ සිටින තලව සා
කාටවත් බොමින් තම විකුම ඇති ලෙ සා
පැමටත් නොහෙත්වත් ඉඩ නොමැති නි සා
ඒ විනත් වේය නුඹ නැතිකල මෙදෙ සා

42 නොබොන සමාගම් සැදි නෙකරටවලෙ සි
කරණ බොහොය අනතුරු දුන් රැදෙවෙ සි
නොසිත මෙනුඹ බලපලනොට යන සදෙ සි
එවන අනතුරුද විගසින් යයි වැන සි

43 රුසිරෙන් බලෙන් විකුමෙන් තෙදගින් සැර සු
දනුමෙන් සියලු දෙස්බස් කුණුබස්දමු සු
කිසියම් මෙලොව කෙණෙකුට බසිනා නොප සු
නුඹමෙන් වෙනකවිද මේගමනට පසු සු

44 රුසිරත් තෙදත් ලැබුනේ නුඹට මේලෙ ද
බලවත් සුරාණන් අනුහසින් ව ද
දිනිදුත් නුඹ හරිණු ඒ ගැනමය සබ ද
එමහත් සුරවේ ගුණකියම් අස සො ද

45 පුර ලොව තිබෙන අනිකුත් දේවල ට
සුර මය අගේ වැඩිවයනුව සහ ට
වර වෙයි අනික්වා සමහර කාල ට
සුර එලෙස නොව වැඩෙනුය සැමකල ට

46 දුක් සැප දෙකට එක ලෙසවන පිළිසර ණ
යක් බුපිසස් බය සහ මුලයෙන් තස න
ඔක් නොම රසට අගතැන් පත්ව පවති න
මක් කද ලොව සුරවට සරි දෙයක් වෙ න

47 පුර ලොව තිබෙන වෙන සනතුරුවල ට
සුර සොඬ මෙතනතුර අගය හැමවි ට
චිර ජීත එතනතුර දුරු මෙතුඹ හ ට
සුර සරණමයි ඔබිනේ මෙගමන ට

48 එබැවින් සුර සොඬ යන සමැනි හනතු රු
ලැබදුන් මෙරට පසිදුම සිව්න මම්තු රු
සමහින් නුඹ පිටත්වෙන මෙපුර විසිතු රු
අසදුන් මෙතුඹ යන මග සියලු තොරතු රු

49 මාතරමට නොයෙක්වග මත්පැත් තිබේ. න
මාතර සිතින් ඉවබඹ නොබලාම බො න
මාතර බලැති නෙකදන වසනා බැවි න
මාතර යසි කියති මෙපුරට සිට පොර ණ

50 ඉල්ලීමක් නොකර කිසිවෙකුගේ අති න
සල්ලි ගෙණ විකුණ බාරිගෙ ආබර ණ
මැල්ලී නොව නැගිට උදයේ රබොම් න
පල්ලී මුල්ලෙ සිරි දූක මගට බසිම් න

51 බටුවේ මගට නොබොනා අයට බැණ බැ ණ
තැබුවේ යහළුවන්නෙක බිගන මති න
පුටුවේ ලෙස දකන් ඔරුකදපිට ඉදි න
කොටුවේ ගොඩ තැවැරුමතුළ වැද බොම් න

52 විකලේ නොව එයින් යන කල මග දෙප ස
පැකිලේ එන දකන් බිමට රහස් ලෙ ස
එකලේ උන් නොහැර මිලගෙණ නොව අල ස
හොටලේ තුළට මාතර කොටුවේ පිවි ස

53 බාසේ දෙඩා එහිසිටි මහතුන් කැමු ව
මෙසේ ලඟ වාඩිවී ඇදගන පුටු ව
බෝසේ හොඳට කා බී ලඟටම බොටු ව
මාසේ අනදි මිල දෙමි කියමින් තුටු ව

54 ගොසින් යලි තුඹෙ බොනමිතුරන් ලඟ ට
නොබොන් නත්ට බැණ බැණ දොඩමින් තව ට
එයින් පිටත්වී ගොස් පාලම උඩ ට
ගිමන් හරු නිදාගන බූත පාර ට

55 නැගිට යලිඑයින් 'සතකලට මැනි වැ ති
නුඹට සිතාවෙන අය දෙසට රවමි ති
යසට කඩේ විදිය පසුකර ගොසි ති
සතුට වඩන තුපේ තුදමට පැමි ණි

56 කියමින රේන්දේ මැතිදුට තුඹෙ ගම න
අරගන සෝප්පී තුණ හතරක් පම ණ
බැණ බැණ හූරේ දමමින් හැමටම නොබො න
එතනින නික්ම මහ පාරේ නරවම න

57 එතනම තිබෙන අගලටබැස බිව තූ ර
හොඳටම ඉක්මණින් මහකඩය පසුක ර
තැවැරුම තුළට පඹුරණ වැද බි මිතූ ර
කරපෙම අම්බලමෙ ඉඳගන ගිමන් හැ ර

58 ලොල්කර යකසදේහී ගිනිකෙළිනා සූ දු
වල්ගම තැවැරුම දූක එය නූළට ව දු
කල් නොයවා අතක් දූතක් තොළ සූ දු
මල්ලවයෙක් ලෙසට සව බීගන පයි දු

59 නැබුරුව් එසද තුඹදූක යන බියෙ න
කවුරු දුටුනැතත් ඉනාඉන කඩා ග න
නපුරු බලූකැලත් නිති ගහනව වය න
කඹුරු ගමු පියස සැඟි තැමැරුමට පැ න

60 කොල්ලෙන් ගත්තූ බඩුදී බිලා සොඳ ට
කොල්ලන් නැති තැනක ලැග සිමන හරිණ ට
බල්ලන් අවොත් සෙල්ලම් කරණට කට ට
අල්ලන් කකුල උස්කර මරව වදකො ට

61 දෙපස්සේ යකෙන මහ සිව් නොබොන ද න
නොරිස්සේ නුඹට දෙඩුවොත් උන්ට බැ ණ
යුගැස්සේ නුඹට මිතුරුවූ දන වස න
මිරිස්සේ තැවැරුමතුළ වැද බොමි න

---

* අත්දෙක සහ කකුල් දෙක සතරදිශාවටදමා නිදාගැණිමට බූත පාරට නොහොත් බලිපාරට නිදාගැන්මයයි කියත්.

62 සකස්කර එගම කඩපිල්වලෙහි ඇ ති
මිරිස් උම්බලාකඩ ලූණු එැනූ රැ ති
නොලස්වම කොල්ලකා ලෙසට සිහිනැ ති
සිරස් නානු පොල්අතු ගනිජ් යහප ති

63 පාලමින් එතරවීයනකල සිත සේ
සූකරත් සමග හරකුත්ද එක ලෙ සේ
ගෝඩපැත් බොමින් එත ලකුණු දක තො සේ
ඒ මගින් කල්දෙරම් ගෙට යව සැප සේ

64 සූර පිණිස විත් එහි සිටින දන ස හා
මර සූකරෙක් පුස්සමිනි අල ස හා
පූර බඩ විපින් කාගන ගිම් සන හා
එ රැ ඉක්ටයව වැලි ගමට නොවල හා

65 එගම බොනදනන් ඇත විලස යක් කූ
එහැම දෙන පරණ පරසිද්ද අරක් කූ
බොහොම නොබී වෙනලෙස කක්කු වික් කූ
ගුදම තුල මදක්කාල් වී පරක් කූ

66 එහිවසනා නුඹෙ මිතුරන් සවස්ව ර
ලෙහි කරුණා නොව බිගන විත් ගෙද ර
සිහි මදිනා කරණා නෙක අඩ දබ ර
රිසි ලෙසිනා දක දක ඇවිදුව මිතු ර

67 විහිළුකල නෙණෙක් නුඹ බි යනකල ට
හිහිය පැවිදියයි නොසොයා බැණ හොඳ ට
පිහියෙ ලෙස මොකක්වත් ඇදගන අත ට
සිනිය ඇගාව ඇනපන් ඔහුගෙ පපුව ට

68 බොමින් ගෙදර ආවිට හිමිහට රොසි නා
කනුන් කරණ සැරවැර කනවැටුන තැ නා
ගොසින් හඩක් ගසමින් එගෙවලට පැ නා
තදින් බැට දෙවන් එකානුන්ට බැණ බැ ණා

69 මෙලෙසින් එරැ නුඹෙ බලපා වැලි ගම දී
මහතුන් හට සුරා බොන නොයෙක තුකී දී
අවමන් කර නොබොනා අයවලට මොරදී දී
උදයෙන් කුඹල්ගමද් බියව නොරැ දී

70 අලියම සුරඹිගත මග වැටී ලා
ඇග සැම තැනම මධ තැතකුණු වැකී ලා
නැතුවම විළිසිප්න කෙකඳන බලා ලා
මිදිගම තැවැරුමවෙන පැමිණ බී ලා

71 එහිසිටිනා තුඹෙ මිතුරන් මග අස ළ
සොරකම්නා සපයා තබෙන දේප ළ
එදන ගෙනා ඉල්ලාගත සුදු කෙ ළ
යව එසිනා අරගත තුඹ දිනූ මුද ළ

72 එසින් සුරා බොනලුන් වෙරි මත් ගති නී
පසන් වම කියන බස් අසමින් තුටි නී
ජිතින් එම ලෙසම පවනින්ට කියමි නී
අහන් ගම තැවැරුම් කරුගෙන් බොමි නි

73 එඅසලමග දෙපස ඇඳු ගස්වල ට
පෙල පෙල මදින්නන් ගොස් මදිනා කල ට
පිරිතල ලබුගෙඩිය රබානා ලෙස ට
කොල හල උන්කරණ අසමින් අතුරුපි ට

74 ඔවුන් කියන හුවට හුව කියමි නා
ගොසින් බැ ලබුව ගෙණ රා බී එසි නා
පසන් එගම නොබොනා අය නැති බැවි නා
එසින් පිටත්වී කතළුවට සපැමි ණා

75 ලොකුකුඩා දනන් ඇත එහි බොනනොබෝ න
පල අඩාකියා නොබොනා අයට බැ ණ
තුති දෙඩාකියා බොන අයගේ මරු ණ
හැර විඩා යනුව බී එතැවැරුමෙ න

76 කඩදකී කෙළින රඟබලමින් ඒ අස ලා
අඩදබරද කරණ හැටි බල මිගපෙප ලා
වැඩනැති කතා කරකර ඉන්නන්ද බ ලා
දැඩබල මිතුරෙ ගොස් ඒ ගම පසුකර ලා

77 නෙක් ඔල මොල දනන් බේබදුකම් කර ණ
එක් කොල හල හඬින් තද නැත බස් දොඩ න
එන් කල මුත් බිම නොහරිණ දන වස න
කොක්හල තැවැරුම සව සිහියට රුගෙ ණ

## 11

78 අසුන් රැගෙණ එත්තන් තම සිරින් ලෙ ස
යෙහෙන් කටුකුරුන්දේ නැවණි නොල ස
බොමින් උන් නැවැරුමෙ නිදනු දුකා ඈ ස
හෙමින් නුඹත් බී ගොස් කුදිර යෙකු ලෙ ස

79 දඩබඩ නොව ලිහාගන අසෙකු පිටනැ ග
තුඩතුඩ නුඹට කරණ තුති අසාම ග
මොරගඩදී මතින් මග හැසිරෙණ සෙන ග
ගලගොඩ නැවැරුම සිහිකරව යුතුර ග

80 මම්කියා දෙවන මගකරුණු බලබ ලා
සිංහයා ලෙසට අසුසන්වමින් න ලා
ලන්සියා වත්තෙ රසැලෙනුත් බී ලා
දෙම්කියා කාසිඑනපාර ගොස්ප ලා

81 සීනුලොල්ලේ එන බිගන කොලහල ට
බොන ගොල්ලේ සිටිනා නුඹලෙස සොඳ ට
දලවැල්ලේ රසැලලග මගම සි ට
නොව මැල්ලේ බී ගෙන්වාලා මග ට

82 සිනතුවිනේ ගොස් මග සිරි බලාග න
ලොකුපටුනේ ඇති අයෙකුට අසුවිකු ණ
මිලදෙම්නේ කාබි රිසි රිසි දෙයි න
උනවටුනේ සිට ගොස් සීනුලෙස පසි න

83 සැමසතහට සූරවෙන් යෙදෙන වැඩ නි හි
නොනැවත කීයාදී සකරනිනා කැම ති
තොප ඉනම්තුරු සමතුන් හැසිරෙණ නැණ තී
නඩවතලග නැවැරුමනුළ සිටකැමැ ති

84 දෙඩමින් නැවැරුම්කරුමැතිට නිසි ලෙ ස
කරමින් බොන දනන්හට නොයෙක නුති ගො ස
ගණිමින් විදුරුව බිලානමා ඉ ස
ඒතනින් නික්ම සැපසේ වැල්ලටම බැ ස

85 මන්දසී කරගොසින් මාගාලු පියසෙ සි
ගෙන්ගෙට තීබෙන හොරකම්කර රැ දෙවෙ නී
ජින් සහ හොඳ බීම බීගන විඑරෙ සි
යොන් සෙනගට අදිනමාදුල් බැණ සැමෙණ හි

86 උදුරගන මාවෙදෙන ගුප්බැට නොන කා
නොහැර එම රුගෙණ එල්ලාගන වැලෙ කා
පවර ගාල්ලේ අපෙමන ගුදම දූ කා
මිතුරු සිටගණින් පස්සේ දොර අසෙ කා

87 මෙසැම ඉසුරුසර දූක නුඹ සිතූ පැහැ දූ
ගුදම තුළට කිසි සැකයක් නැතුවවැ දූ
වහම මාවවැල එහි මැතිදුන්ට පු දූ
බොහොම පහන්කර ඉසනමම්න් එස දූ

88 ඔහුගෙන් එහි බිම වියදම් වෙන පම ණා
සහ දුන් බිම අත් ඇර සිටිනා ගණ නා
අසමින් බිම අත්හැරිවුන්ට කි පෙම් නා
සොයමින් නොබොනදන මිට්න් තිබන තැ නා

89 තදින බී ගොසින් ඒ ඉඩමට පැන ලා
එතනමුල් අයත්බිමට දොස්කර ලා
දොඩන අයත් අල්ලා පොළවේ ගහ ලා
එම්න ගුදමෙ සැතපී උදය නැගිට ලා

90 දූකලා උදේ එතනට බොත්ට එනස න
කියලා උන්ට බීමෙන් උදය වෙනසෙ න
බැසලා මගට නරඹා එහි කඩදිමු න
නුමුලා කොටුව ඇතුළට ගමන යගප න

91 එහි තුළ විදි දෙපසෙහි නෙක සිරිදර ණා
සුලකළ සාප්පුද දූක බිම විකුණ නා
තොපකුල දන්වසන කැන්වීමට සපැමි ණා
නොපැකිල වාසිවී බංකුවක යතුට් නා

92 දෙකක් කිකිළිබිජු උඩදමමින් ගිල ලා
පිකක් පොල් අරක්කුත් එතනින් බී ලා
හූයක් කෙලගසා යලිපාරට බැස ලා
සැකක් නැතුව ගොස් හොටලේට පැමිණි ලා

93 උහි සිටිනා නෙක වන මහතුන්ට සෙ ද
අන දෙම්නා ගුඩමෝනින් කිය සබ ද
යලි රුගෙණ පුටුවක් මෙසෙ ළඟ ඉ ද
බඩ පිරෙණතුරු කාබී මගටවැ ද

ශ්‍රී ලංකා ජාතික

94 එමැසිල්ලේ කොටුවෙන් පිටට වේග   න
සිතුලොල්ලේ කරවන බොන දන වස   න
කළුවැල්ලේ තැවැරුමකින්ද බිග   න
එකළුල්ලේ මහ මෝදරට සපැමි   ණි

95 තොපකුල සතට සිතු මිණිරුවනක් විල   ස
සැමකල බිම සපයා දමට වෙහෙ   ස
නොපැකිල ගත් උතුම් අය සිවිය එපෙදෙ   ස
පසුකළ මැනවි අඹමින් කඳුළු පිස පි   ස

96 යලිමග ඇවිද බී නුඹලාගෙ ගොල්   ලේ
විළිනොව පාන මිග බලමින් සියල්   ලේ
මැලිනොව බී තැවැරුමෙනුත් දඩල්   ලේ
නාලිහැර බොනු ගොසින් ගින්තොටට නල්   ලේ

97 එත නි ත් බුස්සට වැද දූන තැමැරු   ම
සතොසින් නුඹත් එතුළට වැද නොවලණි   ම
ර කු ස න් විලස බොන උන් ඇග බී බොහො   ම
ප ල ය න් ඔබෙ කන්දත් පසුකර වහ   ම

98 ම ත් ගතිහගවමින් ගොස් පාරේ සත   ට
ර ත් ගම තැවැරුමෙනුත් බී පෙර ලෙස   ට
සි ත් ලෙස නකුළුවෙක් නා තවෙකෙක් අත   ට
ග ත් හැටියෙම බොමින් ගොස් එතනින් නොසි   ට

99 අ ල න් දුව ලාය්ගන් සහ කහකඩ   ට
තු ර න් දුව වසන බීමෙන් තද නිව   ට
දෙ ඩ න් දුව දනන් දූක බොම්නි සැරකො   ට
උ න න් දුව බොනසෙ සලසා ඉඳිරිය   ට

100 ගෙත්තම් කර ඉරුණු රෙදිවැරලි ඇඳග   නා
ම ත් පැ න් බොමින් වසනා කම්මැලි කම්   නා
ඇ ත් ත න් දූක ගසා ඔල්මරහඩ තුපි   නා
කි ත් ත න් ගොඩදී බිගන පලයන් හිත   නා

101 බොන්නන් එකතුවී කැති පොළු රැගෙණම   ගා
ය න් න න් ඉන ඉහන් උඩුර පැන මොර   ගා
ඉ න් න න් සැටිබලා විලසට මරසෙන   ගා
ස න් න න් ගොඩදී බී යව නොකර දයනු   ගා

102 බී ම ට සතට සුළුකට ගැස්මට ඔබී න
බෝකොට එසී තිබෙන ඒ රැල්ලත් රැගෙ ණ
කා ක ට ගන්න තෙක් ර බි සිතු ලෙසී න
බෝ තු ට වෙමින් ගොස් හික්කඩුවට එයි න

103 කොබොන අයගෙ ඉතාඉහ උදුරු එව් ට
දෙ මි න මග දෙපස සිටි බොන දතන් ග ට
ය කෙ න කලත් තානිත්හට කරකව ට
බො මි න එයි තැවැරුමෙනුත් ගොස් නොයි ට

104 සො බ න සීනිගම දේවාලෙට පිවි ස
කොබොන සමාගම් වල මූලික පිරි ස
න ස න ලෙස පඹුරුලා බීගත සව ස
එ දි න නවා තැන්ගෙන කපුවගෙ නිවෙ ස

105 රැ යි න් නැගිටලා ගැල හොල්මන් නොකො ට
හ ල න් හෙප්පුවත් අරගත බැසමග ට
ගොසින් ඒ අසල සැදිකල්දෙරම් ගෙ ට
දෙමි න් ඒක බිපත් ඇඟ ගැහෙනව ට

106 කල්මන් තේ සිටන් තොපකුල සිරිතමෙ න
තෙල්වත් තේ සහුත් දූක බත් සිකාළු න
සිල් ඇත් තේ නුමුත් ඒ බත් උදුරග න
පිල්මත් තේ තැවැරුමෙ ඉදගත තොසී න

107 සො දි න් බලා හොඳිනැත්නම් ඒ බත ට
අ ර න් දෙබරදු වක්කරමින් ඊ ට
ක මි න් බඩපුරා බී තව ඒ පිට ට
යෙහෙන් පලයන්න මාදම්පේ ගම ට

108 එපෙදෙස දතන් රටදෙල්ගෙණ පුළුස් සා
රුතිලෙස කමින් රබාලිය වනස් සා
ර දූ බස දෙබා සිදිනා හොරි කොහුස් සා
දූකා තොස වෙමින් රැබී සව කොලස් සා

109 ප ම ණ නැතුව බොනදන එක්තුව නිත ර
න ට ක රැ දෙවෙනි එහි පලවමින් බෙ ර
පැ මි ණ තැවැරුම් ගෙට නුඹ වතු ගෙද ර
බොමින මදක් එකනික් පලයන් මිතු ර

110 තම්බමින් නිබෙන පොකිරිස්සන් සොඳ ලා
සම්බලෙන් ඝුගක් අරගන කටගා ලා
අම්බලම් ගොඩදි රා අරගන බි ලා
සම්බවුන හැමට නොබොනා ගොස් බැණ ලා

111 දම්සබේ කියාගම් දෙපස මඩුබැ ඳ
ජිත් නුඹෙ නිසරු කරබණ කියනත ඳ
රත්දෙඹෙ එවැනි තැන්වලට ගොස්වැ ඳ
දෙන්නුඹෙ සිතසෙ බැට හැමට එකලෙ ඳ

112 සල්ලම් කර මෙලෙස උන්මගට බැසය ලී
ඇල්මෙන් තැවැරුම වෙත ගොස් බී ඉපි ලී
සෙල්ලම් කර පිනුම් ගසමින් නොවී මැ ලී
ගල්මත් ගොඩට යාගත් සවස නොපැකි ලී

113 දෙවොල් මඩුනටන තැනකට එරැ බැ සා
ලෙකල් බිසෝ කප උගුලා ගෙණ නොල සා
සියල්ලට තළා එහි සිටින එකලෙ සා
එකල් පූනාව ගෙණලා ගඟ සිර සා

114 සුබනැති කවි සින්දු කියමින් බැස මග ට
ඔබමොබ කරකැවී නටමින් හොඳරඟ ට
පිඹ පිඹ ඕව්රුහඬ වස්දණ්ඩක් ලෙස ට
හැබ නුඹ සැපසේම පලයන් වැළිතර ට

115 එලෙසින් ගොස් සපැමිණ සොහොනක් උඩ ට
සතොසින් පූනාව එම තබමින් ඉස ට
කියමින් හත අටක් හූ යනෙකු විලස ට
නිදමින් ඉන් නැගිට උදයෙන් බැස මග ට

116 හීලට බී තැවැරුමකින් එහිපා සු
පාරට එනබලා ඌරෙක් ගා සු
දීබැට ඌමරාගත ලෙස අල්ගෝ සු
කැමට කොස්ගොඩට පලයන් අල්මූ සු

117 එකිසිටි නා මිතුරන්හට එක්වෙමි නා
මග යනෙනා උන්ගෙන් හුනු ඉල්ලම් නා
දෙනලෙසිනා උනොඩොක්කුව ලිහුනැ නා
උදුරගෙණ ඉස්කාගරයකට පැ නා

118 රැගෙනා තමන් උගුර රිටක අමුණ ලා
ඔ බි නා ලෙසට කල්දේරම ලිපතුළ ලා
ත දි නා පුලුස්සා බි හොදට ලතව ලා
එ සි නා නික්ම යව කවිකියමින් තුමු ලා

119 පු ර වා ඔඩොක්කුව අමු බෙල්ලන් කම් න
නෙරවා දිය ලබුසෙ බඩගෙඩි ර බොම් න
බ ර වා කකුල් ඇද ඇද යන දත වස න
ඔ ර වා නෙතු බලව ඉදුරුවෙ සිරි ලොබි න

120 අදිමින් ඉක සැදත් රුවමින් උකුනි ල්ලා
බදිමින් මත්න පෙට්ටිද යොත් ලබුළු ල්ලා
දමමින් තොප්පි නහිමින් නෙතුරු සො ල්ලා
දූකපන් පාන විකුමන් මදිනා ගො ල්ලා

121 තොස්සිතිනා කපමින් තටු හෙලන සැ රේ
ව ස් ස ව නා මල්වරුසාවක අයු රේ
රෙස්ලෙසිනා කපමින් කැකුළුමල් ත රේ
ද ස් ක මි නා දුව දුව අතුරෙන් අතු රේ

122 ගමන්ගත් අහස අසුරන් කැලක්ලෙ ස
කප්පිත්කට කියා ඉඩනැතිව හු ගො ස
අරත් ලබුගෙඩිය ර බාමින් නොල ස
බලත් මදින්නන් එහි මදිනා විල ස

123 ගාමින් ර මණ්ඩි සියොලඟ එක ලෙස ට
නාමින් මියුරු ර ඉසසිට දෙපතුල ට
යාමින් අමු බෙල්ලනුත් කාගෙණ හොද ට
පාමින් විකුම් ඛියව එගම පසුකො ට

124 උ ර කැස්බ බිජු බී විස්සක් විත ර
පෙරා ර ජීට දෙබරදූ වත්ක ර
පූ ර බඩබොමින් කා බෙල්ලන් නොහැ ර
ව ර හේන පසුකරගත ගොස් මිතු ර

125 බෙන්තොට මෙගොඩ නානායමට සපැමි ණ
කත්ත ට ටිපින් කාවාට්ත් බීර ගෙ ණ
මත්තු ට ලෙසට කා බී බඩපිරුණ තැ න
යත්න ට යව එගොඩවී යලි පාලමෙ න

126 ස බ ද අළුත්ගම රාසලට පැමිණී ලා
නොමඳ කිකිළිබිජු වක්කරමින් ගඟ ලා
ලූ ණු ද මිරිස් රා දෙබරාඳු මෙසිය ලා
එ ස ද එකට කලතා පලයන් බී ලා

127 සා දු ක ම් න් බීගත දෙඩ දෙඩා සි ට
කෝපවෙමින් පසුවූන යම් වරදක ට
මා ළු තු න් කාගත වැටෙනා පොර ට
බෙ රු ව ලි න් බීගත පලයන් නොසි ට

128 බූව ල් ල න් පුවස්සා රා ලිපේ ද මා
කාසෙල්ලම් කරණ බී කලටි රා පෙ මා
ඒ ගොල්ලන් වසන මග්ගොන දැක කඳී මා
රා ඉ ල් ල න් තුඹත් බී පලයන් නොප මා

129 ගොසියා නටා බුහුකෙළ මගම රෙ ත්තේ
නෙ ඝි යා ඩමට බී අල්ලාම ද ත්තේ
දෙ ඝි යා ඉඳිනා අයදැක මග දෙපෑ ත්තේ
ප සි යා ගලින ඝව බී සිතැකැමැ ත්තේ

130 ත ය ත පෙරට ෂරි ලැකම් ගුරුගො ල්ල
බ ලෙ ත කොක්නතමගෙණ මිරිකාබෙ ල්ල
රැ ගෙ ණ සක්ගෙඩිය පිඹ පිඹ කර ලො ල්ල
තො සි ත බලායව සකිසිරි කලමු ල්ල

131 පෙරබොමින් මහත්කෙනෙකුන් කතාසි ට
කදරෙසින් බැඳපු කුකුළෙක් තාරකව ට
පිහි ය කි න් ගසා වැඩකරුගෙ බෙල්ල ට
කැ පු උ නු ම් පියස යව සකි කළුතර ට

132 නිති අරක්කුවට ලැඳි සිත තිසාක ර
ගැරඩියෙක් කුණුවූ තිබු බාජනය ගැ ර
නෙකදෙනෙක් බීපු ඇතිතතු නොදැන පෙ ර
මෙකලනෙක් එවැනි බොත්තන් ඇත මෙපු ර

133 ඇලී රත් රසසෙ උන්වෙත බැඳ හා ද
මැලී නොව බොනසෙ තව දී අවවා ද
දිලී රෙසින නොබොතන් සහ තරවා ද
සලී මිතුරු තුම නොමවී පරමා ද

134 පොත්පිට පොළු නගා ලේගරකබවම් නා
මුළු ර ට අරක්කුම ගෙණ එයි බහලම් නා
රළුකොට බස්දිදී නිති බොන සත ගහ නා
කළුකොට මෙගොඩ රගමෙර මඩුවට පැමි ණි

135 බොම්මෝ තොප මිතුරු කැල සමගින් තොම දේ
පැ මි ණේ එරට පිස්කල් මැතිදුවෙන වැ දේ
ම නි නේ වෙරි පෙරළිකරළුන සත නිබ දේ
බැ නි නේ රකිනලෙස යැද න්වරද සබ දේ

136 බෝසැඩ වතුරකින් කළුගඟ බැසයන වා
මාකඩවි එගොඩ මෙගොඩට නොපෙණෙන වා
දූ දී ඩ පාලමක් ඇත එයි දූන පින වා
රාසොඩ මිතුර සිසියෙන් එතරට යන වා

137 දූ ල් ව න් කළුගඟේ ගොඩ සපලැති ගොඩ මේ
සෙල්ලම් කැවිලි සහ රා විකුණන ඉඩ මේ
කොල්ලෙක් එයින කා රා බිගන ඔඩ මේ
ලෙල්ලන් නොගෙණ ලැගපන් ඒ ලග මඩ මේ

138 මග දිග දේපස සල්පිල්විය නොම අතු රු
අග හිග දෙය ලැබෙයි තමසිතසෙ නිලතු රු
ලඟ ලඟ රා මඩුළුඇත නොයෙක විසිතු රු
සුඟ සුඟ එයින් බි ගන කරපන් යතු රු

139 ගොස් එතනින් හොරකම්කර තොස් බොහො මේ
රොස් කරමින් තම්බාගත සිතුලෙස මේ
ම ස් සමගින් කාලා බී තොවලස මේ
ව ස් කඩුවෙන් යාගත් තුඹ සැපසේ මේ

140 අ නි න් අත කෝම්බාගෙණ සිතුසැටි යේ
ගොසින් කල්දෙරම් ගෙට බිගන අටි යේ
ද න න් මඩ ගොහොරුවල යන වැටි වැටී යේ
බොමින් මෙසිරි දූක නැවති පොතුපිටි යේ

141 සතොසින් එහිදි කා බී නටමින් හොඳ ට
උදයෙන් විතක් බිගන ඇගගැහෙන ව ට
වි ග සි න් පිටත්වී එතනින් බැස මග ට
පල ය න් වාද්දුවයන පරසිදුගම ට

142 තම සා එවන් සමගිව ඇවිදින් නිත ර
දුණුමාළුවෙන් කටදිව පගදා නොහැ ර
තාදගෝළුවෙන් බැණ බැණ බී යන පව ර
බොනපාළුවන් දූත බී ඉක්යව මිතු ර

143 උන්මත්තෙන් බිගන රකුසන් සේ ම
සම්පත් අන්සතුන්ගණිමින් උදුර ම
උන්මත් හිංසාද දෙන සත ඇති බෝ ම
පින්වත්තෙන් ගොස් අත්නොහැරම බී ම

144 සැ ම ව රේ ලමයින් එකතුකරග ත්
බිමකෙරේ සහ කුඩෙබොන තරුණු ගැ ත
බෝමසැරේ එදිරිව ගුරුකම් දෙව ත
පා ස දු රේ ඉස්කෝලය තුළට පැ ත

145 ගුරුතැනහට නාඩුකරමින් ඇසි හතු ර
අපබොන කාදිම බිමට තුඹ නිසරුත ර
කිමදෙන මෙගුරුකම් කියමින් කරදබ ර
රවමින ගෝලසින්ටත් යව ගසිතෙත ර

146 වැ ද ග ත් අය තැවැරුම ඇතුළට නොය නා
දුටුවොත් ඔහොම හරිතැත කියමින්ම බැ නා
නොබොතත් ඒ අසල ගැවසෙන්ට කියමි නා
කිරිබත් කඩෙදිත් බිගන යව හිත නා

147 රැස්නොයනසෙ සුරාවත්තොට තිබනලෙ ද
තිස්සෙම තත තනා ලේගර පීප්ප ද
රැස්කරනිබෙන තැන තැන මොරටුවේ සො ද
විස්තරබලා බී තුනිකර යව සබ ද

148 දැන්ඇඬෙකාට සළුවක් උරේක ට
නාන්වැඩේ හොදනැත බී එන අය ට
බාන්බඩේ ගිනිහැර කා බී හොද ට
පාන්කඩේ සිරි දූත පලයක් නොසී ට

149 තැන තැන ලොකු මුහුරුගෙණ එස්වෙලා ද ක
රැ කා ග න සිට කොල්ලකා සත් තලා ල ක
කා ර මි න පසු කුරුඳුවත්තත් වෙලාස ණ
ස තො සි න මදක් බී ගොස් රත්මලානෙ ක

150 කකුල් වල තියුණු ආවුදු බැඳ දස් සේ
කුකුල් පොර කොටවනා යන තුරු රිස් සේ
ලකල් කොරටු තිබෙනා දුක නොවලස් සේ
විකල් නොව සවස නැව්තී නල්කිස් සේ

151 ගතගිම් හැරමදක් සැතපී කඩපිල කා
එතනින් නැගිටගොස් ඉදගත තැවැරුම කා
සිතුමෙන් සුරා බී තා එහි ලද දෙය කා
කොතරම් වෙහෙසමුත් කෙළ සුදු නොවැළ කා

152 අ ලි ය ම ගොස් කුකුල්පොර අරිණ තැනක ට
එ හි සැ ම ලොකුකුඩා මහතුන් දුක සතු ට
නොලසම පිට ඔට්ටුවක් තර සුළු ලෙස ට
දි නු ව ම ටිකක් බීගත ගොස් දෙහිවල ට

153 එ හි දි ත් කනිසමක් බීගත එකතින් ම
බ ණි තත් මහළු කතෙකුගෙ කඩපිළකින් ම
කැ වු මු ත් අතිරසත් කා ඒ සැණෙකින් ම
ය ව සි ත් ලෙසින වැල්ලේවත්තට ඉන් ම

154 ම ත් පැ නෙ නා වනදෙස් ලොවට දන්ව න
පොත් බෙ ද නා අය එහි නුඹ දුටුවොති න
ද ත් ක ම් නා උදුරා ඒ පොත් රැගෙ ණ
සිත් ලෙ සි නා ඉරලා ඔහුට බැණ,බැ ණ

155 ද න ත් එකතුවී සිටගත රැළින් රැ ළ
අ සු න් ඔට්ටුවට පත්තන කලින් ක ළ
උ තු ම් බිම සල්තිබෙනා පලින් ප ළ
බ ල න් කොල්ළු පිට්ටියේ සිරි පෙලින්පෙ ළ

156 පාළු නැතුව මොකවත් එහිදිත් බී ළා
සාළුවක් කොල්ලකාගත කර ළා
යාළු නුඹ ගොසින් කොළඹට පසුනොබ ළා
ගාළු දොරකඩින් කොටුවට ඇතුල් වෙ ළා

157 පවර නොයෙක් බිම ජාතිවලින් සපිරිවී හැමය ද
වීතර නොවන බාල මහලුවයසෙහි ලොකු කුඩා අය ද
නිතර බොමින් මත්වීනෙක දුඹබලපානා ගෑම ස ද
එපුර බිම පුරුදුකරණ ඉස්කෝලෙකි දනුව සබ ද

158 සි රි ම ත් එම කොළොම් පුරෙහි වසනගැණු පවා
හොඳ ට
බ ල ව ත් කා[illegible]නරති බොමින් හිමියන් සහ වැද
සටන ට
දරුවොත් එ[illegible]සට බොමින් ගුටිදෙති තම මවු
පියහ ට
මෙ ස ම ත් සැම් කරණ එපුර සිරි බලමින් වෙමින්
සතු ට

159 බේකන් ලිංගුස් සමගිව බීමජාති සරහ නොයෙ ක
කෑමෙන් සහ බීමෙන් හියනොවන හොටල තිබෙන
අනෙ ක
ඒ යම් තැනකට නුඹ ගොස් කා බී යලි නැමති ලෙස ක
සාගන් කොම්පඤ්ඤවීදියට සවසට නැතුවම සැ ක

160 යහපත් ලෙස සරහ නිබඳ ඇතිමාඩත් බොන සලව ල
රසවත් නෙක කැවිලිඳ කා මාඩත් බීලා නිකස ල
නොයෙකුත් සොඳ සූදුත් ඇත ඒ වත් කෙළිමින්
නොපැකි ල
තොපසිත් ලෙස වෙනත්සිතැති දේවල් සිදුකර
එමක ල

161 මෙලෙසින් ඒ රැය පසුකර උදෑසණම නැගිට පෙම් න
කැ ඳි ම ත් දෙරකඩ යන ඒ පුර පරසිදු තැනට පැමි ණ
ප හ ළි න් සංජුවන්ගගේ බැස ඉස්නානයකරග න
ස තො සි න් එයසල කැන්විම තුලවැද බී නැමතිපම ණ

162 හැඬේ කට පැත්තකට තොප්පි ඇද ලා
කාඬේ ගොසින් එන විට හොඳටම බී ලා
මඬේ සහ අගල්වල ඉඳිනවුන්බ ලා
ගුඬේ කියව උන්හට ඉසනමා ලා

163 ව ම ති න බුලත් දෙසිකොල ගෙණ පොඩිකර ලා
ඉ ඹි මි න සුරා බී ඇඟ කිළිපොලා ලා
සැණෙකින අත ගගා ලය විසිළු පා ලා
ග ස මි න කෙලදූවන අය බලව බී ලා

164 නිතියෙන ඒ අසල සල්පිල්වල ඉඳ සා
විකු ණන පිණිස රවටා තුට්ටුවක දෙ සා
උ ව ස න පනම වට්නා බොරු නැතුව ද සා
නෙකදන ඇත උන්ට තුණී කරව නොමඳ සා

165 ලු ග ම එතන තිබෙනා පල්ලිය දෙස ට
කි සි ම සැකක් නොව අත ඔස [illegible] සි ට
අ ද ම බස්කියා දිවුරණ දනන් [illegible] ට
බොහොම ඇත ළඟුන් දූක තු [illegible] ට

166 බෝතද බිම බිගන වෙරමත් ගති න
ආ වු ද ගෙණ හරඹ කර නට මියා යදි න
සි ප ද සින්දුකියමින් විගඩම් කර ණ
ඒ සොද ඉඩම් දූක සකි එපියස තිබෙ න

167 සි රි ම ත් එපියස අබිනුත් කංසද මනා මෙ නා
දෙඩමු ත් කිරිවැලි හකුරුත් රඹ පලයෙනා න නා
දෙ එ මූ ත් හොද පැනිවරකත් සහ රොටි තනාග නා
නො කා ස ත් එකතුව මාඩත් බොනසල දූනා පි නා

168 මෙවෙනී එසලට පැමිණී ගතහිම නසා ල සා
කා ම් නී එසැණින බොම්නී මාඩද තොසා ලෙ සා
දෙ වැ නී තොපඉන් යම්නී රසල දෙසා ය සා
බො මි නී එහිතුල පැමිණී ඉද එසවසා වැ සා

169 සතොසින් බොනදන එකතැන් විසිතු යුරේ ත රේ
බු දි මි න් ඉදගත ළඟුනුත්හට තුනි කරේ ක රේ
අ ස මි න් ඒ දත සතුටින් කියනා හුරේ හු රේ
න ගො සි න් එසැමට නමමින් තගෙ සිතු යුරේ සි රේ

170 සැණෙකිත් ඉදගතකියමින් එදනට තමා න මා
යලිඉන් නැගිසිට ගණිමින් විදුරක් නොමා ප මා
කාරමින් පානිවැඩිවෙනමෙන් බොනසත නිමා නො මා
වැනසෙන්නට දෙස්කරපන් නොබොනා සමා ග මා

---

දෙස්කර මෙලෙස නොමදින් වෙරිමත්ගති න
ලස්නොව පසෙක වැටෙමින් ඔහු මලබැව් න
තොස්ලෙස හසුන් පනකුත් ඒ යැවුගම න
සිස්විය එමහනුවරටයනු බැරිවූයෙ න

එබැවින් මිතුරු සඳ අතයැවු රසොඩ ය
සුපසත් වඩන වදනින් යුතු පණිවුඩ ය
ලොසතන් ඇසුව කරණට තුනි තුඩ තුඩ ය
මෙලෙසින් කියමි සලකා මම ලෙච්චැඩ ය

ලෙව්පසි[illegible]මන්පැ[illegible]හ ගුඳම්නුල රැස්කො ට
සුර සුරන්නටවත[illegible]බියනොව් න
සුර සොඬුන් ස[illegible]ණ නිති බෙද න
සිරිසපිරි සුරි[illegible]රේ[illegible]දේනි නි

අදරවඩන මෙ[illegible]බොන සැමදු[illegible]හ, ට
අදරනොකොට ගිප්නිලින් දුකින්පි ට

පැනින්පුර ලැබුයස සිරිලෙව් දිස් න
නොමින්විරාජිත මැනිඳුනි ගුණපුස් න
බසින් සර කියනා මෙම්පුරුඅස් න
සවන් පුර සවණය කල මැනනොස් න

මැනිඳුනි ඔබ බසට තුන්සිත කරඅද ර
සපැමිණි මෙමලොවෙහි ඇතිසැම සැපඅතැ ර
නිතියෙනි සතවිදින දුක්දුන් එකාඅයු ර
මුවකිනි මමකෙලෙස පවසාලම් මෙව ර

රුසිරෙන් දිළුනු සුනවදුරන් වැනි වුහ
ඉසුරෙන් හෙබුන දනයදි එක් සම වුහ
යසසින් විසූ සතලෙව් අදමගු වුහ
වියතුන් විලස සිටියොද නුනුවන වුහ

අඹුදරු සැපෙන් විසූ විපතට පත් වුහ
ගුණදරු සුදන ලෙව්වැඩඇති මද වුහ
ඩියකරු කුරිරුදුදනෝ අපමණ වුහ
එමපුරු නිරයගැනවත් බිය නොම වුහ

කඳුලු කබපෙරි නිල්නෙත් ර ත් වි ය
මෙකුළු සරිවරල් පොල්මුඩු යු ත් වි ය
ලකුළුමුව සුර ගඳනිති ඇ ත් වි ය
නැබුළු යක්රකුස්ගුණ නොනැවැ ත් වි ය

කුකුල් පොර සුදු තැන තැන දි ස් වි ය
නිමල් මෙත් කුළුණු සැමගුණ සි ස් වි ය
වල් රැ නෙසොරකම් එක ලෙ ස් වි ය
වුල්වල නොමද කරදර රැ ස් වි ය

පරලොව බය සිතමතනට නොග ත් තෝ
පරදර කම් ඇ දුසිරිත නියු ත් තෝ
පරවැඩගැන මදකුත් නොම නැමැ ත් තෝ
ප්‍රණට ගුවිබැටදීමට සම ත් තෝ

පඹයත්විලස මග වැනෙමින් සිව් ත් තෝ
ගණිමින් මුහුරු නොසරුප්බස් බණ ත් තෝ
අඹුවන් සමග නිතියෙන් පොරබද ත් තෝ
කරමින් වමන මග තැන තැන නි[illegible] ත් තෝ

දෙගුරුන් නැදිමසිල්නට [illegible]නාරි ස් සෝ
[illegible]නාමදින් පව්දුසිරි නිතිකරනට තො ස් සෝ
[illegible]රසින් අවිරුගෙණ ඇනමැරුමට ද ස් සෝ
තිරිසත්සත විලස හැසිරෙණ නෙකපි ස් සෝ

මෙසේ ඔබ වදනපිළිගෙණ කර ජේ ම
දුසස් දෙස විපත් සතහට වියබෝ ම
එසේ වූබැවින් මත්පැන් වෙළඳ ම
ලසේ නොව හරිණුමැන දුරුකරලා ම

හල්ලොත් එලෙස දුරුකර මැතිදුනි පව ර
දිමුත්සදෙව් ඔබගුණ පැතිරෙයි ත්‍යා ර
සිවත් මෙලෙස සිදුවූයේ මෙම නපු ර
බලැත් දවල නිරිදුන් වරදින් විත ර

එබැවින් හෙලරදුන් සහ මැතිදුනි ඔබ දෑ
වෙසෙසින් තැත්කළොත් හරණට මෙය නිබ දෑ
රුදුවත් සැම දුසිරිවැලකී ලෙව් නොම දෑ
සසසින් බැබලේය දෙව්පුර එව් පබ දෑ

දුසිරි දුරුව සුසිරිත වැඩිවන් තේ ය
අපිරි බිණුම් සවණෙහි නොවැනෙත් තේ ය
පැතිරි දහම් සතසිත හෙලිවන් තේ ය
සපිරි ගුණෙන් මුළුලොව බබලන් තේ ය

මිතුරුකමින් සැමදෙන පසුව ත් නා හ
දෙගුරු ගුරුන් ගරුකොට සලක ත් නා හ
කුරිරු බැවින් නිරතුරු වැලකෙ න් නා හ
සිරුරු වැනුම් නෙදුකින් දුරුව ත් නා හු

අගාලස්වම දුරැරියොත් රුදු මත් පා න
මෙලෙස්වැඩ ලොවැවත්නෙය අසමා න
මබස් පිළිගතොත් මෙත්ගුණයෙන් ජ න
යසස්ඔබ් දිලෙයි ලොව නැත අනුමා න

සුරසොඬකු අත පෙරදින යැවු හසු න
සරකිවෙමි සලකාලෙව් වැඩ නොම් න
හැරියුගැස කියවා මෙය ගෙණතොසි න
සුරාදුරින් දුරුකල මැනවිය සෙදි න

නිමි.

# පොල් වැවිලි සඟරාව.

ඇම්. ඇස්. පේ‍රර අප්පුහාමි

විසින්

කාරණ සොයා බලා පොල් වැවීමට ඕනෑ

කාරණ සියල්ලම උපදෙස් සංක්‍ෂෙපව

මෙහි අඩංගුකර තිබෙනවාය.

COLOMBO:

PRINTED AT THE CATHOLIC ORPHAN PRESS.

1886.

*[All Rights Reserved]*

# දැන්විමයි.

ලංකාවේ බොහෝදෙනා වැඩි ප්‍රයෝජන ලබන්නේ පොල්ගස්වල උපකාරයෙන්ය-එකී පොල් වැවීමට කාරණ තේරුම්ඇති අයවල් කොපමණ සිටියේවීනුමුත් ඒ ගැණ අපරට ජනයාට ව්‍යවහාරකෙරීමට මේ වනතුරු පොතක් ප්‍රසිඩකලේ නැත-නුමුත් කිසි ප්‍රයෝජනනැති රඟ කවිසිඳු පොත්පත් අණේකාකාර දැනට පතලවී තිබෙනවාය-ඕනෑනැති පොත්පත් මෙපමණ පතලවී තිබෙද්දී අපමණ ප්‍රයෝජන ඇති පොල් වැවීම සඳහා පොතක් නැති බැවින් ඒ ගැණ කල්පනාකර මම දන්නා පමණින් මෙම පොත කරණලද්දේය-මෙපමණ කාලයක් ලංකාවේ පොල්ගස් වැවීමේ පොත් බලාගණ්නායි මෙහි තිබෙන ගුරුකම් කව්රු නොදනිද්ද කියා සමහරු කල්පනාකලේවීනුමුත් පොල් වතුවලදී මතකනැතුව අතපසුවෙන වැඩ මේ පොත බැලීමේදී මතක්වෙනවා පමණකුත් නොව ඉතා ඕනෑකමින් මුදල් වියදම්කර පොල් වවන සියල්ලෝම මගේ මේ උත්සාහයට සතුටුවෙතැයි කල්පනාකරමි-පොල් වැවීමට හොඳ ඉඩම් මෙවාය නරක ඉඩම් මේවාය කියා අඳුන්වාදීමද ගෙඩි පොල් තවාන්කෙරුමද කැලෑ එළිකෙරුමද ලැසින් ගැහීමද අඩිගණන්වල අඳමින් අක්කර ගණන්වලට හිටවෙන ගස්වල ගණන්ද පොල්පැල හිටුවන විධියද ඕනෑකාරණ වැඩ පන්නාවූදෑදියද පලදරණවිට කාරණ විධියද උදවිය තබන විධියද ලියුන්කියුන් සහ මාසේකට වරක් ලැයිස්තුවක් සාදන පිලිවෙලද යනාදී නොයෙක් කාරණ මෙහි අඩංගුව ඇත-තවද ව්‍යාකරණදියට විපරිතව මෙම පොතේ අනේකාකාරයෙන් වචනවල දෝසයන් ඇත-එයාකාර ශාස්ත්‍රානුකූලයක් මෙයින් දැනගැණීමට නොව පොල්වතුවලට පමණක් ඔබිනාකාර කාරණසංක්ෂේපවශයෙන් මෙහි

ඔහලන්ඩ යෙදුමෙන් පොත ලොකුනොවී කුඩාවී තිබෙන්ට ඕනෑ නිසාය-තවද මෙහි ඒ. අක්ෂරය දරණ පිටේ වැක්රෝලේ කුරුවිට පොල්වත්තය-පී. ඒ. මහත්මයා අසිතිකාරයාය කියා උපමා වසයෙන් දැනගැණීමට යොදා ඇත-මෙම පොත නැවත අච්චුගැසීමේ බලය කර්තෘ වෙතම තබාගත් බව මෙයින් දන්වමි.

මේ බවට, M. S. P,

# පොල්වැවිලි සඟරාව.

## හොඳ ඉඩම් ගැණිය.

යම් ඉඩමක් පොල් වැවීමට සුදුසුද කියා දැනගැනීමට පලමුවෙන් කරණ විභාගයනම් පොලවේ මතුපිට පටන් අඩි පහක් නොහොත් හයක් පමණ ගැඹුරේ කපා බැළුවිට එකාකාර කළුවන් දුඹුරුපාට සහ වැලි මිශ්‍රවූ පස් බරඇති සීතල සහ කසට රසවූ බොරළු නැති පොලවද එසේම ඉහතකී ලක්‍ෂණ සහ පිලිනු වූ ගඳින් රතු පස්ඇති පොලවද සිසිල් සුවඳක්ද ඝවල් පයක් තුළු රස සහ කහපාට පස්ඇති පොලවද ගම්මිරිස් ඇටවල ප්‍රමානයේ පටන් ඉඟිනිඇටවලට වඩා ලොකුනැති බොරළුත් එහි කළුමැටි වැලි හා මිශ්‍රව එකී බොරළු ඝණසැරේට නැතුව අඩිපහක් හයක් යට යනතුරු කබොක්ගල සුදු මකුළු බොල් මැටිත් නැති පොලවද මතුපිට හීන් සුදු වැලි කළුමැටි සමග පෙනිපෙනි අඩි තුනහතරේ යටදී හුඹස්මැටි අඳුමට ද ඉතුත් යටදී දුරින්දුර කළු බොරළු වැලි පස් මිශ්‍රවූ පොලවද තැනින්තැන ලොකු තද කළුගල් පළිතා ඇතුව කළු හෝ දුඹුරු හෝ කහ හෝ රතු හෝ වණියන්ද බර පස්ඇති දැනිමෙන් ඝවල්පයක් එනු රස ඇති පොලවද සාමාන්‍යයෙන් හුඹස්මැටි ආකාරයට රතු දුඹුරුපාටින් මදක් වැලි මිශ්‍ර කොහෙත්ම බොරළු තිරුවානා පතුරුනැති පොලවද අඟල් හතරට පහට දුරින්දුර ගම්මිරිස්ඇට කෝපිගෙඩි තරමේ වටවූ තනි බොරුළු කළුපාට බර පස්ඇති පොලවද අඩිදෙකතුන ගැඹුරේදී තද කබොක්ගල් ඇති උඩ පෝර පසෙක් යුක්තවූ සමහර ඉඩමුත් පොල්වැවීමට ඝවලපයක් හොඳය–එකී ගල්තුරේ තුවාලවලින් මුල් ඇදෙන්ට සුළුවන්ව සිසිල් ගතියක් තිබෙන්ට ඕනෑය–මෙසේ. කියාපු ඉඩම් සහ පල්ලම්දෙනි අගාරපිල්ලෑ යනාදිවූ

දියහීරා ඇති කොයි ඉඩමුත් අගල්ඇර වැවීමටත් හොඳ බව බොහෝ තැන්වල වැවිලිවලින් පෙණීයනවාය-හොඳවූ කොයි ඉඩම්වල නුමුත් ඉබේට වැවෙන වල්ගස් ජාතිවල කොල සම්පූර්ණවී තෙල් පාටින් දිලිසී නිතර දළුදමා කඳන්වල අතු ලියලා මස් වැඩී ඇත්තේය. කොපමණ හොඳ ඉඩම් නුමුත් සමහර තැන් නිසරුව තිබෙනවාය. පොලවක වැඩි කොටසක් හොඳට තිබී ඉතා ටික හරියක් නිසරුවුනාට පාඩු නැත. දිරාපත්ව පොලුවට ජීර්ණවෙන ද්‍රව්‍යයන් ඇති පොලව සරුය-එසේ නැති පොලව නිසරුය. පොලවේ පස් නොයෙක්විට තැනින්තැන පාට වෙනස්ව තිබෙයි, අනූපය ජඟලය සාධාරණයැයි කියා පොලව ගැණ දේශගුන තුන් ප්‍රකාරයකට කියා තිබෙනවාය. වෛද්‍යාතන්ත්‍රයන්හී පොලව ගැණ කියා තිබෙන කාරණ මෙහි නොබහන්නේ පොත ලොකුවෙනවා පමණකුත් නොව පොල් වැවීමට ඒ කාරණ ඕනෑ නැති නිසාත්ය. අපෝ තේජෝ වායෝ පොලව සම්බන්ධව පවතිනවාය.

---

## නරක ඉඩම් ගැණය.

සුදු මකුළුමැටි සහ බොල්රසවූ සැහැල්ළු පස් ඇති පොලවද නියඟ කාලයේදි ඉරිවැටෙන කරමැටි පොලවද මැටිපස් නැති තනිකර සුදු වැල්ලත් යටදී මකුළු මැටිත් ඇති පොලවද. බොරළු සහ තියුනු තිරුවානා ඇති පොලවද සුදු රතු මිශ්‍රව බොරළුබදවූ තිරුවානා පතුරු සහ රත්පාට කුඩුගල් ඇති පොලවද සුදු දලවැලි සම්බන්ධව ඒකාකාර සණ බොරළු ඇති පොලවද සමහරවිට මතුපිට හොඳ පසුත් අඩියක් දෙකක් යටදී බොරළු සුදු වැලි මකුළු මැටි ඇති පොලවද කහපාට කැටගල්බදව පතුරු ගැලවෙන රතු ගල් තහාඩු ඇති පොලවද. පඬුවන්පාට මැටි සහ ජීන් සුදු වැලි ඇති පොලවද. මෙම ඉඩම් සමහරවිට උස්වූ තේජෝ ගුනය කරණකොටගෙණ ලෝහ

සම්බන්ධවූ ඉඩම්ය. සමහර පලාත්වල මෙයාකාර ඉඩම්වලදී මිනිරම් සම්භවෙනවාය, මෙකී නරක ඉඩම්වල පල්ලම්දෙනි අගාරපිල්ලෑ අගල් කපා දෙපැත්තට පස් ඇර ඒ උඩ පොල් හිටුවා වැවුනත් හොඳකාර පලදීම ටික කාලයයි. එතැන් පටන් ගස්වල කරටි හීන්ව කොල රත්පාට නොහොත් කහපාට වී නිසරුවෙනවාය. නරක ඉඩම්වල ඉබේට වැවෙන වල්ගස් පැලෑටි ජාති බලාපුවාම කොල අසම්පූර්ණව කහපාටවී වේලිච්ච පුල්ලිද කොල නැති අතුල්ද දළු ඇරීමක් නැතුව කඳන් හීන්ව ලියලීම අඩුව පොතු තුනීවා සහ මලානිකව ඇත. මේ දෙප්‍රකාරයේ ඉඩම් හිතටගත්තාම මීට වෙනස්වූ වෙනත් හොඳ නරක ඉඩම් තෝරාගන්ට පුළුවන. නරක ඉඩම්වලත් තැනින්තැන හොඳව තිබෙනවාය ටික කොටසක් හොඳට තිබී වැඩි කොඨාසයක් නරකනම් එකී ඉඩම්වලින් පලක් නැත. දිරා පොලවට ජීර්ණවෙන ද්‍රව්‍යයන්ද මානගුල්වලින් කීපවාරයක් හාලා අපෝ ගුනය පාන්ඩ පුළුවන්කම හෙවත් දියහිරාව පවත්වන්ට පුළුවන්නම් කොයි පොලවෙත් නොයෙක් ජාති වවන්ට පුළුවන-ලෝහ බොරළු තද කබොක් සුදු මකුළු යනාදි ඉඩම් හැර අනිකුත් මොන අඳුමේ ඉඩම් නුමුත් මූදට කිට්ටුනම් පොල් වැවෙනවා ඇත.

---

## ගෙඩි පොල් තවාන්කෙරුම ගැණය.

පොල්වත්තක් වැවීමට යෝජනාකරණ අය පළමුවෙන් කරන්ට ඕනෑ ප්‍රධාන කාරණාවනම් හිටුවන වකවානුවෙන් අවුරුද්දකට නොහොත් මාස දහයකට ප්‍රථම ගෙඩි පොල් තවාන්කෙරුමය-එවන්ඩ කල්පනාකලේ කොයි ප්‍රමාණ ඉඩමක්ද ඊට පලමුවෙනි වතාවේ හිටවීමට පොල්පැල කොපමණ ඕනෑකරණවාද කියා ගණන්බලා පැල පන්දහාසක් ඕනෑවෙයිනම් ගෙඩි පොල්ද සදහාසක් තවාන්කරන්ට ඕනෑය-මෙසේ එක්ත්එක වැඩිකල කාරණාවනම් පැලවී

මේදී සමහරක් කුණුවීමටත් සමහරක් කොට්ටවීම ටත් සමහරක් පැලඋනත් කුරුවීයන නොයෙක් බාධා නිසාය-පලමුවෙනි වතාවේ හිටුවන පොල්පැල ගෙඩිතුල වතුරනැති කරඬු මහතවූ එකාකාර හොඳ පැළ හිටුවාපුවාම වැවීමට ලේසිවා සහ වැඩි පාඩුනැතුව වැවෙනවාය.

තවාන්කරණ විධියනම් දවාලකින් දෙකෙන් පඟුවක් නොහොත් උදේ නමයේ කනිසමේ පටන් සවස තුනේ කනිසම වෙනතුරු අව්ව වැටෙන වගේට ගස්කොලන් ආදිය තිබෙන එලිමහන් හොඳ ඉඩමක් බිම් පෙරලෙන්ට කොටවා නොහොත් නගුල් වලින් හාලා එහි තිබෙන මුල් ආදිය අහක්කර මේ ලිව්වි රොඩු පරඬල්වලින් එකී ඉඩම වසා ගිණිතිබා දවාසින් පසු එම අළු සමග කාලවන්වෙන්ඩත් පස් කැට ලිහෙන්ඩත් සමග තව විඩයක් කොටවා නොහොත් හාලා දෙවනු පොලව මට්ටන්කර තිවූනායින්පසු පියිලි ආකාර සුන්වි අගල් බේරා පැසුනුවත් නොව ලපව්වත් නොව මධ්‍යම තරමේ තුන්ඉරි පැසිච්ච හොඳ පොල්ගෙඩිවල ඇස්ස මතුකරතබා ගෙඩියෙන් තුනෙන් දහුලක් පසෙන් යටකර අව්වට නොවේලෙන රඟින් වැස්මක් දමනු-කූරු ඇදී පැල වේගණඑන කාලේට වැස්ම අරණ්දමා අළු මිශ්‍ර දූව්ව පස් සුළුපයක් උඩින් ඉසිනවානම් හොඳය-නියඟ කාලයක්වී අව්ව පායනවා තදනම් පස් දවසකට වරක් බැගින් අළු යම් උදේ වතුර ටික ටික වත්කරනු-තවාණේ පැල ප්‍රවේසම්වීමට හොඳකාර වැටබඳු තිබන්ට ඕනෑය-තවාණේදි පොල්පැලවලට ඕනෑවාට වඩා පෝර ශපසාත්තුකරන්ට යෙදුනොත් වල් වල හිටෙව්පසු වැවෙන්ඩ බාධා පැමිණෙනවාය-බිම් පෙරලා ගිණිතිබක්නෙත් අළු මිශ්‍ර පස් ඉසින්නෙත් වේයින්නෙන් ප්‍රවේසම්වීමටය-පොල්පැලවලට අළු ප්‍රධාන පෝරය-(නුමුත් ඊටවඩා හොඳ පෝරත් ඇත) සමහරු ගෙඩි පොල් ඇඳලා ගස්උඩ අතුවල රඳුනී

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

බා පැලකරගන්නවාය—එකී පැල හිටුවාපුවාම ඉක් මණින් පොලවට මුල් ඇදගන්නවාය—නුමුත් දහස් ගණන් එසේ ගස්උඩ පැලකරගැණීම අමාරුවා සහ කොට්ටවීමට බොහොමයක් යන නිසාත් පොලවේ හොඳය.

---

## කැලෑ එළිකෙරුම ගැණය.

වවන්ඩ තිබෙන ඉඩම කැලෑව නොහොත් මුකලානනම් එය ගොවිතැන් බෝගකෙරීමට ඔබ්දූයි වි මසා ඔබීනම් ගොවින්ව කැඳවා කැලේ එළිකරගණ ගොවිතැන්කාරන්ට බාරදීමද එසේ ගොවිතැනට නොබීනම් කොන්ත්‍රාත්දීලා හෝ තමා විසින් උදවිය ලව්වා ජනවාරි මාස්වලදී කැලේ කප්පවා වේළුනායින්පසු වැස්සවට අසුවෙන්ට පෙර ගිණිතිබා දවායින් පසු ඉතුරුව තිබෙන අතුල් දෙවනුත් ගොඩවල් ගස්වා පුළුස්සා අප්‍රේල් අන්තිමවෙනු පෙර එළිකර ලැයිම්ගස්වා වල් කපන්ට පටන්ගන්ට ඕනෑය—මෙම එළි කෙරීමේදී දවදැඩු තැනින්තැන තිබුනාට දෝසයක් නැත—ඉතින් ඔන්න ලඟදී වසින වැස්සව පටන්ගන් නකොට පොල්පැල හිටුවා ඉවරකරණ හැටියට වග බලාගන්ට ඕනෑය—සමහරවිට මැයි මස අග හරියේදී වැස්සව පටන්ගන්නවා ඇත—ඊට දවස් අටකට පමණ ප්‍රථම පොල්පැල හිටෙව්වොත් හොඳය—වැස්සව වසින කාලය මන්සූරම්වලින් දනගන්ට ලැබේය.

---


## ලැයිම්ගැහීම ගැණය.

ලැයිම් ගැහීමනම් හතරපැත්තටම ඇද නැතුව පොල්වල් පේලි හරියට තිබෙන්ට ලකුණුකෙරීමය—පලමුවෙන් තමාට ඕනෑ පැත්තට දෙපේලියක් ඕනෑවූ අඩිගණනට දිගටම ලකුණුකර හරහටත්, පරහා නැතුව දෙපේලියක් දිගට ලකුණුකර එතැන් පටන් ඒ පේලිවලට අල්ලා ඕනෑ දුර ගණනට ලකුණුකර

වල් කප්පනවාය–ලෑසිම් ගහණවිට කෑදක් අසුව එන
වානම් එහි උස්මිටි වාසිය වැඩිව හෝ අඩුව හෝ ත
බා ලකුණුකරන්ට ඕනෑය–එසේ නොකලොත් පෙ
ලී ඇදුවෙනවා ඇත.

---

## ලෑසිම්ගහන ගුරුකම.




ඇදනැතුව ලෑසිම් ගැහුනොත් මුළුවලට ලනු ඇද බැළුවිට මිම්ම හරියටත් මුළුවලාව වැටෙන පේළි ඇදනැතුවත් තිබේය–මෙහි 1 වෙනි 2 වෙනි ඉලක් කම් දරණ රේඛා දෙක පලමුවෙන් තමාට ඕනෑකර ණ පැත්තට අදින ලනු දෙකය–ඒ දෙකේදි ඕනෑකර ණ අඩි ගණනට වල් කපනතැන් ලකුණුකරණවා

ය-ඊටපසු 3 වෙනි 4 වෙනි රේඛා දෙකේ ආකාරෙට ඉහත ලකුණු අසුකර පරහා නැතුවලදුඇද හරහට අඩිගණින ලකුණුකරණවාය-එසේ හරියාකාර ලකුණුකල ඉක්බිති ඕනෑ දුරකට ඇදනැතුව හතර පැත්තටම එකාකාර තිබෙන්ට ලකුණුකලහැකිවෙයි.

---

## 6 පොල්වලවල් කැප්පීම ගැණය

අඩි 22 කේ සිට අඩි 30 දක්වා දුරපහරව පොල් වලවල් කපන සිරිත් තිබෙනවාය-පොල්ගස් කිට්ටු උනාම පලදෑරීම අඩුය-දුරඋනාම පලදෑරීම වැඩිය-ඒ නිසා අඩි 26 ය නොහොත් අඩි 28 ට හොඳ තරමේ ගණන්ය-අඩියනම් පියවරයක් නොව අගල් 12 ගේ ඉංග්‍රිසි ආණ්ඩුවේ කෝදුවේ ගණනය-මෙයාකාරයෙන් තැනිතලා ඉඩම්වල පොල්පැල හිටුවන වලවල් අඩි 3 ක් පලල සහ අඩි 3 ක් ගැඹුරෙනුත්ය. පස් සේදීයන බෑවුම් ඉඩම්වල අඩි 3½ ක් ගැඹුරෙනුත් අඩි තුනක් පලලිනුත්ද, තද පොලව බොරළු මිශ්‍ර ඉඩම්වල අඩිහතරක් ගැඹුරෙනුත් අඩි හතරක් පලලිනුත්ද, අගල් අරින්ට තිබෙන ඉඩම් හෙවත් වතුර උනන ඉඩම්වල පොල්ගෙඩියේ ප්‍රමාණයට දිගපලල ගැඹුර නැතුව වල් කපනවාය-සමහරවිට අගල්කැපූව පසු ඒ පස් උඩත් පොල්පැල හිටුවනවාය-තෙත්ගතිය අඩු උස් ඉඩම්වල වලවල් ගැඹුර අඩි 4 ට අඩුනොවිය යුතුයි-අමාරුවිදලාවත් ගැඹුරු වල්වල පොල් වවන්ට උත්සාහකලයුතුයි-තවද මෙහි බහා තිබෙන ගණන්චක්‍රයේ සුළු දෝෂයක් ඇත-එය පහසුවෙන් තේරුම්ගැණීමට මදක් කියම්-තිහේ අඩි ගණන් පෙළේ අක්කර 1000 ගේ කොටු තීරේ පෙන්වා ඇත්තේ පැල 48000 ක්ය-නුමුත් පැල 48400 යක් හිටවෙනවාය-එබඳු දෝෂයක් වෙන්ට යෙදුන කාරණ මෙය බලන කාටත් ඇඟෙනවා ඇත-ඒ නිසා සම්පූර්ණ පැල ගණනටත් අක්කර 1000 ගේ කොටු තීරේකුත් මෙහි යොදා ඇත.

# දුරස්තරවූ අධිගණන්වල අන්දමින් අක්කර ගණන්වලට කැපෙන බිල්වල ගණන් චක්‍රය.

| අඩි ගණන | අක්කර ¼ට බිල් ගණන | අක්කර ½ට බිල් ගණන | අ. ¾ බ. ගණන | අක්කර 1ට බිල් ගණන | අක්කර 2ට බිල් ගණන | අක්කර 3ට බිල් ගණන | අක්කර 4ට බිල් ගණන | අක්කර 5ට බිල් ගණන | අක්කර 10ට බිල් ගණන | අක්කර 20ට බිල් ගණන |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 18 | 33 | 66 | 99 | 133 | 266 | 399 | 532 | 665 | 1330 | 2660 |
| 19 | 30 | 60 | 90 | 120 | 240 | 360 | 480 | 600 | 1200 | 2400 |
| 20 | 27 | 54 | 81 | 108 | 216 | 324 | 432 | 540 | 1080 | 2160 |
| 21 | 24 | 48 | 72 | 98 | 196 | 294 | 392 | 490 | 980 | 1960 |
| 22 | 22 | 44 | 66 | 90 | 180 | 270 | 360 | 450 | 900 | 1800 |
| 23 | 20 | 40 | 60 | 81 | 162 | 243 | 324 | 405 | 810 | 1620 |
| 24 | 18 | 36 | 54 | 75 | 150 | 225 | 300 | 375 | 750 | 1500 |
| 25 | 17 | 34 | 51 | 69 | 138 | 207 | 276 | 345 | 690 | 1380 |
| 26 | 16 | 32 | 48 | 64 | 128 | 192 | 256 | 320 | 640 | 1280 |
| 27 | 14 | 28 | 42 | 59 | 118 | 177 | 236 | 295 | 590 | 1180 |
| 28 | 13 | 26 | 39 | 55 | 110 | 165 | 220 | 275 | 550 | 1100 |
| 29 | 12 | 24 | 36 | 51 | 102 | 153 | 204 | 255 | 510 | 1020 |
| 30 | 12 | 24 | 36 | 48 | 96 | 144 | 192 | 240 | 480 | 960 |

## දුරස්තරවූ අඩිගණන්වල අන්දමින් අක්කර ගණන්වලට කැපෙන වල්වල ගණන් චක්‍රය.

| අඩි ගණන් | අක්කර 30 ට | අක්කර 40 ට | අක්කර 50 ට | අක්කර 100 ට | අක්කර 500 ට | අක්කර 1000 ට ලැබෙමින් වැඩි ලෙඩි ගණන් | අක්කර 1000 ට ඇමෙරිකා ක්‍රම ගණන් |
|---|---|---|---|---|---|---|---|
| 18 | 3990 | 5320 | 6650 | 13300 | 66500 | 133000 | 133956 |
| 19 | 3600 | 4800 | 6000 | 12000 | 60000 | 120000 | 120409 |
| 20 | 3240 | 4320 | 5400 | 10800 | 54000 | 108000 | 108900 |
| 21 | 2940 | 3920 | 4900 | 9800 | 49000 | 98000 | 98596 |
| 22 | 2700 | 3600 | 4500 | 9000 | 45000 | 90000 | 90000 |
| 23 | 2430 | 3240 | 4050 | 8100 | 40500 | 81000 | 81776 |
| 24 | 2250 | 3000 | 3750 | 7500 | 37500 | 75000 | 75625 |
| 25 | 2070 | 2760 | 3450 | 6900 | 34500 | 69000 | 69696 |
| 26 | 1920 | 2560 | 3200 | 6400 | 32000 | 64000 | 64009 |
| 27 | 1770 | 2360 | 2950 | 5900 | 29500 | 59000 | 59536 |
| 28 | 1650 | 2200 | 2750 | 5500 | 27500 | 55000 | 55225 |
| 29 | 1530 | 2040 | 2550 | 5100 | 25500 | 51000 | 51529 |
| 30 | 1440 | 1920 | 2400 | 4800 | 24000 | 48000 | 48400 |

අඩි 18 ට වඩා කිට්ටුවෙන්වත් අඩි 30 ට වඩා දුරින්වත් පොල්පැල නොසිටුවන නිසා 18 වේ පටන් 30 හ දක්වා ගණන් මෙහි යොදා ඇත-මෙකී ගණන්වලින් අඩුවැඩිවෙතොත් ඉඩම වටේට යන පේලිය පමණක්ය-තුමුත් සිරිත් ගණන මෙයාකාරය-සමහරවිට වත්තකින් අක්කරයක් යම් ඕනෑකම කට හතරැස්කරගන්ට ඕනෑවුනොත් එක පැත්තට අඩි 208 කුත් අඟල් $8\frac{1}{2}$ බැගින් හතර පැත්තම මැණගත්තාම හතරැස් අක්කරයක් වේය.

## පොල්පැල හිටවීම ගැණස.

තවානෙදී ගෙඩිය සමග තිබෙන පොල්පැලවල මුල කරඬුවට රිදුමනොදී ගෙඩිය සමග තිබෙන තැනින් ප්‍රවේසමෙන් ගෙඩියට යටින් උදැල්ල ගසා උදුරා ඇතුලේ වතුරනැති හොඳ පැලවලින් ගෙණ දිගට තිබෙන මුල් කපාහැර ගෙණගොස් පේලියට කප්පවා තිබෙන වලවල් ඇතුලේ මැද පොල්ගෙඩියේ තරමට දෙවතුන් සාරවා එහි පොල්පැලේ තබා ගෙඩියෙන් හතරෙන් තුන්පඟුවක් වැසෙන්ට පස්දමා වෙට්ට පාගා තදකරණු–මෙයාකාර කරණවිට ගෙඩිය වටේට කොන්දගන් කුඩු මදක් පොලවට මිශ්‍රකර තදකලොත් ගෙඩිය වේයෝ නොකණවා සහ මුල්ඇදීමටත් බාධා නොපැමිණේය–අළුද හුණු අළුද තනිකර වැලිද කියනෙන් ලී ඉරණවිට වැටෙන කුඩුද මූදුවෙරලේ සණවූ දල වැලිද එනුද යනාදී ද්‍රව්‍යයන්දමා පොල්පැල හිටුවනවාය–ඒසේ කෙරීම වේයින්ගෙන් ප්‍රවේසම්වීමට සහ මුල්ඇදීමටත් ඉතා හොඳය–වර්ෂාව කාලයක් ලබන්ට කිට්ටුව පොල්පැල හිටුවන්ට ඕනෑය–ප්‍රධානකොට මැයි මාසේ අගහරියේදීද, සමහරවිට ඔක්තෝම්බ්‍ර මාසේ මැද හරියේදීත් හිටුවනවාය–පොල්වලේ ඇතුලට වතුර ධෝරයක් එන්ට හේතු තිබේනම් එය මගහරින්ට ඕනෑවේය–පොල්පැල පලමු වතාවේ හිටුවනවිට අතරතුරේ පොලව මතුපිට පැලූ 10 ට එකක් බැගින් වැඩියේ හිටුවනවා බොහෝසේ හොඳ වැඩක්ය–ඒවා අවුරුද්දක් පමණ පසුවෙනවිට නොහොත් ඊට වැඩි කාලයක් පසුවෙනවිට වලවල් ඇතුලේ පාඩුවෙන නොහොත් අනතුරුවෙන පොල්පැලවලට අඩු හිටුවන්ට බෝල කපාගන්නවාය–එවිට සෑම පොල්පැලම එකතරමට වවන්ට ලේසිවෙනවා ඇත–පොලවේ නිසරුකමින් බාලවෙන පොල්පැල ලඟ හෑමෙන් හෝ පෝරදීමෙන්වත් ඉක්මනට වවාගත්තොත් එත්තේ පෙනීමත් ප්‍රයෝජ

නැයත් හොඳය–සමහරු වලවල් කපා ඒ අසල වවේ
ට තිබෙන උඩ පෝර පස්වලින් වලෙන් පඟුවක්
ගොඩකර ඒ මැද පොල්පැල හිටුවනවාය–එකී හිටවී
ම බුරුල් පස්ඇති ඉඩම්වලනම් හොඳය–තද පස් බො
රළු මිශ්‍ර පොලවේනම් එසේ කෙරීම හොඳනැත–එන
ම් පෝර පසේ මුල් සනීපෙන් ඇදී හොඳට ගස් වැවී
ඇවිත් තද පොලවට මුල්ගියාම මුල් කුසවී ගසුත්
බාලවෙනවාය–පෝර පස් නොදමා හිටුවන පොල්
පැල දුක්විඳවිඳ අමාරුවෙන් පොලවට මුල්ඇද පෝර
පස් තැන්තැන තිබෙන තැන් කරා මුල් පැමිණ
ටිකක් ප්‍රමාදවෙවී වැවෙනවාය–එයාකාර පොල්
පැල සමහර ඉඩම්වලදී කල්යාමෙන් නිසරුවෙන්
නේවත් පලදැරීම අඩුවෙන්නේවත් නැත–පොල්වැවී
මේදී අඩු පැල හිටවීමට තවානේ නිතර පැල තිබෙ
න්ට ඕනෑය.

---

## පොල්පැල ප්‍රවේසම්කෙරීම ගැණය.

පොල්පැල හිටෙව්වායින් පසු හුලඟට වැණෙන
වා සෙලවෙනවා හැර වෙන අන්දමකින් සෙලවෙන්
ට නාරිනු–එසේ සෙලවුම්පෑවොත් මුල්ඇදීමට බාධාව
ක්ය හිටුවා මාස හතරක් නොහොත් හයක් පමණ
පසුවෙනවිට මුල් පොලවට අල්ලාගන්නවාය–ඒ අව
සතාවේදී හරක් ඌරෝ එළුවෝ යනාදි සිවුපාවුන්
නෙන් ප්‍රවේසම්වීමට කලින් වැටවල් බැඳීම අගල්
කැපීම හෝ වෙන අන්දමකින්වත් පොල්පැල ආරක්ෂා
කරන්ට ඕනෑය–හරක් යනාදි සිව්පාවුන් පොල් පැ
ලේ සොලවා කොල ඇද කනවාය–ඒ ගස් දෙවනු ලී
සලන නුමුත් වැවීම ඉතාමත් බාලවා සහ ප්‍රමාදවෙන
වාය–වර්ෂාවට සේදී එන පසෙන් පොල් හිටුවාපු වල
වල් ගොඩවුනොත් ඒවායේ පැල කුනුවෙන්ට පලමු
වෙන් පස් අරන්දමන්ට ඕනෑය–අළුත හිටුවාපු පොල්
පැලවලට මුළු දවසේම වැටෙන තද අව්ව පමණකට
පොරොත්තුවීම පිණිස කෙසෙල් කපුගස් යනාදි වැවු

ම් ටික කලකට තිබෙන්ට වවා අවුරුදු තුන හතර වෙනවිට එක් අමුනු වැව්ලි නැතිකරදැමීම හොඳය- කෙසෙල් වැවීමේදී පොලවේ පෝර රසය ඉක්මණි න් නැතිකරණවා සහ කෙසෙල් අල කුණුවීමෙන් උපදින පනුවන්ගෙන් පොල් මුල්වලටත් අනතුරු පැමිණෙන්ට පුළුවන-කජු මුල්වලට ක්‍රිමි ජාති බෝනො වෙන ගතියක් තිබෙනවා-කෙසෙල් තිබුන ඉඩම්වල කඳපනුවෝ වැඩි බවත් කෙසෙල් නොහිටුවාපු ඉඩම් වල කඳපනුවෝ නැති බවත් පෙනීයනවාය-ස්වල්ප ප්‍රයෝජන බලා අමුනු වැව්ලි පොල්වතුවල නොවවමින් ගොයිතැන් ඉවරවුනු පසු පොල්පැලවලට සාත්තුව හරියාකාර කලොත් වඩා හොඳය-පොල්පැල වැසී යන තරමට ඉක්මණින් වැවෙන වල් පැලෑටි ජාති වී ගස නාසතිකරන්ට ඕනෑය-පොල්පැලවලට කෙලින් උඩින් සෙවනක් එනම් දහයේ කනිසමේ පටන් දෙකේ කනිසම වෙනතුරුවත් අව්ව නොවැටෙන මුවාවීමක් තිබේනම් ඉක්මනින් එය එළිකරන්ට ඕනෑය- පොල්පැලවලට සෙවනවීම ඉතා නරක දෙයක්ය- පොල්පැලවලට සුලඟ වදින පිණිස අසල වටේ කැලේ එළිකරන්ට ඕනෑය-පොල්වතුවල පවතින අන්දමට පැලඉනි හිටුවා වැටබඳින්ට ඕනෑය.

**දියහිරා ඉඩම්වල පොල්පැල හිටවීම ගැණය**

මද වර්‍ෂාවට පවා යම් ඉඩමක වතුර ගලාහිටීද නියකාලයේදීත් නිතරම වාගේ දියහීරාව තිබේද එකී ඉඩම්වල පොලව මතුපිට ගෙඩිය පමණක් වැසෙන අන්දමට පොල්පැල හිටුවා සුමාණයක් නොහොත් එකහාමාරක් පසුවෙනවිට පොල් ලැයිම මැදින් අඩි හයක් හතක් පමණ පලලඇතුව අගල්දමා පලමු වෙනි වතාවේ එකී අගල් අඩියක් පමණ ගැඹුරේ කපා ඒ පස් පොල්පැල තිබෙන බිම් තීරුව දිගේ ගොඩ කර පොලව උස්කරනු-දෙවෙනි අවුරුද්දේදීත් එම පොල්පැල වටේ තිබෙන වල් තන ජාති සැහැදමා එම අගල් තව අඩියක් ගැඹුරේ කපා ඒ පසුත් පොල්

පැල තිබෙන බිම්තීරුවල ගොඩකරනු-තුන්වෙනි හතරවෙනි අවුරුදුවලත් එයාකාර කරනු-මෙකී අගල් උඩ තිබෙන පොල්පැලවලට අවුරුද්දෙන් අවුරුද්ද අළුත් පස් ලැබෙන නිසා බොහෝ ඉක්මනින් වැවී පීදී පලදරණවා ඇත-මෙකී ඉඩම්වල පොල්පැල සමහර ඒවාට දියරක්ත ගහගණි එසිනම් ඒ පැල තාවත් පොලව උස්සා අගල් ගැඹුරු කරවන්ට ඕනෑය-අටදිනකට වඩා ගැළු වතුරක් නොබැස තිබීමෙන් පොල්මුල් කුණුවෙනවා ඇත-එවිට ඒ වතුරබැසයන අන්දමක් කරන්ට ඕනෑය-වත්තේ පෝර සේදී පිට නොයන හැටියට අගල් කපන්ට ඕනෑය-අළුත් පස් විටින්විට ලැබීමෙන් කොයි ඉඩම්වල නුමුත් පොල්පැල පොහොනිවෙනවාය-දෙවනු මෙකී අගල් වෙනායමකින් ගොඩකරන්ට ඕනෑය-අසල ගොඩැල්ලක පස් හෝ පොල්ලෙලි කඳන් දඹු යනාදියත් ඊට භාවිතාකරණවාය.

---

## සාමාන්‍යයෙන් පොල්වතුවල සාත්තුව ගැණය.

පොල්පැල හිටුවාපු වත්තක සැමතැනම නිතර උදළුගාලා ශුද්ධකරන්ට බැරි නුමුත් එක පොල්පැලයක් ලඟ අවුරුද්දකදී දෙවරක්වත් ශුද්ධවෙන පිණිස නොවැරදී කැලේ එලිකර ශුද්ධකරවන්ට ඕනෑය-එලිකෙරීමේදී උදළුවලින් කැපෙන නොහොත් ඉදිරෙණ කැලෑ රොඩු පොල්පැල හතරට මැද එක බැගින් ගොඩවල් ගස්වා වේළුනාම ගිනිතිබා නිවුනු පසු ඒවායේ අළු අරන් පොල්පැල තිබෙන වලවල් ඇතුලේ පස් ටිකක් අහක්කර එම අළු වලවල් ඇතුලේ දම්මන්ට ඕනෑය-අවුරුදු පහක් හයක් වෙනතුරු මෙයාකාර කලොත් පොල්පැල ඉක්මනින් වැවෙනවාය-කොයියම් කාලේකදීවත් පොල්පැලවලට උසින් වල් කැලේ වැවෙන්ට ඉඩදෙන්ට නරකය-බිඩ නොහොත් කඳන් තේරෙණ කාලේ වෙනතුරු පොල්පැලේ මුල ලඟ එක තණකොල ගහක්වත් පැලවෙන්ට ඉඩ

නොතිබා සාත්තුකලොත් ඉක්මනින් පොල් වැවෙන
වාය–අතරතුරේ පාඩු වැටෙන නොහොත් ඇඹුඹිපීන
පොල්පැල උත්සාහයෙන් කඩිනම්කර වවන්ට ඕනෑ
ය–පොල්පැලවලට වයස අවුරුදු තුන හතර පැමි
ණෙන කාලේදී කුරුමිණියන්ගෙන් අනතුරු පැමි
ණෙනවාය–උන් ගොබ් අත්ත ලඟින් සිදුරුකර තුල්
වී යටට කාබහිනවාය–එසේ බැස කරබඩේ නොහො
ත් කරඩු අලේ කෑවොත් ඒ ගහ මැරෙණවාය–ඒ නි
සා කුරුමිණියන් අරන්දැම්මට බිලී කටුවේ කාණු කො
හෝරය ආකාර දෑතට කාණුකොනෝර ගාපු යකඩකූ
රකින් ඇනලා සිදුරුතුල වෙසෙන කුරුමිණියන් අ
රන් මරාදමන්ට ඕනෑය–නොහොත් පුළුස්වා එම සිදු
රුතුලම තැබුවොත් වඩා හොඳය–තවද තෙල්ගැණි
මට මිරිකා අහක්කරණ එඩරු පුන්නාක්කු නො
හොත් අළුත් එඩරු මුරු වතුර අප්පල්ලාවලට දියක
ර සවස වත්ත මැද කීපපලකම තබා උදේ බැළුවාම
පොල්පැල කාණ කුරුමිණියෝ ඒ අප්පල්ලාවල වැටී
ඉඳිත්–බුරුවන්ගේ කටහඬටත් කුරුමිණියෝ ටිකෙන්
ටික අඩුවීගොස් වඳවෙනවාය–රවුකිඤ්ඤ නාදෙටත්
කුරුමිණියෝ වඳවෙනවායැයි සමහරුන්ගේ කල්ප
නාවය–මෙකී ගුරුකම්වලට කුරුමිණියෝ වඳවෙන
වා සහ ලේසිත් හොඳය–තුම්බත් ගස්වලින් බලාලා කු
රුමිණියන් අරන් මැරීම අනුමානනැති වැඩක්ය–
පොල්පැලවල බිඩ නොහොත් කඳන් තේරෙණ කා
ලේදී කඳ පනුවෝ බෝවී ගස් මරණවාය–උන්ව සෙ
වීම ඉතා අමාරුය–ගස් මලානිකවී නමාවැටෙනතුරු
දැනගන්ට බැරිවෙනවාය–උන් ගහේ මුල කඳෙන් සි
දුරුකරගණ තුල්වී බඩේ කාගණ ඉහලට ගොස් ගස්
නාසතිකරණවාය–ඒ සිදුරු ලොකුකර කපා පනුවන්
අරන්දමා හුඹස්මැටි උණුදියෙන් අනා නිවුණු පසු ඒ
සිදුරු වසාදමනු–ඒ පනුවෝ සිටින ගස්වල මුලෙන් ර
තුපාට යුස වැගිරෙණවා ඇත–ගහට තට්ටුකලාම බිඳී
බඳනක ශබ්දකාරය පවතිනවාය–ඒ පනුවන් බෝක

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

රන්නේ අඟලක් පමණ දිගවූ පිටපැත්ත රතුපාට සහ තුඩ උල්වූ කුරුම්ණි වර්ගයක ඔත්තරවලින්ය-මෙකී කඳපනුවෝ වසා තිබෙන පොල්ගහ දුටු ඉක්මනින් පනුවන් අරන්දැමීම බැරිනම් නොහොත් ගහ තීන්දු වටම කාලා නම් ඒ ගහ කපා මුලත් සමග උදුරා දර රොඩු යනාදිය ගොඩකර වලත් සමග පුළුස්සා එකී අළු වලේ ඇතුලට දමා ඒ වලේ ලොකු හොඳ පොල් පැලයක් හිටුවා ඒක හොඳ ප්‍රවේසමෙන් සාත්තුකර වවන්ට ඕනැය-කඳපනුවෝ වහපු ගස් කඩිනමින් නොපිලිස්සුවොත් අන්කුත් ගස්වලටත් යනවාය-මෙයාකාර ගස් කීපයක් කනවා නම් ඒ අසල සැම පොල් ගස් ලඟම මුල හොඳට සුබකර මුල වටේ පොලවට ගලා නොයන රශින් තාර ගාලා ගෙන්දගන් කුඩු මිශ්‍රව රොඩු මොරෙම්කඹ අඹරා ගිණිදල්වා හුලඟ නැති කීප දිනක්ම ගස්වලට දුම්වදින්ට අරිනු-එව්ට කඳපනුවන් බෝකරණ කුරුම්ණියෝ මගහැරයනවා ඇත-කඳන් තේරිච්ච ගස්වල වේලිච්ච පොල්පිති මටුළු යනාදිය ගලවාහැර ගස් මුල් ලඟ හොඳට සුබකර මදක් තෙත්ගතිය ඇති රොඩු පරඬල් තැනින් තැන ගොඩකර දුම්වදින පිණිස ගිණිතිබා එකී දුම් දවස් තුන හතරේ නොකඩව තිබීයාමෙන් එකී කුරුම්ණියෝ මගහැර යනවා ඇත-පොල්පැලවල ඉරටා තේරී අවුරුද්දක් පමණ පසුවෙන්විට සමහර ඉඩම්වල පොල්පැලවල නොබ ඇදීම බාලවී නිසරුවෙනවාය-එසේවීමට හේතුවනම් පොල්පැල වැසීයනතරමට කැලේ වැනවෙන්ට ඇරීමෙන්ද තවත් සමහරක් පොලවේ රස අඩුකමෙන්ද තවත් සමහරක් පොලවේ රස වැඩිකමෙන්ද තවත් සමහරක් මුල් කණපනුවෝ ජාති බෝවීමෙන්ද තවත් සමහරක් පොලවයට මුල් ලඟ දිය උල්පත් තිබීමෙන්ද යන මෙයාදී කාරණාවලින්ය-කැලේ වැවී පොල්පැල වැසීයාමෙන් එයාකාර උනොත් ඉක්මනින් එලිකරන්ට ඕනැය. පොලවේ රස අඩුකමෙන්නම් ගස්වටේ කොටා මුල්

පාදු පස් අහක්කර තුන්දිනක් නිකන් තිබෙන්ට ඇර
ඊටපසු හොඳ හුඹස්මැටි හෝ අළුත පුළුස්සාපු අළු මිශ්‍ර
පස් හෝ කාලයක් ගොම දිරාපු තැන්වල උඩ පෝර
පස්වත් ගහ මුල වටේටදමා සමතලාකර වතුර වත්
කරන්ට ඕනෑ කාලේකනම් තුන්දිනකට වරක් බැයි
න් දෙතුන් මාසයක් වත්කරන්ට ඕනෑය–පොලවේ ර
ස වැඩිකමෙන්නම් ගස්වටේට මුල් කොටා පසුත් සම
ග අහක්කර ළුනු මිශ්‍රකර හෝ මුදුවෙරලේ වැලි හෝ
දම්මන්ට ඕනෑය–පනුජාති බෝවීමෙන්නම් ගස් වටේ
මුල් පාදු මුල්වලට වදිනාකාරයට ගෙන්දගම් දුම්ග
ස්වා එම කුඩු අළු හෝ හුණු අළු සමග කලවන්කර
ගස් මුල වටේටදමා අළුත් පස්වලින් මදක් වල් ගොඩ
කර තබන්ට ඕනෑය–වතුර උනන ගතියෙන්නම් එ
කී පැල උදුරා අගල් හොඳකාර ඇර ඒ උඩ පොල්පැ
ළ සිටුවන්ට ඕනෑය–සමහර කාලවලදී පොල්ගස්වල
කොල කන පනුවෝ ජාතියක් බෝවෙනවාය–උන්
ගෙන් ගහට අනතුරා නොපැමිණෙන නුමුත් පීදිච්ච
ගස්නම් පලදාව ටික කාලයකට අඩුවෙනවාය–උන්ව
වඳකරදමන්ට ඒ අතුවල කොල කපා පනුවන් සමග
ගිණිතිබාදමනු–එසේ නැත්නම් ඉහතකී දුම් පාවිච්චි
කල හැකිනම් ඒත් හොඳය–උන් ටිකකලකදී ඉබේට
ත් වඳවෙනවාය–පොල්ගහක් අසුකර හුඹස් බඳින
ම් එය කොටවා අරින්ට ඕනෑය–හමාසේකට වරක්
සෑමතැනම එලිකරණවාය කීවේ තණකොල උදලු
ගාණවා නොවේය–උසට වැවෙන වල්ගස් ජාති මුලි
න් ඉදිරීයන්ට නොහොත් මුලින් කැපීයන්ට උදලු
පාවිච්චිකෙරේමය–සෑමතැනම තණකොලත් සමග උ
දලුගෑවොත් වඩා හොඳය–එවිට ලොකු වියදමක්
යනවාය–නුමුත් පොල්පැලේ වටේට අඩිපහක් හයක්
ඉඩඇතුව තණකොලත් සමග උදලුගාමින් කැලේ
එලිකරන්ට ඕනෑය–අවුරුදු පහ හය පසුවෙන කා
ලේදී පොල්වතුවල හරකුන්ව ඉන්ඩඇර, තණකො
ල කන්ඩත් පොල්පැල නොකන්ඩත් බලාගන්නා පි

ණීස එඬෙරෙකුව තබන්ට ඕනෑය-එවිට වැඩියෙන්
ලියලන තණකොල හරක් කණවා සහ වත්තේ දිවු
ණුවටත් පෝරගැණීමටත් හොඳය-නියඟ කාලයේ
දී උදළුගාන රොඩු පොල්ගස් මුළු වටේට එකතුකර
තිබීමෙන් තද අව්රස්නාය මුලට නොදැනෙයි-බිඩ
නොතේරිච්ච ගස් ළඟ වටේට පොල්ලෙලි අඩුක්කර
පොළව නොවේලෙන රඟින් තිබෙන්ට ඇරියොත්
තද නියඟ පොල්පැලවලට ඔරොත්තුදෙනවාය-අමු
ගොම දියකර කොලවලට ඉසීම පොල්පැලවලට
හොඳය-එකී ගොම තිබෙනතුරු ඒ කොල හරක්
නොකයි-කොලවල තිබෙන ගොම වෂාවට සේදී මු
ල්වලට බේරුනත් ගහට සනීපයක් උපදිනවාය-ඒ
වැඩේ ඉතා ලොකු වතුවලදී කෙරීම අමාරුය-පොල්
පැලවලට වෂාව නැතුව මාස දෙකක් තුනක් අව්ව
පෑව්වොත් ගස් මලානිකව නැමියනවා ඇත-ගස් න
මාවැටෙන්ට පලමුවෙන් නියඟකාලේදී උදේවරුවේ
වතුර වත්කරන්ට ඕනෑය-වත්තේ සිටින උදවිය මදි
නම් වෂාව වහිනතුරු ඒ කාලේට තවත් මිනිස්සුන්
ව පිටින් ගන්ට ඕනෑය-කඳන් තේරුණසින් පසුවත්
පොල්ගස් තිබෙන වල් ගොඩනොව තිබේනම් නි
සරු ගස්වල වලවල්වලට පමණක් ටිකක් අඩුවී තිබෙ
න්ට පස් පුරවන්ට ඕනෑය-පොලවේ සාරවත්කම
අඩුවීමෙන් හෝ වැඩිවීමෙන් හෝ සිහින් මුල් වගීය
ක් පොල්ගහෙන් පොළව යටසිට මතුවේගණ එයි
නම් ඒවා පොළවත් සමග කොටාහරින්ට ඕනෑය-
නිසරු ගස්යැයි කියන්නේ වයසේ හැටියට වැඩීමෙ
න් බාලවූ ගස්ය-එකී ගස්වල මුල ළඟට වේලිච්ච
ගොමපෝර දැමීම ඉතා හොඳය-එසේ පෝරදැම්මො
ත් ගහ ළඟසිට අඩිහයක් පමණ දුර දක්වා ඉඩඇතු
ව අඩි එකක් පමණ ගැඹුරේ වටේට පොළව කොට
වා බුරුල්කරන්ට ඕනෑය-එසේ කරන්නේනම් පෝ
රවල රසය කරණකොට ප්‍රාණවත්වූ මුල් පහසුවෙන්
දුරට ඇදීයන්ට ඕනෑ නිසාය-ඒ සාත්තුවේදි මුල්වල

ට ලැබුන ශක්තියෙන් ටිකක් තද පොලවෙදින් ඇදී
පෝර තිබෙන තැන් කරා මුල් පැමිණෙනවා ඇත–
මනුෂ්‍යයෝ ගැවසෙන කටහඬ ඇසෙන සහ අඩිගැස්
ම දැනෙන තැන්වල පොල්පැල ඉක්මනින් වැවී පුදි
නවා සහ හොඳට පලදරණවාය–ඊට ප්‍රධාන හේතු
වනම් මනුෂ්‍යයෝ ගැවසෙන තැන්වල වල් කැලේ
වැවෙන්ටනෑර එලිකරගෙණ ඉන්න නිසාය–පොල්ව
තුවල සමහර ගස් තල් අතු ආකාර බදවූ කොල
ඇති ඒවා තිබෙනවාය–ඒවා ලොකුඋනාට පලදරන්
නෙ නැත–මොන අන්දමක්න් එයාකාර වෙනවාද
කියා කල්පනාකරන්ට බැරිය–ඒවාට සමහරු විසින්
පිරිමි ගස්යැයි කියනවාය–නුමුත් තවානේදි ඇට පුස්
ස නොහොත් මසේ බුබුළු ආකාර තිබෙන පොල්ගෙ
ඩි පැලවෙලා වැව්ච්ච ගස්දෝ කියා අනුමානෙට හිත
න්ට පුළුවන–පොල්වත්තක වැඩබලන අය විසින් දි
වසකට වරක් වත්තේ සැමතැනම ඇවිද බලන්ට ඕ
නෑය–එවිට කරන්ට තිබෙන වැඩ පෙනියනවා ඇත–
වැඩකරණ කුලීකාරයෝ දහයක් වැඩකරණ අතර
එක පැයක් නිකමට කාලය පසුකලොත් ඒ දවසේදි
එක මිණිසෙකුගේ වැඩ පාඩුඋන බව හිතටගන්ට
ඕනෑය–නොහොත් එක මිණිසෙකුගේ පඩි නිස්ප්‍ර
යෝජනේ වැඩියෙන් යනබව කල්පනාකරන්ට ඕ
නෑය–සරු නිසරු පොලවල්වල අන්දමට විසිහයේ
පටන් හතලිස්දිනකට වරක් පොල් ගහකින් ගොඩ
යක් ඇදෙනවා ඇත–බොහෝ සරුඇති පොලවේ
හොඳකාර සාත්තුකලොත් හිටුවාපු වකවානුවේ ප
ටන් අවුරුදු හතරහමාර නොහොත් පහ පසුවෙනවිට
සමහර පොල්පැල පුදිනවාය–මුදට ඇත පිටිසර සම
හර ඉඩම්වල පොල්පැල පුදින්ට අවුරුදු දෙලහක්
පමණ කල් යනවාය–එකී සමහර ඉඩම්වල බොහෝ
කල් පලදරණවාය–පිටිසර සමහර ඉඩම්වල අවුරුදු
හතරපහ පසුවෙනවිටත් පුදිනවාය–එකී ඉඩම්වල වැ
ඩිකල් පලදරන්නේ නැත–ලංකාවේ මඩම පලාතේ .

පොල් වවන්ඩ බැරිය–නුවරඑළිය බගවන්තලාව හල්දුම්මුල්ල හපුතලේ බදුල්ල ඌව බින්තැන්න මතුරට සහතවත් එයාදි ගම්වල පොල් වැවෙන්නේ නැත-වැඩියෙන්ම පොල් වැවීමට හොඳ මුදුවෙරලේ සිට හැතැප්ම දහසයක් පමණ ගොඩකහාටය–එයින් දුර පොල්වැවීම බාලය.

---

**පොල්වතුවලට ඕනෑකරන වැඩපනන ගැණිස.**

වැටවල්බැඳීමට ඉති මාවර කැපීමට කැත්ද ලොකු වල්ගස් කැපීමට පොරෝද, කඳන් කැපීමට හරස් අදින කියත්ද, වල් කැලේ වැවෙන ඒවා කොටා එළි කෙරීමට උදළුද, තද පොලෝ බොරළු හුඹස් යනාදිය කෙටීමට කුන්තානි පිකාස් හෙවත් ගල්කටු නාරස් නොහොත් අලවන්කුද, අවුරුදුපතා සාදන ලෑසිම් වැඩවලට වැද නියන්ද අත්කියතක්ද මට්ටම්ලෑල්ලක්ද ලෙවෙල් එකක්ද අගල්වල යම් උවමනා වැඩවලට ඉස්කෝප්පද, සමහරවිට කොම්පාස් එකක්ද, කෝදුවක් නොහොත් ටේප් පටියක්ද යන මෙකී නොයෙක් ආවුද වත්තේ තිබෙන්ට ඕනෑය–මිණිස්සු ගැවසෙන අසල පොල්පැල ඉක්මනට වැවෙන නිසා කුලීකාරයින්ට තැනින්තැන සාදන ගෙවල් අවුරුද්දකට වඩා පාවිච්චිනොවෙන අන්දමට නිසරු පොල්පැල තිබෙන ඉඩම් බලබලා ඒ ඒ තැන්වල අවුරුද්දෙන් අවුරුද්ද සෙසු ගෙවල් සාදා දෙන්ට ඕනෑය–වත්තේ ප්‍රධාන ගෙය හෙවත් බංගලාව එකවිටම සව්ඇතුව පොල් නැහැදෙනවාය කියා සිතෙන උස් ඉඩමක සාදවන්ට ඕනෑය–වත්තේ කීපපලකම වතුරගැණීමට ළිඳවල් කපාතියන්ට ඕනෑය–වත්තට අසුවී දොලක් ඇලක් කඳුරක් යනාදි වතුරපාරක් තිබෙනවානම් ඊට ශක්තිය ඇතුව බෝක්කුවක් හෝ පාලමක් බැඳගන්ට ඕනෑය–හරක් සිටින කාලේනම් හොඳට ගාලක් බැඳ සෙවිලිකර තිබන්ට ඕනෑය–හර

කුන්ගේ බිමට වතුර ඇතනම් පාර තබා ලිඳක් හෝ පොකුණක් කරවා තබන්ට ඕනෑය-වත්තේ වැඩවලට සෑහෙනතරම් කරෙත්ත තබාගන්නවා සහ ඊට බඳින ගවයින්ට හොඳට සාත්තුකරන්ට ඕනෑය-මීට කලින්කලට ඕනෑකරණ දේවල් ඒ ඒ කාලයන්හී කලපනාකර වැඩිදුරටත් සම්පාදනයකරනු.

---

## පොල්වත්තකට ඕනෑකරණ උදවිය ගැණය.

අඩ විසිහය නොහොත් විසිඅට බැගින් පොල්පැළ හිටුවාපු අක්කර සියේක ඉඩමකට වල් කැලේ එළිකෙරීමට පිරිමි 5 දෙනෙක් සහ ගෑණු දෙන්නෙක්ද, වැටවල් බැඳීම ගැණ පිරිමි දෙන්නෙක්ද, කරෙත්ත වැඩ සහ නොයෙක් සිල්ලර වැඩවලට දෙන්නෙක්ද, වැඩකරවීමට ප්‍රධානියෙක්ද නිත්‍යපතා උදවිය 12 දෙනෙක් සිටින්ට ඕනෑය-මෙකී උදව්ය වෙනස් වැඩ ගැණ නියමකලේවී නුමුත් සෑමදෙනාවම එකට තබා වැඩකරවන්ටඕනෑය-මෙයාකාර කම්මැලිනොව දොළොස්දෙනා සිටියාම අක්කර සියේයක් වැවීමට ඇති තරමය-පිළිවෙලට වැඩකරවාගණයන අතර හදිස්සි වැඩක් ආවිට එය ඉක්මනින් කරවා පිළිවෙලේ වැඩට දෙවනු යන්ඩ ඕනෑය-සමහර වැඩ කොන්ත්‍රාත්දීලා කරගන්ඩත් වෙනවාය-ඵලධරණ කාලේ පැමිනුනාම මුරකෙර්ම හෙවත් ප්‍රවේසම් පිණිසත් හරයක් සිටිනවානම් එයි එඬෙරකමටත් ඒ ඒ කාලවලට ඕනෑ අන්දමට උදව්ය වැඩිකෙරීම හෝ අඩුකෙරීම හෝ වැඩබලන ප්‍රධානීය ට වැඩවල අන්දමින් කල්පනා උපදින්ට වතුවල බොහෝකල් වැඩබලාපු කෙනෙක් වෙන්ට ඕනෑය-මුල අවුරුදුවල ගොවියෝ ගොවිතැන්කෙර්ම අත්ඇරෙනතුරු මෙම උදව්යෙන් පංගුවක් සිටියාම ඇත-නුමුත් අගල්කැපිම යනාදි වෙනත් බාරදූර වැඩ තිබේනම් මෙම ගණනම ඕනෑවෙනවාය.

## පුදින සහ පලබරණ කාලය ගැණය.

වත්තක පොල්පැලවලට තිසි වයස පැමිණීමෙන් කඳන් තේරී සමහර ගස්වල මල් එකදෙක ඇදී එන කාලේට සෑම පොල්පැලවල මුල ළඟ පොලව අඩිහයක් පමන දුරට ඉඩඇතුව වටේට උදළු තලයක් පමණ ගැඹුරේ හෙවත් පෝර පසේ දුදලා තිබෙන සාරවත්වූ මුල්වලට දෝසයක් නොවෙන අන්දමට බිම්පෙරලවා අරින්ට ඕනෑය–මුළු ඉඩමෙම බිම්පෙරලා ඇරියොත් වඩා හොඳය–එතැන් පටන් අවුරුද්දක් පසුවෙනවිට ගස් බොහෝමයක් පුදිනවා ඇත–පීදිච්ච වකවනුවේ පටන් අවුරුදු එකාමාරක් පමණ පසුවෙනවිට සමහර ගස්වලින් ගෙඩ කඩාගන්ට පුළුවන–පොලවේ තද මැටවේ කට්ටගතියෙන් සමහර විට වැඩීම බාලවා පමණක් නොව පලදූර්ම අඩු ඉඩම්වල වැසිකාලේදී බිම්පෙරලා ගස් ළඟ සාරවාලා පෙල්ලෙලි වැලලීම හොඳය–පීදිච්ච ගස්වල වේලීගියා, ඕනෑනැති හනසු මටුළු පිති අතු යනාදිය ගලවාහැර ගස් සුබකරදම්මන්ට ඕනෑය–පොලවේ පෝරපසේ ඇදීගිය ලොකු පොල් මුල් ගස් බාලකාලේදී කෙටීම හොඳනැත–මක්නිසාදයත් පලදූරීම ගෙණදෙන්නේ ඒ මුල්වල ආධාරයෙන්ය–නිසරු ගස්වලනම් කොටවා පෝරදූම්මාට දෝසනැත–ප්‍රථම අවුරුදුවලට වඩා පුදින අවුරුදුවලදී පොල්වතුවලට වෙහෙසගෙණ සාත්තුකරන්ට ඕනෑය–එවිට ඉක්මනින් ප්‍රයෝජනය ලැබෙනවා ඇත–එසේ නොකර ලෝභවුනොත් සපයන්ට වැඩි වයස පැමිණුන පුත්‍රයින්ට කෑමදීමට ලෝභවී කම්මැලිවෙන්ට ඇර නිකමට ඉඳ නාසතිළුනා වගේ වෙනවා ඇත–ඵලදූරීමේදී ගස්වල ළපටිකම හේතුකොටගෙණ පොල්වළුවල නටු සවිනැතුව හෝ දිග වැඩිකමෙන් හෝ ගෙඩි බොහොම පලගන්න සමහර ගස්වල ගෙඩි වළු තලාවැටී කුරුවළු වෙනවාය–ඊට ගෙඩි මෝරා බරවෙන්ට ප්‍රථම පොල්වල්ලේ ගෙඩි මැද නටුවට කරුවක් දෙනවා හෝ ය

මකින් ඒ වළු බැඳ ඉහල අතුවල එල්ලා බැඳතිබන්ට
ඕනෑය-සමහරු ඵලදරණ ගස් වටේට වේලිච්ච පො
ල්අතු රොඩු යනාදිය ගොඩකරණවාය-එසේ කෙරී
මෙන් ගස්මුල පොලව නොවේලනවා සහ සමහරවි
ට ඵලදාවත් වැඩිවෙනවාය-තුඹුත් රතු නොහොත්
සුදුපාට හීන් පොල්මුල් වගීයක් ගහ මුල කඳෙන්
සහ පොලව මතුපිට්ටුන් ඇදී ගහේ මුල පොලව උස්
වි ගහට පොලවේ රසගතිය පිකකාලකදී අඩුවී ඉක්ම
නටම ඵලදූර්ම අඩුවෙනවාය-තවද කඩ බෝවීමෙන්
ලපටි කිරි මුල් කාණවාය-එසේ දමනවානම් ගහේ
කඳේ නොවදින හැටියට නියඟ කාලයේදී රොඩු ති
බෙන්ට ඇර වෂාවකාලේදි අහක්කරන්ට ඕනෑය-
බොහෝ ඵලදරණ ගස් වැඩිකාලයක් පසුවෙනවිට
ඵලදූරීම අඩුවෙනවාය-කරටි හීන්වීයයිනම් ගහවටේ
මුල් අඩියක් පමණ ගැඹුරේ කොටවා ඒවා පසුත් සම
ග අහක්කර ඒ ගැඹුරෙන් පංගුවක් ගොඩවෙන පිණි
ස අඹුනු පොලවකින් නොහොත් මදක්දුර තැනකින්
සටි අළුත් පස් ගෙණවිත් දමා ඊට උඩින් ඉහත අහ
ක්කල පසෙනුත් පංගුවක් පෝර ටිකක් සමග මිශ්‍රක
රදමා නියම පොලවේ මට්ටමට පස් සමතලාකරන්ට
ඕනෑය-ගහමුල පොලව උස්ව තිබීමෙන් ගස් නිසරු
වෙන්ට පුළුවන-එහෙන් නිතර මිනිස්සු ගැවසෙන
ක්වටුව තිබෙන ගස්වල ඵලදරණවාය-එසේ ඵලදාව
අඩුවෙච්ච ගස් වටේට බිම්කොටවා නොහොත් නගු
ල්වලින් හාලා එක පොල්ගහේ හරක් දෙන්නා බැ
ඳින් රෑ හත අට පමණ බැඳ නොහොත් කොටුකර
පෝරකර ඇරියාම ගස් සම්පූණීවී ඵලදාවත් වැඩ්වෙ
නවාය-කල්යාමෙන් උසට වැවිච්ච ඵල නොදරණ
ගස්වලට අවුරුඩකට වරක් බැඟීන් මෙසේ කලොත්
අවුරුදුපතා ඵල ප්‍රයෝජන ලබන්ට පුළුවන්වෙන
වාය-තුමුත් ඒ සාත්තුව කරවමින් සිට දෙවනු නොක
ර ඇරියොත් එතැන් පටන් අවුරුදු හතර පසුවෙන
විට නැවතත් ගහේ කරටි හීන්වී එක ගෙඩියක්වත්

එලනොදරය-පොල්ගහට පෝර සාත්තුව නොකර පැලකාලේ පටන් ගත වටේ පොලව පෑත්කර සපින් අදින මුල් පෝර තිබෙන තැන් කර පැම්නෙන්ට හා මින් ක්‍රියාකලොත් සමහර ඉඩම්වල බොහෝ අවුරුදු ගණන් එලදරණවාය-පෝර වෙනුවට පොල්ගස්වලට වියදම්කලේ කොපමණද ඒ වගේ දෙතුන් ගුණයක් ගෙඩිවලින් වටිනාකම් ලැබේ.

---

## පොල්වල ස්වභාව ගුණය.

අපෝගුණය අධිකවූ පොලවේ ගස්වල එලධරණ පොල්ගෙඩිවල වතුර කිවුල් රසය-තෙල් අඩුය-පිටින් එලහුරු පාටය-මස් තුනීය-කෙඳිවල ශක්තිය අඩුය-තේජෝ ගුණය අධික පොලවේ එලධරණ ගෙඩිවල වතුර පැනිසරව මදක් කාරම්ය-තෙල් වැඩිය-පිටින් රත්පාටය-ගෙඩි දිගට හුරු මධිම තරම්ය-වායෝ ගුණය අධිකවූ පොලවේ එලධරණ ගෙඩිවල වතුර මධුර රසය-පැසෙන ගතියක්ද ගෙඩි ලොකුවා සහ වටකුරුවී ඇත-ඒවාට තෙල් මධිමසාරය-පිටින් නිල්පාටය-මෙකී ධාතුන් එක සමානව පවතින පොලවේ එලධරණ ගෙඩි ඉතා හොඳය-වතුර සෞම්‍යගුණ ඇත්තේය-මස් ඝණකමය-පිටින් නොයෙක් පාටවලින් යුක්තය-බරවැඩිය තෙල් අධිකය-තවද රන්තැඹිලි රත්තැඹිලි ගොන්තැඹිලි කුරුතැඹිලි වළුතැඹිලි මල්තැඹිලි ගිණිතැඹිලි සුදු තැඹිලියැයි කියා තැඹිලි පොල් කීප ජාතියක් තිබෙනවාය-මේවා ස්වභාවෙන්ම ටික ටික වෙනස්ව ඇත්තේය-මෙයින් රන්තැඹිලි නොයෙක්විට ඖෂධාදියට ඕනෑවෙනවාය-අනිකුත් ජාති ලක්‍ෂණ පිණිස වවනවාය-ඒවායිනුත් සුළු ප්‍රයෝජන තිබෙනවාය-රන්තැඹිලි ගොන්තැඹිලි සුදු තැඹිලි බොහෝකල් එලධරණවාය-අනිකුත් ජාති එලදැරීම ටික කාලේය-සමහර තැඹිලි එල

ධරන්නේ අවුරුද්දකට මාස හය බැගින්ය–ඒවා සමහරවිට අවුරුදු දෙලහාකට වඩා එලනොදරයි–මෙපමණ දුරට කියාපු පොල්වලින් වැඩිකොටසක් කොප්පරා වේලනවාය–එනම් ගස්වලින් පොල්ගෙඩි කඩා දින පසළොසක් පමණ පසුකර ලෙලි ගලවාහැර බිඳලා දෙදවසක් අව්වේ වේලා කටුවෙන් පොල් වෙන්කර දෙවනුත් තුන්දිනක් වේලාපුවාම ඒවා හොඳ කොප්පරාය–මඩකලපු පලාතේනම් ගෙඩිපොල් එළිමහන් ඉඩමක තුනීකර සමහරෙක් පලලැති පොරෝවලින් ගසා පලාගණියති–ඒ සමගම අනිත් අය ඒවායේ වතුර නවාහැර අව්වට දිගඇරගණ යනවාය–ඒවත් දෙදවසේදී කටුවෙන් පොල් වෙන්කරණවාය–පසු තුන්දිනේ වේලා කොප්පරා කරණවාය–ඒ වැඩෙන් ලෙලි ගැලවීමේ සුනාඟුව වාසිවෙනවාය.

---

## වත්තක ලියුම් කියුම් ගැණිය.

වත්තක් වැවීමේදී කරන්නාවූ වියදම් ගණන් දිනපතා ලිවීමට දින පොතක්ද, එක එක ජාතියේ වියදම් මේවාය කියා කට්ටියෙන් කට්ටිය වෙන්කර ලිවීමට සහ මුළු වියදම් බලාගැණීමටත් ලියනලද ලැඩ්ජර් කියා පොතක්ද වත්තේ වැඩබලන අය ළඟ තිබෙන්ඩ ඕනෑය–දින පොත අරන් දිගඇරියාම වම් අත තිබෙන පිටේ බාරගන්න මුදල්ද දකුණු අත තබන පිටේ වියදම්ද යන ක්‍රමයට ලියා දින කෙලවරදී ඒ ගණන් ලැඩ්ජරේ ඒ ඒ තැන්වල ලියන්ට ඕනෑය–තවද මෙම පොත අවසානයේදී ඉංග්‍රිසි ඒ. බී. සී. ඩී. ඊ. ඇෆ්. යන අක්ෂර දරණ පිටු හයක් යොදා ඇත–එයින් ඒ අක්ෂරය දරණ පිටේ වැඩකරණ කුලීකාරසින්ගේ දවස්ගණන් ලකුණුකරණ චැක්රෝල්ද බී අක්ෂරය දරණ පිටේ ඒ ඒ දවස්වල මේ මේ වැඩකෙරුණය කියා ලකුණුකෙරීමද, සී අක්ෂරය දරණ පිටේ

කුලීකාරයින්ඩ සුමානෙන් සුමානේට දෙන අඩ්වැන්
ස් වියදම්ද, ඞී. අක්‍ෂරය දරණ පිටේ කුලීකාරයෝ මා
සයතුල වැඩකල මුළු දවස් සහ ඊට මුළු පඩියත් මුළු
පඩියෙන් වියදම හැර ඉතුරු පඩිගණන් ලිවීමද යනා
දිය වැඩ බලන අයගේ ලේසිය පිණිස දැනගැණීමට
මෙහි යොදා ඇත–තවද චැක්රෝලේම අඩ්වැන්ස් ල
කුණුකරන්ඩත් පුළුවන–වත්ත අයිතිකාරයාවෙත
යැවීමට සියළුම ගණන් පෙන්වා මාසේකට වරක්
ලැයිස්තුවක් සාදන අන්දමත් ඒ පිටුවලින් දැනගැණී
මට පුළුවන් සහ ඊ ඇෆ්. අක්‍ෂර දරණ පිටුදෙක ලැයි
ස්තුවේ අන්දම පෙන්වාදීමටත් යොදා ඇත–මෙයා
කාරයෙන් ඉඩම ගත්තු මුදල් අත්ඇර අක්කර සියේ
ක පොල්වැවීමේදී අවුරුදු දොළහක් පසුවෙනවිට පවු
න් එක්දහස් අටසියයක් පමණ වියදම යාය කියා ක
ලපනාකරන්ඩ කාරණා තිබෙනවාය–අක්කර සියේ
ක ඉඩමේ පොල්ගස්වලින් එකාකාර ඵලදරණවා
නම් දැන්කාලේ අන්දමට අවුරුද්දකට පවුන් හත්සිය
පනහක පමණ ප්‍රයෝජන ලැබෙනවා ඇත කියා ක
ලපනාකරන්ඩත් කාරණා තිබෙනවාය–සමහරු විය
දම අඩුවෙන් වවාගැණීමට ගහකට මෙපමණ මුදල
ගෙවනවාය කියා පොරොන්දුපිට වවනවාය–ඒක
තමතමුන්ගේ කැමැත්තක්ය–මෙහි නියමකල උදවි
යත් වියදම්යාය කී මුදලත් මීට අඩුවෙන් කරන්ඩ පු
ළුවන්උනේවී නුමුත් හොඳට වවන්ඩත් ඉක්මනට පු
දින්ඩත් ප්‍රයෝජන ලබන්ඩත් එකී නියමය ඒත්තු
වෙනවාය.

---

## වැඩිදුර කියන්ඩ තිබෙන කාරණා ගැණය.

මෙහි පොල්වල ස්වභාව කියාපුතැන්හී නවිසි
පොල් ජාතිය සඳහන්නොකර ඇත–එය සඳහන්කා
ලානම් තවත් කීප ජාතියක් කියන්ඩ තිබෙනවාය–
ඒවා වැඩිදුර කීමෙන් ප්‍රයෝජනයක් නැති නිසා එයි

න්ම නවතා ඇත–සමහර උදවිය සුළු වැවුන්කාර
යෝ පොල්ගෙඩිය පැලවෙන්ඩ පලමුවෙන් වල ඇතු
ලේ ගෙඩි දෙක බැගින් සිටුවා එගිම පැලවෙන්ඩ අරි
ණවාය–ඒක මෝඩ විහිළු වැවීමක්ය–ඒකට මෝඩ ක
ල්පනාකාරයෝ උපන්දසිට ලෙඩක් නැතුව වැඩෙන
ළමයාකාර උපහරණයක් කියනවාය–ඒ වැවුම හරිගි
ය ඒවා හරියියේ වැරදුන ඒවා වැරදුනාමයා–වේයෝ
සිටින ඉඩම්වලත් ලොකුවතු වැවීමත් එසේ නුපුළුවන–
සමහර ඉඩම්හී පොල්පැලවලට පොලුවයටින් මීයෝ
විගීයක් විත් පැලේ මුල ගෙඩිය ලඟින් කරඬුව කාලා
ගස් විනාසකරණවාය–ඒ බවක් දනගන්ඩ ලැබුන
කඩිනමින් ඒ ගුහාවල් හොඳට පාදා සුදු පාසානම් මිශ්‍ර
කර කෑම කීප ජාතියක් සහ අමු අල ජාතිත් තිබුවාම
ඒවා කාපු මීයෝ වඳවෙනවාය–එසේ බැරිවෙතොත්
ගුහාවල් දිගේ සාරවාගණ ගොස් මීයන් අල්ලා මරා
දමන්ට ඕනෑය–වල්කැලේ අයිකව ලියලන ඉඩම්ව
ලට උදවිය වැඩියෙනුත් එසේ අඩු ලියලීම ඇති ඉඩ
ම්වලට අඩුවෙනුත් තබාගණ පොල්වැවීම වියදම් අඩු
කරගණ වවන්ට උත්සාහකලයුතුය–මක්නිසාදයත්,
පොල්වත්තකින් ප්‍රයෝජන ලබන්ඩ බොහෝකල්
පසුවෙන නිසාය–සමසරු පොල්වතු වවන්ඩ බො
හෝ ආසාවෙන් ඉඩම් අරන් ගිහා ඇතුව වියදම්කර
අවුරුදු තුනහතර වැඩකරවාගණඑන කාලේට ලෝ
බවී කොපමණ වියදම්කලත් ගෙඩි පලගන්නේ නිසි
වකවානුවට නොවේදයි සිතා වියදම් අඩුකර මිනිස්සු
න්ව අහක්කර වතු නරක්කරගන්නවාය–ඒ මෙසේ
ය, ළමයෙකුව කඩිනමින් ඇතිදැඩිකරගන්න අටියෙ
න් බාලකාලේදී හොඳකාර සැපපොහොනි කරගණ
එන කාලේට මේ ළමයාගෙන් කවදා සම්බකෙරුන්
කන්ඩදක්යා මෝඩ කල්පනාවක්ගෙණ කෑමෙන්ද
සාත්තුවෙන්ද අඩුකර ළමයාව නොයෙක් රෝග උ
පද්‍රවලට යටහත්කරන්නාමෙනි–එසේම පොල්පැලේ
ට කාන්ඩදී සැපකෙරීමනම් වල් පැලෑටිවලට පොල

මේ රසය ඇදගන්ඩ නොදී·වල්කැලේට පොල්පැලු යටවෙන්ඩනොදී වත්තේ වැඩකෙරවීමය–තවද යම් ප්‍රමාදදෝසයකින් පොල්වත්තේ කැලේ වැඩිවී පොල් පැලු වැසීයන තරම් කැලේ වැවී ආනම් සෑමතැනම දෙවනු එලිකරණතුරු පොල්ගස් වටේ බඹයක් පමණ ඉඩඇතුව කඩිනමට එලිකර දෙවනු සෑමතැනම එලිකරවන්ඩ ඕනෑය–වැඩකරණ කුලීකාරයින්ව ගෙන්නා උදේ හයේ පටන් එකොලහමාවෙනතුරු වැඩකරවා නිවාඩුදී දෙවනු ඉරු අවරවූ එකට ගෙන්වා සවස හයට පමණ වෙනතුරු වැඩගන්ඩ ඕනෑය–වැඩකරණ කුලීකාරයින් සමග ප්‍රධානියා යාළුමිත්‍රකම් පැවැත්තුවොත් වැඩ අඩුවෙනවා නොඇහෙසි–වැඩ බලන අයට හදිස්සි ගමනක් යන්ඩ උනොත් කුලීකාරයින්ඩ කරන්ඩ පුළුවන්පමණ බලා දීන කොන්ත්‍රාත්දී යන්ඩ ඕනෑය–කුලීකාරයින්ඩ අඩුනැතුව සුමානපතා වියදම්දෙන්ඩ ඕනෑය–කුලීකාරයින්ඩ ආදරේ නොපෙන්වා හයකර අත්අඩගුවේ·තබාගන්ට ඕනෑය–පොල්වතු ගැණ කාරණා කියතොත් තවත් මේ වගේ දෙගුණයක් කියන්ඩ පුළුවන–එසේ ඕනෑනැත–පොල්වැවීමට මෙහි කියා තිබෙන කාරණ හිතට ගත්තාම ඉඩම්වල අන්දමටත් කාලේ සහ වැවෙන අන්දමටත් තවත් ඕනෑකරණ ගුරුකම් සලපනාකාරයින්ගේ හිතේ උපදිනවා ඇත–සාපනේ ත්‍රිකුණාමලේ මඩකලපුව මාතර ගාල්ල කළුතර කොලුඹ මීගමුව මාරාවිල මාදම්පේ කල්පිටිය යනාදි රටවලට අයිති ගම් පොල්වැවීමට ප්‍රධාන බව පෙනෙනවාය–වත්තක වැඩබලන අයගේ ප්‍රධාන ගුරුකමනම් කම්මැලි නොව කඩිසරව සිටීමය–කල්යාමෙන් එලිනොදරණ වතු නගුල්වලින් හාලා මුල් කැඩෙන්ට හැර. පෝරකලොත් එල ලබාගතහැක් වෙනවාය–මොරටුවේ පදිංචි අන්ද්‍රිස් පීරිස් රේරාදමහත්මයාට අයිති පිටිගල්කෝරලේ පොල්වතුවල වැඩබලන කාලේදී මග්ගොන පදිංචි මහාගේවාගේ සියදෝරිස් ප්‍රේරාවන මම විසින් දන්නා පමණට මෙම පොත අමුතුවෙන්ම කරණලද්දේය.

A ඒ වෂී 1

| | | සි | ශ | ඉ | ස | අ | බ |
|---|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | 5 | 6 |
| 1 | කන්කානම | v | v | ,, | v | v | v |
| 2 | මදිරමුත්තු | × | × | ,, | × | ,, | × |
| 3 | පලන්අප්පා | × | × | ,, | ½ | × | × |
| 4 | පෙරුමාල් | × | × | ,, | × | × | × |
| 5 | මුත්තුසාමි | × | × | ,, | × | × | × |
| 6 | වෙල්ලයා | × | × | ,, | × | × | ,, |
| 7 | අන්තෝනි | × | ½ | ,, | × | ,, | × |
| 8 | අබරම් | × | ½ | ,, | × | × | × |
| 9 | අමාරිස් | × | × | ,, | × | × | × |
| 10 | පිකිරා | × | × | ,, | × | × | × |
| 11 | මරිඅම්මා | × | × | ,, | × | × | × |
| 12 | මිනාච්චි | × | × | ,, | ½ | ,, | ,, |
| | | 11 | 10 | ,, | 10 | 8 | 9 |

මෙම පිටේම දින ලකුණුකරන කොටු එනුඩු

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 13 | 9½ | ” | ” | ” | ” | 9 | ” | ” | ½ | ” | ” |
| 14 | 10½ | ” | ” | ” | 2½ | 8 | ” | ” | ” | ” | ” |
| 15 | 10½ | 9 | ” | ½ | 1½ | ” | ” | ” | ” | ” | ” |
| 16 | 9½ | 9 | ” | ” | | ” | ” | ” | ½ | ” | ” |
| 17 | ” | ” | ” | ” | ” | ” | ” | ” | ” | ” | ” |
| 18 | 11 | 9 | 2 | ” | ” | ” | ” | ” | ” | තද අව්ව | ” |
| 19 | 10 | 9 | 1 | ” | ” | ” | ” | ” | ” | ” | ” |
| 20 | 11 | 9 | 2 | ” | ” | ” | ” | ” | ” | ” | තද අව්ව |
| 21 | 11 | ” | ” | 10 | ” | ” | 1 | ” | ” | ” | ” |
| 22 | 11 | ” | ” | 10 | ” | ” | 1 | ” | ” | ” | ” |
| 23 | 11 | ” | ” | 10 | ” | ” | 1 | ” | ” | ” | ” |
| 24 | ” | ” | ” | ” | ” | ” | ” | ” | ” | ” | මඳුරම |
| 25 | ” | ” | ” | ” | ” | ” | ” | ” | ” | තද වැස්ස අව්ව | තද වැස්ස අව්ව |
| 26 | 9 | ” | ” | 9 | ” | ” | ” | ” | ” | | |
| 27 | 10½ | ” | ” | 10 | ” | ” | ” | ” | ½ | ” | ” |
| 28 | 11 | ” | ” | 9 | ” | 1 | ” | 1 | ” | ” | ” |
| 29 | 10 | ” | ” | 9 | ” | 1 | ” | ” | ” | ” | ” |
| 30 | 11 | ” | ” | 11 | ” | ” | ” | ” | ” | ” | ” |
| | 255 | 63 | 20½ | 93½ | 16½ | 36½ | 13½ | 4½ | 7½ | | |

C
සි

# 1883 ජූනිමාසේට සුමානපතා කුලිකාරයින්ට දෙන වියදම්ලියන විධිය.

| | | 1 සුමානය | | 2 සුමානය | | 3 සුමානය | | 4 සුමානය | | 5 සුමානය | | සති 4 ට එකතුගණන | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | Rs. | Cts. | Rs. | Cts. | Rs. | Cts. | Rs. | Cts. | Rs. | Cts. | Rs. | Cts. |
| 1 | කන්කානම | 5 | ” | 5 | ” | 5 | ” | 5 | ” | ” | ” | 20 | ” |
| 2 | මදිරමුත්තු | 1 | 50 | 1 | ” | 1 | ” | 1 | 50 | ” | ” | 5 | ” |
| 3 | පලනිඅප්පා | 1 | 50 | 1 | ” | 1 | ” | 1 | 50 | ” | ” | 5 | ” |
| 4 | පෙරුමාල් | 2 | ” | 2 | ” | ” | ” | ” | 50 | ” | ” | 4 | 50 |
| 5 | මුත්තුසාමි | 1 | 12½ | 1 | 87½ | 1 | ” | 1 | ” | ” | ” | 5 | ” |
| 6 | වෙල්ලයා | 1 | 50 | ” | 75 | ” | 75 | ” | 75 | ” | ” | 3 | 75 |
| 7 | අන්තෝනි | 1 | 50 | 1 | ” | ” | 50 | 1 | ” | ” | ” | 4 | ” |
| 8 | අබරම් | 1 | ” | 2 | ” | 1 | ” | 1 | ” | ” | ” | 5 | ” |
| 9 | අමාරිස් | 1 | ” | 1 | ” | 1 | ” | 1 | ” | ” | ” | 4 | ” |
| 10 | පිකිරා | ” | 75 | 1 | 25 | 1 | ” | ” | 50 | ” | ” | 3 | 50 |
| 11 | මරිඅම්මා | ” | 50 | ” | 50 | 1 | ” | ” | 50 | ” | ” | 2 | 50 |
| 12 | මීනාච්චි | ” | 50 | ” | 50 | 1 | ” | ” | 50 | ” | ” | 2 | 50 |
| | එකතු ගණන් | 17 | 87½ | 17 | 87½ | 14 | 25 | 14 | 75 | ” | ” | 64 | 75 |

D 1883 ජුනි මාසේ කුලිකාරයෝ වැඩකල මුළු දවස් මුළුපඩි

ඩී එයින් වියදම් ගොස් ඉතුරු පඩි ලියන අන්දම.

| | මුළු දවස් | බැගින් | මුළු පඩි | | මුළුවියදම් | | ඉතුරුපඩි | | නායනම් ඒබව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | Rs. | Cts. | Rs. | Cts. | Rs. | Cts. | Rs. | Cts. |
| 1 කන්කානම | | | 30 | ,, | 20 | ,, | 10 | ,, | | |
| 2 මදිරමුත්තු | 22 | ,, /37 | 8 | 14 | 5 | ,, | 3 | 14 | | |
| 3 පලන්අප්පා | 22 | ,, | 8 | 14 | 5 | ,, | 3 | 14 | | |
| 4 පෙරුමාල් | 23½ | ,, | 8 | 69½ | 4 | 50 | 4 | 19½ | | |
| 5 මුත්තුසාමි | 21½ | ,, /32 | 6 | 88 | 5 | ,, | 1 | 88 | | |
| 6 වෙල්ලයා | 24 | ,, | 7 | 68 | 3 | 75 | 3 | 93 | | |
| 7 අන්තෝනි | 22 | ,, | 7 | 04 | 4 | ,, | 3 | 04 | | |
| 8 අබරම් | 24½ | ,, /30 | 7 | 35 | 5 | ,, | 2 | 35 | | |
| 9 අමාරිස් | 25 | ,, | 7 | 50 | 4 | ,, | 3 | 50 | | |
| 10 පිකිරා | 24½ | ,, | 7 | 35 | 3 | 50 | 3 | 85 | | |
| 11 මරිඅම්මා | 25 | ,, /20 | 5 | ,, | 2 | 50* | 2 | 50 | | |
| 12 මීනාච්චි | 21 | ,, | 4 | 20 | 2 | 50 | 1 | 70 | | |
| එකතු ගණන් | 255 | ,, | 107 | 97½ | 64 | 75 | 43 | 22½ | | |

| | | | | |
|---|---|---|---|---|
| | [illegible] | ,, | | |
| | 50 | ,, | | |
| | 50 | ,, | | |
| ...වා | 10 | ,, | | |
| | 10 | ,, | | |
| | 145 | ,, | 145 | ,, |

වියදම්කල අන්දම.

| | | | | |
|---|---|---|---|---|
| ලැයිස් ගෙවල් සෙවිලිකිරීමට ගත් පොල් අතු 400ට | 4 | ,, | | |
| අවුඳ පනාපෙටි කම්මල්කාරයාට ගෙව්වා | 1 | 50 | | |
| කූඩා 12 ක් ගත්තු මිල | ,, | 75 | | |
| ලුණු කැරලි 25 ක් ගත්තු මිල | ,, | 50 | | |
| කැත් 2 ක් ගත්තා | ,, | 75 | | |
| සමරෙන්තෙට තට්ටුවක් දම්මන්ඩ වියදම්ලත්තා | 5 | ,, | | |
| උපසැස්සන් සහ ජනෝලදොර සාදන්න වඩුවරයාට ගෙව්වා | 10 | ,, | | |
| ගෘහඔපැන රත්තනල් 8 ක් ගත්තු මිල | 2 | ,, | | |
| ගුණසායාරරුකල පෙදරේරුවාට [illegible] ගෙව්වා | 2 | 50 | | |
| කඩදාසි තීන්ත පෑන් ගත්තා | ,, | 25 | | |
| | | | 27 | 25 |
| කුලිකාරයින්ට සුමානපතා ගෙව්වා | 64 | 75 | 64 | 75 |
| ... මාසේ වියද[illegible] | 92 | | | |

[illegible]

...ණන් සෙන්වා..ම

| | | |
|---|---|---|
| | 60 | ව... ගෙරෝලේ උදව්යට ගෙව්වා |
| | ... | ...යකුත සල්ලර වියදම් |
| 0 | 30 | |
| 30 | ,, | කා...කානම දුනාට කරුණු ... දෙම |
| 27 | 2½ | මඳ... ගෙවන්ඩ...නී ග... |
| 135 | 22½ | මුළු ගණන |

...ශෙෂ්කට ... ...වනවිට ... ... ඇ...ජ යන ...